محرمات استهان بها كثير
من الناس ـ سنهالي

# මිනිසුන් සාමාන්‍ය ලෙස සළකන වැළකී සිටිය යුතු

# තහනම් කරුණු


جمعية الدعوة بالزلفي

جمعية الدعوة والإرشاد وتوعية الجاليات بالزلفي

93

هاتف: ٤٢٣٤٤٦٦ ٠١٦ ـ فاكس: ٤٢٣٤٤٧٧ ٠١٦

# මිනිසුන් සාමාන්‍ය ලෙස සළකන තහනම් කරුණු

## محرمات استهان بها الناس يجب الحذر منه

## اللغة السنهالية

جمعية الدعوة والإرشاد وتوعية الجاليات في الزلفي
Tel: 966 164234466 - Fax: 966 164234477

# محرمات استهان بها الناس يجب الحذر منها

**أعده وترجمه إلى اللغة السنهالية:**

**جمعية الدعوة والإرشاد وتوعية الجاليات بالزلفي**

**الطبعة الرابعة : ١٤٤٢/٩ هـ**


**ح شعبة توعية الجاليات بالزلفي، ١٤٢٤هـ**

فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر

شعبة توعية الجاليات بالزلفي

محرمات استهان بها الناس/محمد صالح المنجد – الزلفي ، ١٤٢٤ هـ

١٤٢ ص؛ ١٢ × ١٧ سم

ردمك :٨-١٣-٨٦٤-٩٩٦٠

(النص باللغة السنهالية )

١- الحلال والحرام أ. العنوان

ديوى ٢٥٩ ١٤٢٤/٢٢٩

**رقم الإيداع : ١٤٢٤/٢٢٩**

**ردمك :٨-١٣-٨٦٤-٩٩٦٠**

# محرمات استهان بها كثير من الناس يجب الحذر منها
# මිනිසුන් සාමාන්‍ය ලෙස සළකන වැළකී සිටිය යුතු තහනම් කරුණු

## පෙර වදන

නියතව සියළු ප්‍රශංසා අල්ලාහ්ටමය. අපි ඔහුව ප්‍රශංසා කරමු. තවද ඔහුගෙන් උදවු පතමු. තවද ඔහුගෙන් සමාව අයදිමු. තවද අපගේ කාර්යයන් ඔහු කෙරෙහි පවරා විශ් වාසය තබමු. තවද අප ආත්මට කළාවූ නපුරු දේයින් අල් ලාහ්ගෙන් ආරක්ෂාව පතමු. තවද අපගේ කර්මවල අයහ පත්භාවයෙන්ද ආරක්ෂාව පතමු. අල්ලාහ් කවරෙකුට යහ මග පෙන්වන්නේද, ඔහුව නොමග යැවීමට බැරිය. තවද, කවරෙකුව ඔහු නොමගෙහි යවන්නේද, ඔහුව යහමග යැවීමට කිසිවෙකුට බැරිය. අල්ලාහ් හැර නැමදුමට සුදුසු කෙනෙකු නොමැති බව අප සාක්ෂි දරමු. තවද, ඔහු තනි කෙනෙකු බවද ඔහුට සමානව කිසිවෙකු නොමැති බවද නියතව, නබිනායක මුහම්මදු (සල්) තුමා ඔහුගේ වහලා බවද ඔහුගේ දූතයා බවද අප සාක්ෂි දරමු.

අල්ලාහ් අනිවාර්ය කළ කාර්යයන් වෙනස් නොකර එලෙසම ඉටුකළ යුතු අතර, ඔහුගේ සීමාවන් උල්ලංගනය නොකළ යුතුයි. එසේම ඔහු තහනම් කළ දේ ක්‍රියාවෙහි නොයෙදවිය යුතුයි.

නබිනායක මුහම්මදු (සල්) තුමා 'අල්ලාහ් තමාගේ දේව ග්‍රන්ථයෙහි කුමන දේ අනුමත (හලාල්) බව පවසන්නේද, ඒවා අනුමත (හලාල්)ය. ඔහු කුමන දේ තහනම් (හරාම්) ලෙස පවසන්නේද, ඒවා තහනම් (හරාම්)ය. ඔහු කුමන දේ ගැන කිසිවක් නොපවසා නිශ්ශබ්දව සිටින්නේද, ඒවා සහ -නයන්ය. එබැවින්, අල්ලාහ් ලබා දී ඇති සහනයන් ඔබලා පිළිගන්න. නියතවශයෙන්ම, අල්ලාහ් අමතක කරන්නෙකු නොවන්නාය' යනුවෙන් පවසා 'ඔබලාගේ දෙවියා අමතක කරන්නෙකු නොවන්නාය (19:64)' යන අල්කුර්ආන් වැකිය කීවේය. (ග්‍රන්ථය : හාකිම්)

සර්ව බලධාරි අල්ලාහ් තහනම් කළ දේ සියල්ල ඔහුගේ සීමාවන්ය. 'මේවා අල්ලාහ් ඇති කළ සීමාවන්ය. එබැවින්, එම සීමාවන් ඉක්මවා යාමට උත්සාහ නොකරන්න (2:187)' යනුවෙන් අල්ලාහ් පවසන්නේය. අල්ලාහ් තම සීමාවන් ඉක් මවා යන්නන්ට හා තමා තහනම් කළ දේ පිළිපදින්නන්ට දැඩි ලෙස අවවාද කරයි.

'කවරෙකු අල්ලාහ්ට සහ ඔහුගේ දූතයාට වෙනස්කම් කරන්නේද, එසේම, කවරෙකු ඔහු ඇති කළ සීමාවන් ඉක් මවා යන්නේද, (අල්ලාහ්) ඔහුව නිරයෙහි ඇතුළු කරයි. ඔහු එහි සදා කාලිකව සිටී. තවද, ඔහුහට (එහි) නින්දිත වේදනාවන් ඇත (4:14)' යනුවෙන් අල්ලාහ් පවසන්නේය.

තහනම් කර ඇති දේවලින් වැළකී සිටීම අනිවාර්යවේ. නබිනායක මුහම්මදු (සල්) තුමා 'මා ඔබලාට තහනම් කළ දේවලින් වැළකී සිටින්න. මා ඔබලාට ඉටුකරන ලෙස අණ කළ දේවලින් ඔබලාගේ ශක්තියට අනුව ඉටුකරන්න' යනු වෙන් පවසන්නේය. (ග්‍රන්ථය : මුස්ලිම්)

අසරණ ආත්මය ලත් හා දැනුම් ඥානය හීනවූ සිත්හි ආශාවන් පිළිපදින සමහරුන් අඛණ්ඩව තහනම් දේ ගැන සවන්දීමෙන් කනස්සල්ලට පත්වී 'සැම දේ තහනම්. ඔබලා සැම දේම තහනම් කරන්නෝය. ඔබලා අප ජීවිතය දුෂ්කර තාවට පත් කළෝය. අප සිත්සතන්තුල අසීරුතාවයන් ඇති කළෝය. ඔබලා වෙත තහනම් හා තහනම් කිරීම හැර අන් කිසිවක් නොමැත. ආගම ලෙහෙසි දෙයක් වන අතර, එකී කරුණු විශාලත්වයෙන් යුත්තකි. අල්ලාහ් සැම දේ කෙරෙහි සමාව ලබා දෙන කරුණා වන්තයාය' යැයි පවසති. ඔවුගේ මෙවන් තර්කයට අපි පවසන්නේ මෙසේය.

නියත වශයෙන්ම, අල්ලාහ් තමා කැමැති දෙය නීතිගත කරයි. ඔහුගේ නීතිරීති ගැන නැවත සමීක්ෂණය කරන්නා කිසිවෙකු නොමැත. අල්ලාහ් සියළුම දේ කෙරෙහි ඥාන වන්තයා හා සූක්ෂ්ම වන්තයාය. ඔහු සිය කැමැත්ත පරිදි කාර්යයන් අනුමත හා තහනම් කරයි. අල්ලාහ්ට නැමදුම කිරීම වනාහි ඔහු නීති සම්පාදනය කළ දේ එලෙසම පිළි ගැනීම හා එයට සම්පූර්ණයෙන්ම යටහත්වීමකි.

අල්ලාහ්ගේ නීතිරීතීන් ඔහුගේ දැනුම් ඥානය, සූක්ෂ්ම භාවය හා යුක්තිය යනාදි මගින් සම්පාදනය කළ එකකි. ඒවා නිශ්ප්‍රයෝජනය හා විනෝදයට අයත් දෙයක් නොවන් නේය. අල්ලාහ් මේ බව මෙසේ පවසන්නේය.

*තවද, ඔබ ස්වාමියාගේ වචන සත්‍යතාවයෙන් හා යුක්ති යෙන් සම්පූර්ණවිය. ඔහුගේ වචන වෙනස් කරන්නන් කිසි වෙකු නොමැත. සැම සවන් දෙන්නා, හොඳින් දන්නා ඔහුය. (අල්කුර්ආන්-6:115)*

නියත වශයෙන්ම, අල්ලාහ් අනුමත (හලාල්) හා තහනම් (හරාම්) කළ කරුණු කෙරෙහි මූලික පදනමක් පැහැදිළි කර ඇත. අල්ලාහ් මෙසේ පවසන්නේය.

*ඔහු (අල්ලාහ්ගේ දූතයා) ඔවුන්ට පවිත්‍රවූ දෙය අනුමත කරයි. අපවිත්‍රවූ දෙය තහනම් කරයි. (අල්කුර්ආන්-7:157)*

එබැවින්, පවිත්‍ර දේ අනුමත වේ. අපවිත්‍ර දේ තහනම්ය. අනුමත කිරීමේ හා තහනම් කිරීමේ බලය අල්ලාහ්ට පම ණක් හිමි අයිතිවාසිකමකි. කවරෙක් මෙම අයිතිවාසිකම තමාහට හෝ වෙනත් පුද්ගලයෙකුට හෝ ඇති බව තර්ක කළේනම්, ඔහු ඉස්ලාම් ධර්මයෙන් ඉවත්වූ ඉමහත් ප්‍රතික් ෂේප කරන්නෙක් ලෙසට පත් වේ. අල්ලාහ් මේ බව මෙසේ පවසන්නේය.

*මාර්ගයෙහි අල්ලාහ් අනුමත නොකළ දේ මාර්ගය කරන සමාන කරුවන් ඔවුන්ට සිටින්නේද ? (අල්කුර්ආන්-42:21)*

අල්කර්ආනය හා අල්හදීසය (නබිතුමාගේ වදන්) පිළිබඳ මනා අවබෝධයක් නොමැති අය හැර අන් කවරෙකු හෝ හලාල් (අනුමත) හා හරාම් (තහනම්) කරුණු ගැන කතා කිරීම තහනම්ය. මෙවන් (අල්කුර්ආනය හා අල්හදීසය පිළි බඳ) ඥානයක් නොමැති පුද්ගලයන් (ආගමික කරුණු) හලාල් හා හරාම් කිරීම ගැන දැඩි ලෙස අවවාද කර ඇත. අල්ලාහ් මෙසේ පවසන්නේය.

*අල්ලාහ් කෙරෙහි බොරුව ගෙතීම සඳහා ඔබලාගේ දිවු බොරුවට වර්ණනාකරන මෙය අනුමතය, (එනම් හලාල්ය) මෙය අනුමත නොවේ (එනම් හරාම්ය) යැයි නොකියන්න. (අල්කුර්ආන්-16:116)*

සන්සුදක්සේ පැහැදිලිවම තහනම් කරුණු පිළිබඳව අල් කුර්ආනයේ හා අල්හදීසයේ සඳහන්කර ඇත. අල්ලාහ් මේ ගැන මෙසේ පවසන්නේය.

*(නබිතුමනී) ඔබ කියන්න. 'එන්න. ඔබලාගේ ස්වාමියා ඔබලාට තහනම්කර ඇති දේ කියවා පෙන්වමි. ඔබලා ඔහුට කිසිවක් හෝ ආදේශ නොකරන්න. දෙමාපියන්හට උපකාර කරන්න. දිළිඳුකමට බියවීමෙන් ඔබලාගේ දරුවන් ඝාතනය නොකරන්න... (අල්කුර්ආන්-6:151)*

එසේම, නබිනායක තුමාගේ හදීස් (වදන්)වලද තහනම් කරුණු සඳහන්කර ඇත. නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් ජාබිර් බින් අබ්දුල්ලාහ් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

*නිසැකව, අල්ලාහ් මත්පැන්, මළ දෙය, ඌරා හා පිළිරු යනාදිය වෙළඳාම් කිරීම තහනම් කළේය. (ග්‍රන්ථය : අබූදාවූද්)*

එසේම, නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් ඉබ්නු අබ්බාස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

*නියතව, අල්ලාහ් කිසියම් දෙයක් හෝ තහනම් කළේ නම්, (එය විකිණීමෙන් ලැබෙන) එකී වටිනාකමද (ආදායම ද) තහනම් කරයි. (ග්‍රන්ථය : ඉබ්නු හිබ්බාන්)*

විවිධ තහනම් දේ අතර සමහර විශේෂ කරුණුද අල්කුර් ආනයෙහි සඳහන්වේ. උදාහරණයක් ලෙස අහාර පානයන් අතර තහනම් දේ ගැන අල්ලාහ් මෙසේ පවසන්නේය.

*විශ්වාසවන්තයෙනි, ඉබේම මළ දෙයද, ලෙයද, ඌරාගේ මසද, අල්ලාහ් හැර වෙනත් අය වෙනුවෙන් (බෙලි කපන සතුන්ගෙන්) කුමකට නම් කියවනු ලැබුවේද එයද, බෙල්ල හිරවීමෙන් මළ දෙයද, හැපීමෙන් මළ දෙයද, (ඉහළ සිට) පහළට වැටී මළ දෙයද, අංවලින් ඇනගැනීමෙන් මළ දෙය ද, (සිංහ, කොටි ආදි) වනසතුන් අනුභවකළ දෙයද ඔබලාට තහනම් කර ඇත. (අනුභව කිරීමට අනුමත කළ*

*දේයින් ඒවා ප්‍රාණිකව හිද 'බිස්මිල්ලාහ්' කියා) ඔබලා (බෙලි) කැපූ දෙය හැර, (ඒවා අනුභව කළ හැක. වෙනත් ඇදහීම් සඳ හා) සිටුවනලද දෙය වෙනුවෙන් කැපූ දෙයද, ර්තල මගින් (ඒවා විදිමින් නිමිති බලා) ඔබලා කොටස් බෙදා ගැනීමද (ඔබලාට තහනම්කර ඇත.) (අල්කුර්ආන්-5:3)*

එසේම, විවාහ කිරීම තහනම් කළ අය පිළිබඳව සඳහන් කරන කළ අල්ලාහ් මෙසේ පවසන්නේය.

*ඔබලාගේ මව්වරුන්ද, ඔබලාගේ දියණියන්ද, ඔබලාගේ සහෝදරියන්ද, ඔබලාගේ පියාගේ සහෝදරියන්ද, ඔබලාගේ මවගේ සහෝදරියන්ද, ඔබලාගේ සහෝදරයාගේ දියණියන් ද, ඔබලාගේ සහොදරියගේ දියණියන්ද, ඔබලාට කිරි පෙවූ කිරි මව්වරුන්ද, ඔබලාගේ කිරි (බීමෙන්වූ) සහෝදරියන්ද, ඔබලාගේ බිරියන්ගේ මව්වරුන්ද (විවාහ කර ගැනීම) ඔබ ලාට තහනම්ය. (අල්කුර්ආන්-4:23)*

ආර්ථිකය ඉපයීමෙහි තහනම් දේ ගැන අල්ලාහ් මෙසේ පවසන්නේය.

*අල්ලාහ් වෙළඳාම අනුමත කර, පොලිය තහනම් කරයි. (අල්කුර්ආන්-2:275)*

නිසැකව, අල්ලාහ් තම දාසයන් කෙරෙහි ඉතා කරුණා වන්තයා ලෙස සිටී. එබැවින්, ඔහු පිරිසිදු දේයින් සීමාවෙන් තොරව අධිකව හා විවිධ වර්ගයන් අනුමතකර ඇත. එවන් අනුමත දේ අධිකව පවතින බැවින් ඔහු ඒවා පැහැදිලිකර නොමැති අතර,

තහනම්වූ දේ යම්කිසි සීමාවකින් පවතින නිසාත්, ඒවායින් වැළකී සිටිය යුතු නිසාත් ඔහු ඒවා පැහැ දිළිකර ඇත. අල්ලාහ් මෙසේ පවසන්නේය.

*බල කරවනු ලැබූ අවස්ථාවන් හැර අනෙක් අවස්ථාවල අල්ලාහ් ඔබලාහට තහනම් කළ දේ පිළිබඳව (ප්‍රථමයෙන්) ඔබලාට පැහැදිළිකර ඇත. (අල්කුර්ආන්-6:119)*

පොදුවෙන් අල්ලාහ් අනුමත කළ කරුණු ඒවා පවිත්‍රතාව යෙන් පවතින කල් අනුමතවේ. අල්ලාහ් මේ බව මෙලෙස පවසන්නේය.

*මිනිසුනි, පොළෝ තලයෙහි ඇති පවිත්‍ර හා අනුමත දේ (පමණක්) අනුභව කරන්න. (අල්කුර්ආන්-2:168)*

සියලුම දේහි උත්පාදකයා, එකී තහනම් භාවය පිළිබඳ සාධක ලැබෙන තෙක් අනුමත වීම අල්ලාහ්ගේ දායාදයකි. මෙමගින් අල්ලාහ්ගේ කරුණාව හා දාසයන් කෙරෙහි ඔහු ගේ විශාලභාවය පෙන්නුම් කෙරේ. එනිසා ඔහුට කීකරුවී, ඔහුට ප්‍රශංසාකර තුති පුද කිරීම අප සැමට අනිවාර්යවේ.

මේවා තහනම් මේවා තහනම් ..... යනුවෙන් සැම තහ නම් කරුණු ගැන සමහරුන්ට පවසනවිට ඔවුන්, ආගමික නීතිරීතීන් බරපතල ලෙස දකිති. මෙමගින් ඔවුන්ගේ බෙල හීන විශ්වාසභාවය හා ආගමික කරුණු කෙරෙහි මනා අව බෝධයක් නොමැතිකම පෙන්නුම් කෙරේ. මෙවැන්නන්ට මේවා අනුමත, මේවා අනුමත ...... යනුවෙන් අනුමත දේ පිළිබඳව පවසන ලද්දේ

නම්, ඉස්ලාම් ධර්මය පහසු ආග මක් ලෙසට පිළිගනීද ? නොඑසේනම්, මේවා පිරිසිදු මේවා පිරිසිදු ... යනුවෙන් එකී සෑම වර්ගයන්ම පැහැදිළි කළවිට ආගාමානුකූලව සිය ජීවිතය හැඩ ගැස්වීම අපහසු නොවන බව ඔවුන් තෘප්ති වෙයිද ?

ඔවුහූ බෙලි කපනලද ඔටුවා, ගවයා, එළුවා, හාවා, මුවා, කැලේ ගවයා, කුකුළා, පරවියා, තාරාවා, පාත්තයා සහ වෙනත් ඇති කරන සතුන්ගේ මාංශ අනුමත බව කියවිය යුතු බවට සිතන්නෝද ? අප්‍රාණිකව පවතින මාළු හා පතං ගයා අනුමතද ? එළවළු, පළා වර්ග, පළතුරු හා ප්‍රයෝජ නය ලබා දෙන වෙනත් ඇට වර්ග යනාදීන් අනුමත බවට කිව යුතුද ? ජලය, කිරි, මී පැණී, තෙල් හා විනාකිරි යනා දීන් අනුමත බවට පැවැසිය යුතුද ? ලූනු, කොත්ත මල්ලි හා කුළුබඩු යනාදීන් අනුමත බව කිව යුතුද ? ලී, යකඩ, වැලි, ගල්, ප්ලාස්ටික්, කන්නාඩි හා රබර් යනාදීන් පරිහර ණය කිරීමද, සවාරි යන සතුන්, යාන වාහන, දුම්රිය, නැව් හා ගුවන් යානා යනාදීයෙන් ගමන් බිමන් කිරීමද අනුමත බව කිව යුතුද ?

එසේම, වායු මිශ්‍රණය (Air condition), ශීතකරණය (Refri -gerator), රෙදි සෝදන යන්ත්‍රය (Washing machine), වේලන යන්ත්‍රය (Dry Machine), කුරහන් ගල, ඇඹරුම් ගල (Grin -der), කීමා පිළියෙළ කරන යන්ත්‍රය (Chopped Meat Machine), මිශ්‍රණය (Blender) සහ වෙනත් වෛද්‍ය, ඉංජිනේරු, ගිණුම් කරණ, කාලගුණ පර්යේෂණ, ග්‍රහ මණ්ඩල පර්යේ ෂණ සහ

ගොඩනැගිලි ශාස්ත්‍රය පිළිබඳ උපකරණ, ජලය, ඛනිජ තෙල්, ලෝහ වර්ග යනාදිය පොළොවෙන් ලැබෙන උපකරණ, පිරිසිදු කිරීමේ උපකරණ, භාණ්ඩ රසවත් කරන උපකරණ, මුද්‍රණය කිරීමේ උපකරණ, හා පරිගණක යන්ත්‍ර යනාදීන් භාවිතා කිරීම අනුමත බව කිව යුතුද ?

කපු (Cotton), හනල් (Linen or Flax), ලොම් (Wool), හම්, කෘත්‍රිම (Nylon), පොලියෙස්ටර් (Polyester) හා මෙවන් ඇඳුම් ඇඳීම අනුමත බව පැවැසිය යුතුද ? එසේම, විවාහය, මිළදී ගැනීම, විකිණීම, වගකීම් දැරීම, තම වගකීම් භාර කිරීම, කුලියට ලබාදීම, වඩු සහ යකඩ වැඩවල යෙදීම, උපකරණ අලුත් වැඩියා කිරීම හා එවැනි රැක බලා ගැනීම යනාදිය අනුමත බව කිව යුතුද ?

අනුමත දේ ගැන මෙසේ අපි පවසා යන්නේනම්, එයට සීමාවක් නොමැතිව දීර්ඝවනු ඇත. මොවුන්ට සිදුවී ඇත්තේ කුමක්ද ? ඔවුන් කිසිවක් හෝ වටහා නොගෙන සිටින්නේ කුමක් නිසාදෝ ?

ආගම සරල බව ඔවුන් කරන තර්කය වැරදි සහගතය. ආගමේ සරලකම යනුවෙන් හැඳින්වන්නේ, ෂරීඅත් හෙවත් ආගාමානුකූල නීතිරීතීන්වලින් තොරව, මිනිසුන්ගේ ආකල් පය හා මත මතාන්තර අනුව නොවේ.

ආගම සරලයි (එය සත්‍යයකි) යනු වැරදි සහගත තර් කය අනුව තහනම් කෙරුණු දේවල යෙදීම හා

ආගම සහ නයක් ලෙස ලබාදී ඇති වරප්‍රසාදය පිළිපැදීම අතර විශාල වෙනසක් පවතී. එනම්, ගමන් බිමන්හි යෙදෙනවිට සලාත යන් කෙටි කර (කස්රු) හෝ සම්බන්ධ කර (ජම්උ) ඉටු කිරීම, උපවාසයෙන් මිදීම, පා ආවරණ මත (මස්හු හෙවත් ජලයෙන්) පිරිමැදීම, (මෙම සහනය ගමනෙහි සිටින්නන්ට දින තුනක්ද, ගමෙහි සිටින්නන්ට එක් දිනයක්ද සීමාවේ), ජලය පරිහරණය කිරීමට අපහසුවන අවස්ථාවන්හි තයම් මුම් (හෙවත් පස්වලින් පිසැදම්ම්) කිරීම, රෝගීන් සලාත යන් සම්බණ්ධකර ඉටු කිරීම, වැහි කාලයෙහි සලාතයන් සම්බණ්ධකර ඉටු කිරීම, තමා හා විවාහවීමට සිටින ස්ත්‍රීය බැලීම, කළ දිවුරුම කඩකිරීම වෙනුවෙන් ප්‍රතිකාර ලෙස නියම කර ඇති වහලෙකු නිදහස් කිරීම හෝ දිළින්දන්ට ආහාර සැපයීම හෝ ඇඳුම් සැපයීම යනාදි එකක් තෝරා ගැනීම හා බලකරවනු ලැබූ අවස්ථාවල මළ දෙය අනුභව කිරීම යනාදියන් ඉස්ලාම් ෂරීඅතය විශේෂ සහනයක් වශ යෙන් අනුමත කර ඇති සහනයන්ය.

එනිසා, සමහර දේ තහනම් කිරීම කෙරෙහි යම් සූක්ෂම භාවයක් ඇති බව වටහා ගැනීම මුස්ලිම් වරයාට අනිවාර්ය වේ. ඒවායින් සමහරයන් මෙසේය.

අ−සැබැවින්ම, අල්ලාහ් මෙවන් තහනම් දේ මගින් තම දාස යන් සෝදිසි කර, ඔවුන් කුමන කාර්යයන්හි යෙදෙන් නේද යනුවෙන් සිය අවධානය යොමුකර බැලීම.

ආ–අපායවාසීන් කවරුන්ද ? ස්වර්ගවාසීන් කවරුන්ද ? යනු වෙන් වටහා ගැනීම. නිශ්චය වශයෙන්ම, අපාය වාසීන් අපායයෙහි පිවිසීමට හේතුවන සිත්හි ආශාවන්හි ගිලී සිටියහ. ස්වර්ගවාසීන් ස්වර්ගයෙහි පිවිසීමට බාධාවන් ලෙස පවතින දුක් කරදර ඉවසා වැළකී සිටියහ. මෙවන් පරීක්‍ෂාවන් නොවන්නේ නම්, අල්ලාහ්ට කීකරුවන්නේ කවරෙකුද ? ඔහුට වෙනස්කම් කරන්නේ කවරෙකුද ? යන්නහි වටහාගත නොහැකි වේ.

ඉ–විශ්වාසීන් (අල්ලාහ්ට කීකරු වන කළ මුහුණ දෙන) අසීරුතාවන් කුලිය ලැබීමේ චේතනා ඇසින් ඉවසා සිටීම කරාද, ඔහුගේ තෘප්තිය ලැබීමේ චේතනා ඇසින් ඔහුගේ අණපනත් පිළිපැදීම කරාද බලති. වේශධාරීන් (අල්ලාහ්ට යටත්වනවිට මුහුණදෙන) අසීරුතාවන් දුක්, හිරිහැර හා පාඩු ලැබෙන ඇසින් බලති. එබැවින්, ඒවා පිළිපැදීමද අල්ලාහ්ට කීකරුවීමද ඔවුන්ට අසීරුතාවයක් බව පවතී.

විශ්වාසවන්තයා තහනම් දේ කෙරෙහි වැළකී සිටීමෙන් විශ්වාස භාවයෙහි වින්දනය අනුභව කරයි. කෙසේ නම්, පුද්ගලයෙකු අල්ලාහ් වෙනුවෙන් යැයි පිරිසිදු චේතනාවෙන් කිසියම් තහනම් දෙයකින් වැළකී සිටියේනම්, ඒ වෙනුවට එයටත් වඩා යහපතක් අල්ලාහ් ඔහුට ලබා දෙයි. එසේම ඔහු සිත්සතනෙන් විශ්වාස භාවයෙහි වින්දනය දැන ගනී.

මෙම පොත් පිංචයෙහි ෂරීඅතයෙන් ආගමානුකූලව තහ නම්කර ඇති විවිධ කරුණු අල්ලාහ්ගේ අල්කුර්ආන් වැකි හා නබිනායක මුහම්මදු (සල්) තුමාගේ නබිවදන් සාධක සහිතව සඳහන් කර ඇත. මෙවන් තහනම් කරුණු අධික මුස්ලිම් වරුන් අතර ව්‍යාප්තව පවතින හා අධිකව ඔවුන් යෙදෙන කරුණුය. මෙවැනි තහනම් කරුණු ගැන මුස්ලිම් වරුන්ට පැහැදිළිව වටහා දීමේ හා ඔවුන්ට යහපතක් ලබා දීමේ චේතනාවෙන් ඒවා මෙහි සඳහන්කර ඇත්තෙමි.

සර්ව බලධාරි අල්ලාහ් මට හා මාගේ සහෝදර මුස්ලිම් වරුන්ට ඔහුගේ සුමග, යහපත සහ ඔහු නියම කළ සීමා වන් ඉක්මවා නොයා එකී ස්ථිරථාවය ලබා දෙනු මැනවි. ඔහු තහනම් කළ දේ අපෙන් තුරන් කරනු මැනවි. පාප කාර්යයන්ගෙන් අප සැම ආරක්ෂා කරනු මැනවි. අල්ලාහ් ඉතා විශිෂ්ඨ අරක්ෂකයාය. ඔහු කරුණා වන්තයින් අතර ඉමහත් කරුණා වන්තයාය.

# අල්ලාහ්ට ආදේශ කිරීම

අල්ලාහ් පොදුවෙන් තහනම් කළ දේ අතරෙහි අල්ලාහ්ට ආදේශ (ෂිර්කය) කිරීම වැදගත් පාප ක්‍රියාවකි. මක්නිසාද යත්, නබිනායක මුහම්මදු (සල්) තුමා 'මම ඔබලාහට මහා පාපයන් (තුනක්) ගැන දැනුම් දෙන්නද ? 'යනුවෙන් (තුන් වරක්) විමසීය. එවිට ඔවුන් (සහාබාවරුන්) 'නබිතුමාණෙනි, ඒවා අපහට දැනුම් දෙන්න' යනුවෙන් පැවැසූ කළ එතුමා 'අල්ලාහ්ට ආදේශ කිරීම, .......' යනුවෙන් ප්‍රකාශ කළ බව අබුබක්ර් (රලි) තුමා වාර්තා කරන්නේය. (ග්‍රන්ථ : බුහාරි හා මුස්ලිම්)

අල්ලාහ්ට ආදේශ කිරීමේ මහා පාපයන් හැර අන් පාප යන්ට අල්ලාහ් සමාව දීමට පුළුවන. නමුත් ආදේශ කිරීමේ පාපයට අල්ලාහ් සමාවක් නොදෙන්නේය. මන්දයත්, මේ සඳහා පෞද්ගලිකව පිරිසිදු පාපොච්චාරණයක් කළ යුතුයි. මේ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

*සැබැවින්ම, අල්ලාහ් තමාට ආදේශ කිරීමේ පාපයට සමා වක් නොදෙයි. මේ හැර අන් පාපයන් සඳහා තමා කැමැති අයට (පමණක්) සමාව දෙයි. (අල්කුර්ආන්-4:48)*

මහා ෂිර්කය හෙවත් ආදේශ කිරීම මුස්ලිම් වරයෙකුව ඉස්ලාම් ධර්මයෙන් පිටමන් කරයි. මෙවන් ෂිර්කයෙහි සිටී තැනැත්තා පාපොච්චාරණය නොකර

මිය ගියේ නම්, ඔහු නරකාදියෙහි සදාකාලිනව සිටී. මෙවන් මහා ෂිර්කයන් මුස් ලිම්වරුන් වාසය කරන බොහෝ ප්‍රදේශවල අධික වශයෙන් ව්‍යාප්තව පවතී.

# මිනීවල වන්දනාමානය

මිනීවල වන්දනාමානය යනුවෙන් හැඳින්වන්නේ, නැසී ගිය අව්ලියා හෙවත් යහපත්ශීලීන් මිනිසුන්ගේ අවශ්‍යථාව යන් සපුරා දෙන බවද, ඔවුන් ලක්වන පීඩාවන් ඉවත් කරන බවද ඔවුන්ගෙන් උදව් උපකාර හා ර්ංකවරණ පැතිය හැකි බවද විශ්වාසය කිරීමකි. අල්ලාහ් මේ පිළිබඳව 'ඔහුට හැර (වෙනත් කිසිවෙකුට හෝ) ඔබ වන්දනාමාන නොකළ යුතු බවත්....' (17:23) යනුවෙන් පවසන්නේය.

එසේම, වක්තෘවරුන් හා යහපත්ශීලීන් හෝ මෙවන් අය ගෙන් මැදිහත්වීම සඳහා හෝ දුෂ්කරතාවයෙන් මිදීම සඳහා ප්‍රාර්ථනා කිරීමද මිනීවළ වන්දනාමානයකි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

*පීඩාවට ලක්වූ තැනැත්තා ප්‍රාර්ථනා කරනවිට එයට පිළි තුරු ලබා දෙන්නේ කවරෙක්ද ? ඔහුගේ පීඩාවන් ඉවත් කරන්නේ කවරෙක්ද ? තවද, ඔබලාව මේ පොළෝ තලය මත නියෝජිතයින් ලෙසට පත් කරන්නේ කවරෙක්ද ? (මෙවන් කරුණු ඉටුකිරීම සඳහා) අල්ලාහ් සමග (වෙනත්) නැමදීමට සුදුස්සෙකු සිටින්නේද ? (අල්කුර්ආන්-27:62)*

සමහරුන් තම ෂේක් හෙවත් නායකයාගේ හෝ යහපත් ශීලයා හෙවත් වලිවරයාගේ නම උච්චාරණය කරති. ඔවුන් සිටගෙන සිටින කළුද, හෝ අසුන්ගෙන සිටින කළුද හෝ යම් පීඩාවක් සිදුවන කළුද මෙලෙස උච්චාරණය කිරීමේ සිරිතක් කරගෙන සිටිති. ඔවුන් පීඩාවකට හෝ නින්දාවකට හෝ දුකකට හෝ ලක්වූවද එක් එක්කෙනා යා මුහම්මද්, යා අලී, යා හුසෙන්, යා බදවී, යා ජීලානී, යා ෂාදුලී, යා රිෆාර්, යා අයිදුරුසී, යා සයියදා සෛනබ් හා යා ඉබ්නු අල්වාන් යැයි කැඳවා ප්‍රාර්ථනා කරති. අල්ලාහ් මෙසේ පවසන්නේය.

*නියතව, ඔබලා අල්ලාහ් හැර වෙනත් කවරෙකුව කැඳවා අඬ ගසන්නේද, ඔවුන්ද ඔබලා සේම දාසයින්ය. (අල්කුර් ආන්–7:194)*

සමහර මිනීවළු වැඳුම් කරුවන් එම මිනීවල වටකිරීම, එහි කුළුනු වැනි දේ අතින් අල්ලා ශරීරය මත පිරිමැදීම, එහි පඩිපෙළවල් සිඹීම, එහි ඇති සඳුන් මුහුණ මත ගෑම, මිනීවළු දුටු විගස එයට හිස නමා ආචාර (සුජූදය) කිරීම, එහි ඉදිරියේ බැතිසිතින්ද, කීකරුවෙන්ද, බැගෑපත්කමින්ද සිට රෝගයෙන් මිදීම හෝ දරුවෙකු ලබා ගැනීම හෝ සිය අවශ්‍යතාවයන් සරලකර ගැනීම හෝ මෙවන් අවශ්‍යතාවන් හා අරමුණු පිළිබඳව අයැදීම යනාදී කාර්යවල යෙදී සිටිති. සමහරවිට ඔවුන් මිනීවලෙහි සිටින්නා අමතා 'මගේ නායක තුමනී, මම ඔබ වෙත ඉතාමත් ඈත ගමකින්

සිට පැමිණ සිටිමි. මාව හිස් අතකින් නොයවන්න' යැයි පවසති. නමුදු අල්ලාහ් මෙසේ පවසන්නේය.

*පරලොව දිනය දක්වා (කැඳවා ප්‍රාර්ථනා කලත්) තමාට පිළිතුරු දීමට නොහැකි අල්ලාහ් හැර වෙනත් අය කැඳවා ප්‍රාර්ථනා කරන්නාට වඩා නොමග සිටින්නා කවරෙකු විය හැකිද ? නමුත්, ඔවුන් තමන් කැඳවා කරන ප්‍රාර්ථනාවන් කෙරෙහි පවා නොදැනුවත්ව සිටිති. (අල්කුර්ආන්-46:5)*

නබිනායක මුහම්මදු (සල්) තුමා 'කවරෙකු අල්ලාහ් හැර ඔහුට ආදේශව පවතින දේ කැඳවා ප්‍රාර්ථනා කරමින් සිටින තත්වයේ මරණයට පත්වන්නේද, ඔහු නරකාදියෙහි පිවිසේ' යනුවෙන් ප්‍රකාශ කළ බව අබ්දුල්ලාහ් (රලි) තුමා වාර්තා කරන්නේය. (ග්‍රන්ථය : බුහාරි)

සමහරුන් මිනීවළ කරා ගොස් එහි තමාගේ හිස බූ ගා ගනිති. තවත් සමහරුන් තමන් වෙත විවිධ මාතෘකාවලින් යුත් ව්‍යාජ තොරතුරු සහිත පොත් පත් තබාගෙන සිටිති. මෙවන් පොත් පත්වලට (මනාසික් හජ්ජිල් මුෂාහිද්) ප්‍රත්‍ය ක්ෂ හජ් කර්තව්‍යය (?) යනුවෙන් නම්කරද සිටිති. තවත් සමහරු අව්ලියාවරුන් විශ්වය පාලනය කරන බවද ඔවුන්ට පල විපාක කිරීමේ හැකියාවන් ඇති බවද විශ්වාස කරති. නමුත් අල්ලාහ් මෙසේ පවසන්නේය.

*අල්ලාහ් ඔබට යම් පීඩාවකට ලක් කළේනම්, එය ඉවත් කරන්නන් ඔහු හැර (වෙනත් කිසිවෙකු හෝ)*

*නොමැත. එසේම, අල්ලාහ් ඔබට යහපතක් කිරීමට අදහස් කළේනම්, ඔහුගේ දායාදය වළක් වන්නන් කවරෙකු හෝ නොමැත. (අල්කුර්ආන්-10:107)*

# අල්ලාහ් හැර අන් දේට භාරවීම

මෙසේම අල්ලාහ් හැර අන් අය වෙත භාර ඔප්පු කිරීමද අල්ලාහ්ට ආදේශ (ෂිර්කය) කිරීමකි. සමහරුන් සොහොන් ගතව සිටින්නන් හට දීප්තිය සහ ආලෝකය දල්වන බවට පොරොන්දු වීම වැනි දේද මෙයට ඇතුලත්වේ.

# අල්ලාහ් හැර අන් දේට කැපීම

අල්ලාහ් හැර අන් දෙය වෙනුවෙන් කැපීම් කිරීම මහා ෂිර්කයන් අතර එකකි. අල්ලාහ් *'එබැවින්, ඔබ ස්වාමියාට ඔබ (සලාතය) නැමදුම ඉටුකර, කුර්බානී හෙවත් කැපීම්ද කරන්න' යනුවෙන් පවසන්නේය. (අල්කුර්ආන්-108:2)*

එනම්, අල්ලාහ් වෙනුවෙන්ද ඔහුගේ නාමයෙන්ද කැපීම් කළ යුතුයි. නබිනායක මුහම්මදු (සල්) තුමාණන් මෙලෙස පවසන්නේය.

අල්ලාහ් හැර වෙනත් දෙය කෙරෙහි කැපීම් කරන්නාට අල්ලාහ්ගේ ශාපය ඇතිවේවා. (ග්‍රන්ථය : මුස්ලිම්)

තහනම්වූ කැපීමෙහි අල්ලාහ් හැර වෙනත් අයට කැපීම හා අල්ලාහ්ගේ නාමයෙන් තොරව කැපීම යනාදි කරුණු දෙකක් ඇතුලත්වේ. මෙම ක්‍රම දෙක

මගින් කපනලද දේ අනුභව කිරීම තහනම්ය. වර්තමානයෙහි බහුලව පවතින ජාහිලියියා හෙවත් අඥාන කාලයේ චාරිත්‍රවලින් (අල්ලාහ් විසින් ගින්නෙන් මවනලද එක් මැවීමක්වූ) ජින් වෙනුවෙන් කැපීම් කිරීමද එක් සිරිතකි. උදාහරණයක් වශයෙන් ඔවුන් නිවසක් මිළදී ගත්තද, නිවසක් ඉදි කලද, ළිඳක් කැපුවද මෙම ජිනවරුන්ගේ පීඩාවලට බියවී එම ස්ථානයෙහි හෝ එහි පඩිපේලි මත හෝ කැපීමක් කරති. මෙයද ෂිර්කයට අයත් වැරදි සහගත කැපීමකි.

අල්ලාහ් තහනම් (හරාම්) කළ දෙය අනුමත (හලාල්) බවද, අල්ලාහ් අනුමත කළ දෙය තහනම් බවද පිළිගැනීම හෝ මෙසේ කිරීමේ හැකියාවත් අල්ලාහ් හැර අන් අයටද ඇති බව විශ්වාස කිරීම ඉමහත් ප්‍රසිද්ධ ෂිර්කයකි.

අල්ලාහ් මෙය ඉමහත් කුෆ්රයක් (ප්‍රතික්ෂේප කිරීමක්) ලෙස මෙසේ පවසන්නේය.

*ඔවුන් අල්ලාහ්ව අතහැර තම පියතුමානන්ද, සන්තියාසීන්ද මර්යම්ගේ පුත්‍රයාවන මසීහයද දෙවිවරුන් ලෙස පත් කර ගතිති. (අල්කුර්ආන්-9:31)*

නබිනායක මුහම්මදු (සල්) තුමා මෙම වැකිය පාරායනය කරන කළ එයට සවන් දුන් මම ‘ඔවුහු ඔවුන් (පියතුමන් හා සන්තියාසීන්)හට වන්දනාමානය කරමින් නොසිටියහ’ යනුවෙන් පැවැසීමි. එයට නබිතුමා ‘එසේමයි. නමුදු, පියතු මන් හා සන්තියාසීන්

අල්ලාහ් අනුමත කළ දෙය තහනම් ලෙසත්, තහනම් කළ දෙය අනුමත බවත් පැවැසූ කළ එය ඔවුහූද එසේම පිළිගත්තේ නැද්ද ? ඔවුන් කළ වන්දනාමා නය මෙයමවේ' යනුවෙන් පැවැසූ බව (පෙර කිතු මතෙකු ලෙස සිටි) අදී බින් හාතිම් (රලි) තුමා වාර්තා කරන්නේය. (ග්‍රන්ථය : බයිහකී)

අල්ලාහ් ආදේශකරුවන් ගැන මෙසේ පවසන්නේය.

*ඔවුන් අල්ලාහ් හා ඔහුගේ දූතයා තහනම් කළ දේ තහ නම් දේ ලෙස නොසළකා හා සත්‍ය ආගම (පිළිගෙන) අනු ගමනය නොකරමින් සිටන්නෙහිදෝ ... (අල්කුර්ආන්-9:29)*

*(නබිතුමනි, ඔවුන්ගෙන්) ඔබ විමසන්න. අල්ලාහ් ඔබ ලාට පහළ කළ ආහාරයන් කරා ඔබලාගේ අවධානය යොමු කරන්නේද ? එයින් සමහරයන් තහනම්වූ ලෙසත් වෙනත් සමහරයන් අනුමතවූ ලෙසත් ඔබලාම නිගමනයකර සිටින් නෝය. (මෙසේ නිගමනය කිරීමට) අල්ලාහ් ඔබලාට අවස රය ලබාදී තිබේද ? නොඑසේනම්, අල්ලාහ් මත ඔබලා කල් පනිකව ගොතා පවසන්නේද ? (අල්කුර්ආන්-10:59)*

# හූනියම්, ජ්‍යොතිෂ හා ශාස්ත්‍ර බැලීම

මේවා වර්තමාන සමාජයෙහි බහුලව පවතින ෂිර්කයට (ආදේශ කිරීමට) අදාල කරුණුවේ.

හූනියම් කිරීම කුෆ්රය හෙවත් ප්‍රතික්ෂේප කිරීම ඇති කරවන මහා පාප ක්‍රියාවන් අතර එකකි. මෙමගින් විපා කය හැර වෙනත් කිසිඳු ඵලක් නොවන්නේය. එසේම හූනි යම් කරන්නා පාප කරුවෙකි. හූනියම ඉගෙන ගැනීම පිළි බඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

*(සැබැවින්ම) ඔවුන් තමන්හට ඵලක් ලබා නොදෙන හා විපත ගෙනදෙන දේ ඉගෙන ගනිති. (අල්කුර්ආන්-2:102)*

*එබැවින්, හූනියම් කරන්නා කුමන තැනකට ගියද, කිසි විටක ඔහු ජයග්‍රහණය නොලබයි. (අල්කුර්ආන්-20:69)*

*තවද, සුලෙමාන් කිසි විටක (හූනියම් කර) අල්ලාහ්ව ප්‍රතික්ෂේප නොකළේය. නමුදු, ප්‍රතික්ෂේප කළේ නිසැක යෙන්ම, සාතාන්වරුන්ය. ඔවුන් හූනියමද, බාබිලෝන් (නග රයෙ)හි (විසූ) හාරූත් හා මාරූත් යන සුරදූතවරුන් දෙදෙ නාට පහළ කරන ලද (බවට පවසා වැරදි සහගතව ක්‍රියා වෙහි යෙදීමට විවිධ) දේද මිනිසුන්ට ඉගැන්වූහ. එනමුත්, ඔවුන් (සුරදූතවරුන් දෙදෙනා) 'අපි පිරික්සීම ලෙස සිටින් නෙමු. එහෙයින්, (මේවා ඉගැනගෙන) ඔබලා*

*ප්‍රතික්ෂේප කරන්නන් ලෙස නොවන්න යනුවෙන් පවසා අවවාද කරන තෙක් ඔවුහු (හූනියම) කිසියම් කෙනෙකුට හෝ ඉගැන්වූ යේ නොමැත. (අල්කුර්ආන්-2:102)*

හූනියම් කරන පවට දඬුවම ඔහුව මැරීම වේ. එමගින් උපයාගැනීම තහනම් නින්දිත ක්‍රියාවකි. අඥානයන්, අප රාධකරුවන් හා විශ්වාසයේ බෙලහීනවුවන් තම සතුරන්ට විරුද්ධව හෝ ඔවුන්ගෙන් පළිගැනීමට හූනියම් කාරයන් කරා යති. සමහරුන් තමන් ලක්වී සිටින හූනියමෙන් මිදීම සඳහා ඔවුන්ගේ පිහිට පතමින් තහනම් මාර්ගයෙහි නියලී සිටිති.

මෙවැනි අය අල්ලාහ්ගේ පිහිට පැතීමද, ආගම අනුමත කළ මුඅව්විදාත් (ආරක්ෂාව පතන) සූරා අල්ෆලක්, සූරා අන්නාස් හා මෙවන් අල්කුර්ආන් හි සමහර පරිච්ඡේදයන් මගින් අල්ලාහ්ගෙන් ආරක්ෂාව පැතීමද අනිවාර්යවේ.

එසේම, අත්ල බැලීමෙන් නිමිති බලන්නන් හා ශාස්ත්‍ර බලන්නන් සැබැවින්ම, අල්ලාහ්ව ප්‍රතික්ෂේප කරන කාෆිර් වරුන්ය. මක්නිසාද යත්, ඔවුහූ සැඟවුණු දේ තමන් දැන සිටින බවට තර්ක කරති. මෙවැනි සැඟවුණු දෙය අල්ලාහ් හැර අන් කිසිවෙකුට දැනගැනීමට නොහැක. ඔවුහූ මෝඩ යන්ගෙන් මුදල් හා මෙවැනි දේ ලබා ගැනීම සඳහා විවිධ මාර්ගයන් අනුගමනය කරති. වැලි මත ඉර ඇඳ බැලීම, අත්

රේඛා බැලීම, භාජනයෙහි ජලය පුරවා ඒ මත බැලීම, බුලත් කොළ මත තීන්ත පිරිමදා බැලීම, කණ්ණාඩිය බලා සැඟවුණු කරුණු පැවැසීම හා මෙවන් මාර්ගයෙන් මිනිසුන් රවටමින් ඔවුහු උදර පෝෂණය පමණක් ලබා ජීවත් වෙමින් සිටිති.

ඔවුන් එක් වරක් සත්‍යය කරුණක් පැවැසුවේනම්, අනූ නව වතාවන් අසත්‍ය කරුණු පවසති. අනුවන මෝඩයන් ඔවුන් පවසන එක් සත්‍යය වටහාගෙන ඔවුන් ගොතා ව්‍යාජ ලෙස පවසන අසත්‍ය කරුණු අනූ නවයක්ම සත්‍ය බවට පිළි ගනිති.

විවාහ සම්බන්ධතාවය, වෙළඳ කටයුතු හා අනාගතයෙහි සිදුවීමට හැකි සුභ හා අසුභ කරුණු කෙරෙහි අනාවැකි දැන ගැනීම සඳහාද අතුරුදහන්වූ දේ සොයා නැවත ලබා ගැනීම සඳහාද ඔවුන් වෙතට යති. ර්තල විදීමෙන් නිමිති බලන්නන් හා ශාස්ත්‍රකරුවන් කරා ගොස් ඔවුන් පවසන දේ සත්‍යය බව පිළිගන්නන් ඉස්ලාමයෙන් පිටමන්වූ කාෆිර් වරුන් ලෙසට පත්වෙති. මේ පිළිබඳව නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

කවරෙක් නිමිති කරුවෙකු හෝ ශාස්ත්‍රඥයෙකු වෙත ගොස් ඔහු පවසන දෙය සත්‍ය ලෙස පිළිගත්තේ නම්, ඔහු නබිනායක මුහම්මදු (සල්) තුමාට පහළ කළ ආගම ප්‍රතික් ෂේප කළේය. (ග්‍රන්ථය : අහ්මද්)

නමුත්, ඔවුන්ට සැඟවුණු කරුණු පිළිබඳ කිසියම් දැනු මක් හෝ නොමැති බව දැනගෙන ඔවුන් සෝදිසි

කිරීම හා මෙවන් කරුණු සඳහා හෝ ඔවුන් කරා යන්නා ප්‍රතික්ෂේප කරුවෙකු නොවන්නේය. නමුත්, ඔහුගේ දින හතලිහක සලාතයන් පිළිගනු නොලැබේ. මෙය පිළිබඳව නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

කවරෙකු නිමිති කරුවෙකු කරා ගොස් ඔහුගෙන් කිසි යම් කරුණක් පිළිබඳව විමසුවේද, ඔහුගේ දින හතලිහක සලාතයන් පිළිගනු නොලැබේ. (ග්‍රන්ථය : මුස්ලිම්)

ඔහුගේ සලාතයන් පිළිගනු නොලැබුවද, එම දින හතලි හම සලාතයන් ඉටු කිරීම ඔහුට අනිවාර්යව පවතී. එසේම ඔහු එම පාපය සඳහා පාපොච්චාරණයක් කළ යුතුයි.

# තාරකාවන්ගේ ගමනෙහි විශ්වාසය තැබීම

මිනිස් ජීවිතයෙහි සිදුවීම්වල තාරකාවන්ගේ ගමන් බල පාන බව විශ්වාස කිරීම තහනම්ය.

දිනක් නබිනායක මුහම්මදු (සල්) තුමාණන් හුදෛබියා නැමැති ස්ථානයේ අපට සුබහ් සලාතය ඉටු කළේය. එදින රාත්‍රී වර්ෂාවක් වැසී තිබින. සලාතය අවසන් කළායින් පසු එතුමා මිනිසුන් අමතා ‘ඔබලාගේ ස්වාමියා කුමක් පවසා ඇති බව ඔබලා දැන සිටින්නේද?’ යනුවෙන් විමසීය. එවිට සහාබාවරුන් ‘ඒ පිළිබඳව දැන සිටින්නේ අල්ලාහ් හා ඔහු ගේ දූතයා පමණකි’ යනුවෙන් කීහ. එකළ එතුමා ‘මාගේ දාසයන්

අතරේ මාව විශ්වාස කරන්නාද මාව ප්‍රතික්ෂේප කරන්නාද සිටී. කවරෙක් අල්ලාහ්ගේ භාග්‍යයෙන් හා ඔහු ගේ කරුණාවෙන් මෙම වර්ෂාව වැසූ බව පවසන්නේද, ඔහු මාව විශ්වාසය කරන්නා හා තාරකාවන් ප්‍රතික්ෂේප කරන් නාය. කවරෙක් තාරකාවන්ගේ පැවැත්ම අනුව වර්ෂාව වැසූ බව පවසන්නේද, ඔහු මාව ප්‍රතික්ෂේප කරන්නා හා තාර කාවන් විශ්වාස කරන්නාය' යනුවෙන් අල්ලාහ් පැවැසූ බව ප්‍රකාශ කළේය. මෙය සෙයිද් බින් කාලිද් අල් ජුහ්නී (රලි) තුමා වාර්තා කරන්නේය. (ග්‍රන්ථය : බුහාරි)

පුවත්පත්වල හා සඟරාවල පල කෙරෙන ලග්න පලාපල කෙරෙහි විශ්වාසය කිරීමද මෙවන් ෂිර්කයට ඇතුලත් වේ. කවරෙක් එහි පලවන තරු හා ග්‍රහ තාරකාවන් පිළිබඳ ලග්න පලාපල කෙරෙහි විශ්වාස කරන්නේද, ඔහු මුෂ්රික් හෙවත් අල්ලාහ්ට ආදේශය කරන්නාය. සිතෙහි සැනසීම සඳහා මේවා කියවන්නා පාපකරුවාය. මන්දයත්, ෂිර්කයට අදාල කරුණු කියවා සැනසුම සෙවීම තහනම්ය. මෙවැනි ෂිර්කයට අදාල කරුණු කියවීමෙන් සමහරවිට ඔහුගේ සිත් සතන් තුල සාතාන් ඒවා පිළිබඳ විශ්වාසයද වපුරන්නේය. මෙය ෂිර්කයට අදාල මාර්ගයක් වශයෙන් පත්වීමට හැක.

# අල්ලාහ් ඵල ඇති නොකළ දේහි ඵල ඇති බව විශ්වාස කිරීම

සමහරුන් ශාස්ත්‍රඥයින්ගේ හෝ හූනියම් කරන්නන් ගේ අදහස් උදහස් මත හෝ පැරුන්නන්ගේ චාරිත්‍ර වාරිත්‍ර අනුව නූල් බැඳීම, වළල්ල, සිප්පි කටු, දාදුකැට හා තහඩු පැළඳීම යනාදී අල්ලාහ්ට ආදේශ කිරීමට හේතුවන දේහි ඵලක් ඇති බව විශ්වාස කරති. ඇස් වහ හා පීඩනයෙන් ආරක්ෂාවීම සඳහා මෙවැනි දෙය ඔවුන්ගේ ගෙලෙහි හෝ ඔවුන්ගේ දරුවන්ගේ ගෙලවල හෝ ශරීරයෙහි පළඳවති. මේවා ඔවුහු තම නිවෙස්වල, වෙළඳ ස්ථානවල හා වාහන වලද එල්ලා තබති. එසේම, පීඩාවන් හා කරදරවලින් මිදීම සඳහා විවිධ ගල් වර්ග (සහිත) මුදු පළඳවති. සැබැවින්ම, මේවා සියල්ල සන්සුදක්සේ අල්ලාහ් මත තවක්කුල් හෙවත් කාර්යයන් පවරා විශ්වාසභාවය තැබීමට විරුද්ධ ප්‍රතිපත්ති යකි. මේවා මිනිසුන්ට විශ්වාසයෙහි හීනභාවය ඇති කරන අතර, රෝගයට තහනම් දෙය මගින් ප්‍රතිකාරය කිරීමට සමානව පවතී.

ඔවුන් එල්ලාගෙන සිටින දාදුකැට හා තහඩුවල ප්‍රසිද්ධ ෂිර්කයට අදාල වැකි, ජින් හා සාතන් වෙතින් ආරක්ෂාවරණය පතන වැකි හෝ වටහා ගත නොහැකි ඉරි කීපයකින් යුත් ඇඳීමක් හෝ නොපැහැදිළි වැකි කීපයක් අධිකව අන්තර් ගතව පවතී.

සමහරුන් අල්ලාහ්ගෙන් රැකවැණය පතන අල්කුර්ආන යෙහි වැකි කීපයක් ලියා ඒවා හා සමග ෂිර්කයට අදාලවූ වෙනත් වැකි කීපයක්ද මිශ්‍රණය කරති. තවත් සමහරුන් කිලිටු දේ මගින් හෝ ඔසප්වූ රුධිර මගින් හෝ පවා ලියති. එබැවින්, පෙර සඳහන් කළ කිසියම් දෙයක් හෝ පැළඳීම හෝ එල්ලීම හරාම් හෙවත් තහනම්ය. මක්නිසාදයත්, නබි නායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් උක්බා බින් ආමිර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙක් දාදු කැටයක් එල්ලාගෙන සිටින්නේද, නියතව ඔහු (අල්ලාහ්ට) ආදේශ කළේය. (ග්‍රන්ථය : අහ්මද්)

දාදුකැට හා තහඩු යනාදී (දේවල් භාවිතා කොට) වැරදි කර්මයේ නියලෙන පුද්ගලයා එමගින් ඵල විපාක ලැබෙන බව විශ්වාස කළේනම්, ඔහු මහා ෂිර්කයෙහි යෙදෙන්නාය. මේවා පල විපාක ලබාදීමට හේතුවක් බව අල්ලාහ් නොකළ දේ කෙරෙහි ඔහු හේතුවක් වශයෙන් පවතින බව විශ්වාස කළේනම්, ඔහු සමාන්‍ය ෂිර්කයේ යෙදෙන්නාය. මේවා ෂිර් කයෙහි පිවිසීමේ කාරණාවලට ඇතුලත්වේ.

# නැමදුම්හි මුනිච්චා කිරීම

යහපත් ක්‍රියාවන් මුනිච්චාවෙන් (අනුන්ට පෙන්වීමෙන්) තොර පිරිසිදු චේතනා හා නබිනායක මුහම්මදු (සල්) තුමා ගේ මගපෙන්වීම අනුව සිදුකිරීම මූලික කොන්දේසියකි. කවරෙක් මිනිසුන්ට පෙන්වීම සඳහා වන්දනාමානයක් ඉටු කරන්නේනම්, ඔහු කුඩා ෂිර්කය කරන්නෙකු වන අතර, ඔහුගේ එවැනි වන්දනාමානය ප්‍රතික්ෂේප කරනු ලැබේ. මෙයට මිනිසුන් හට පෙන්වීම සඳහා ඉටු කරන සලාතය (නැමදුම) උදාහරණයක්වේ. මේ පිළිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

*නියතවශයෙන්ම, මෙම වේශධාරීන් අල්ලාහ්ට වංචා කිරී මට අදහස් කරති. නමුදු, ඔහු ඔවුන්ට වංචා කරයි. සලාතය ඉටු කිරීම සඳහා ඔවුන් සිටගත්කළ කම්මැලියන් ලෙස සිට ගනිති. මිනිසුන්ට (තමන්ද සලාතය ඉටු කරන්නන් ලෙස) පෙන්වීම සඳහා (සිටිති) නවද, ඉතාමත් සුළු වශයෙන් හැර ඔවුන් අල්ලාහ්ව සිහි නොකරති. (අල්කුර්ආන්-4:142)*

මෙසේම, පුද්ගලයෙකු තමා කරන කුසල් ක්‍රියාවන් පිළි බඳ විස්තර මිනිසුන් හමුවට පැතිරී ඒවා ඔවුන් සවන්දිය යුතු බව සිතමින් කුසල් ක්‍රියාවන්හි යෙදෙන්නේනම්, ඔහු සැබැවින්ම, ෂිර්කයෙහි ගිලී වැටීය. මෙවැන්නන් පිළිබඳව නබි මුහම්මදු (සල්) තුමා දැඩි ලෙස අවවාද කරමින් පැවැසූ වදනක් ඉබ්නු අබ්බාස් (රලි) තුමා වාර්තා කරන්නේය.

කවරෙක් මිනිසුන් සවන් දීම සඳහා ක්‍රියාවක යෙදෙන් නේද, අල්ලාහ් එය මිනිසුන් හට එසේම සවන්දීමට කරයි. එසේම, කවරෙක් මිනිසුන්ට පෙන්නුම් කිරීම සඳහා ක්‍රියා වක යෙදෙන්නේද, අල්ලාහ් එයද මිනිසුන් හට පෙන්නුම් කරයි. (ග්‍රන්ථය : මුස්ලිම්)

කෙනෙකු අල්ලාහ් වෙනුවෙන් හා මිනිසුන්ට පෙන්වීම වෙනුවෙන් වන්දනාමානයක් ඉටු කළේනම්, එය පිළිගනු නොලැබේ. මේ බව හදීස් අල්කුද්ස්හි අල්ලාහ් පවසන බව නබිනායක මුහම්මදු (සල්) තුමාණන් පැවැසූ වදනක් අබූ හුරෙරා (රලි) තුමා මෙලෙස වාර්තා කරන්නේය.

මාහට ෂිර්කය කරන ආදේශ කරුවන්ගේ ආදේශ කිරී මෙන් මා උවමනා නොවන්නාය. කවරෙක් මා හැර වෙනත් දෙයක් මා සමග ආදේශකර ක්‍රියාවක යෙදෙන්නේද, ඔහුවද ඔහු ආදේශ කළ දෙයද අත් හරිමි. (ග්‍රන්ථය : මුස්ලිම්)

පුද්ගලයෙකු අල්ලාහ් වෙනුවෙන් යන පිරිසිදු චේතනාව මත ක්‍රියාවක් ආරම්භකළ පසු ඔහු බලාපොරොත්තු නොවූ පරිදි මූනිච්චාවක් ඔහුගේ සිත්සතන්හි උදාවීය. ඔහු පිළිකුල හඟවමින් එය ඉවත් කිරීමට තැත් කළේනම්, ඔහුගේ එම ක්‍රියාව පිළිගනු ලැබේ. නමුත්, ඔහු ඒ ගැන නොසැළකිලි මත්ව සිටියේනම්, ඔහුගේ එම ක්‍රියාව වලංගු නොවන බව බොහෝ විද්වතුන් සාධක සහිතව නිගමනය කරති.

# පක්ෂි අපල

අත්තියරා හෙවත් පක්ෂි අපල යනුවෙන් හැඳින්වන්නේ අපලයක් හෝ අසුභක් ලෙස යම් කරුණක් පිළිගැනීමකි. මේ බව අල්ලාහ් මෙසේ පවසන්නේය.

*ඔවුන්ට යහපතක් පැමිණි විගස 'මෙය අපහට පැමිණිය යුතු දෙයක්ම වේ' යනුවෙන් පවසති. නමුත්, ඔවුන්ට අයහ පතක් සිදුවූයේ නම්, එය මූසා (නබි)ගෙන් හා ඔහු සමග සිටින්නන් මගින් ලැබූ අපලයක් බව (ඔවුහු) පවසති. (අල් කුර්ආන්-7:131)*

අරාබිවරුන් ගමනක හෝ මෙවැනි ක්‍රියාවක යෙදීමට අදහස් කළේනම්, ඔවුන් පක්ෂියක් අල්ලා එය පියාසර කිරී මට අත් හරිති. එය දකුණු දිසා කෙරෙහි පියාඹා ගියේනම්, එය සුභ ලකුණක් ලෙස විශ්වාසය කරමින් එම ක්‍රියාවෙහි යෙදෙති. එය වම් දෙසට පියාඹා ගියේ නම්, එය අසුභ ලකු ණක් ලෙස විශ්වාසය කරමින් එම ක්‍රියාවෙහි නොයෙදෙති. මේ බව නබිනායක මුහම්මදු (සල්) තුමා විස්තර කරමින් 'පක්ෂි අපලය බැලීම අල්ලාහ්ට ආදේශ කිරීමකි' යන නබි වදන් මගින් තීන්දු කළේය.

සමහර මාස, දින, හෝ සමහර ඉලක්කම්, නාමයන් අංගවිකලයන් දිටීම හෝ අපලයක් ලෙස විශ්වාස කිරීමද ඒක දේවත්වයෙහි පරිපූරණත්වයට පටහැනි තහනම්වූ විශ් වාසයෙකි. එනම්, සෆර් මාසයේ විවාහ උත්සව නොපැවැත් වීමද, සෑම මාසයන්හි අවසන්

බදාදා දිනයද, 13 දරණ අංක යද, අංගවිකලයන්ද අපලයක් ලෙස සිතීම එවන් තහනම් විශ්වාසයෙකි. පුද්ගලයෙක් තමාගේ වෙළඳ ස්ථානය විවෘත කිරීම සඳහා පිටත්වූ කළ මාර්ගයෙහි අන්ද පුද්ගලයෙකුව දිටීනම්, ඔහු එය අපලයක් ලෙස සිතමින් ආපසු පැමිණේ. මෙවැනි දේ මෙවන් විශ්වාසයෙහි අන්තර්ගත වේ. මේවා සියල්ල තහනම් සහ ෂිර්කයට අදාල කරුණුය. එපමණක් නොව නබිනායක මුහම්මදු (සල්) තුමාද මෙවැනි ක්‍රියාවල යෙදෙන්නන්ගෙන් ඉවත්වී සිටින්නේය.

නබිනායක මුහම්මදු (සල්) තුමාණන් ප්‍රකාශ කළ වද නක් ඉම්රාන් ඉබ්නු හුසෙයින් (රලි) තුමා මෙලෙස වාර්තා කරන්නේය.

පක්ෂි ශාස්ත්‍රය බලා කියවන්නාද, එයට සවන් දෙන්නාද හෝ නිමිති බලා කියවන්නාද, එයට සවන් දෙන්නාද හෝ හූනියම් කරන්නාද හූනියම් කිරීමට පතන්නාද අප සමග වූ අය නොවන්නේය. (ග්‍රන්ථය : තබරානී)

මෙවැනි ෂිර්කයට අදාල කරුණුවල යෙදුනු තැනැත්තා එයට ප්‍රතිකාරයක් වශයෙන් කළ යුතු දෙය පිළිබඳව නබි නායක මුහම්මදු (සල්) තුමාණන් ප්‍රකාශ කළ වදනක් අබ් දුල්ලාහ් ඉබ්නු අම්රු (රලි) තුමා උපුටා වාර්තා කරන්නේ මෙසේය.

'කවරෙක් ර්තල විදීමෙන් දැනගත් අපලයක් අනුව අව ශ්‍යාථාවයක් ඉටු නොකළේ නම්, ඔහු (අල්ලාහ්ට)

ආදේශ කළේය' යනුවෙන් නබිනායක තුමා පැවැසූවිට සහාබාවරු අල්ලාහ්ගේ දූතයාණෙනි, ඒ සඳහා අපි කළ යුතු ප්‍රතිකාරය කුමක්ද ? යනුවෙන් විමසූහ. එකළ එතුමා ඔහු 'අල්ලාහුම්ම ලා ක්හයිර ඉල්ලා ක්හයිරුක, වලා තයිර ඉල්ලා තයිරුක, වලා ඉලාහ හයිරුක' (ඔබ ලබාදෙන යහපතක් හැර වෙන කිසිවක් හෝ යහපතක් විය නොහැක. ඔබ ඇති කරන නිමිත්තක් හැර අන් කිසිවක් හෝ අපලයක් විය නොහැක. ඔබ හැර වන්දනාමාන බල මහිමයට සුදුස්සා වෙනත් කිසි වෙකු හෝ නොමැත) යැයි කිව යුතු බව ප්‍රකාශ කළේය. (ග්‍රන්ථය : අහ්මද්)

නිමිත්ත බැලීම මිනිස් ස්වභාවයකි. එය බහුල ලෙස හෝ සුළු ලෙස හෝ පවතී. අල්ලාහ් වෙත තවක්කුල් හෙවත් කාර්යයන් පවරා විශ්වාසභාවය තැබීම මෙයට අයත් ඉම හත් ප්‍රතිකාරයකි. මේ ගැන නබි නායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව ඉබ්නු මස්ඌද් (රලි) තුමා මේසේ වාර්තා කරන්නේය.

නිමිත්ත බැලීම ආදේශ කිරීම වේ. අප අතර (මෙවැනි මිනිස් ස්වභාවය අනුව දුෂ්ට අපලගුණ වැඩිවීම හෝ අඩුවීම සිදුවන්නේ) නොමැත. එනමුත් අල්ලාහ් ඒවා ඔහු කෙරෙහි තබන තවක්කුල් හෙවත් විශ්වාස භාවයෙන් ඉවත් කරයි. (ග්‍රන්ථය : අබූදාවූද්)

# අල්ලාහ් හැර අන් දේ කෙරෙහි දිවුරුම් කිරීම

අල්ලාහ් තමාගේ මැවිලි අතර තමා කැමතිවන දෙය කෙරෙහි දිවුරයි. නමුදු, මැවුම් අල්ලාහ් කෙරෙහි හැර අන් කිසියම් දෙයක් කෙරෙහි හෝ දිවුරුම් කිරීම තහනම්ය. බොහෝ අය අතර අල්ලාහ්ගේ මැවිලි කෙරෙහි දිවුරන සිරි තක් අද පවතී. යම් දෙයක් කෙරෙහි දිවුරීම එය ගෞරවය හා ගරුත්වය කිරීමකි. එනම්, එවැනි ගරුත්වයට සුදුස්සා අල්ලාහ් හැර අන් කිසියම් කෙනෙක් හෝ කිසියම් දෙයක් හෝ නොමැත. මේ පිළිබඳව නබිනායක මුහමම්දු (සල්) තුමා ප්‍රකාශ කළ වදනක් ඉබ්නු උමර් (රලි) තුමා මෙලෙස වාර්තා කරන්නේය.

දැනගන්න. නියත වශයෙන්ම අල්ලාහ් ඔබලා ඔබලාගේ පියවරුන් මත දිවුරීම තරයේ වළක්වයි. කවරෙක් හෝ දිවු රීමට අදහස් කරන්නේ නම්. ඔහු අල්ලාහ් කෙරෙහි (පම ණක්) දිවුරිය යුතුයි. නොඑසේනම්, නිශ්ශබ්දව සිටිය යුතුයි. (ග්‍රන්ථය : බුහාරි)

එසේම, නබිනායක මුහමම්දු (සල්) තුමා ‘කවරෙක් අල් ලාහ් හැර වෙනත් දෙය කෙරෙහි දිවුරුම් කරන්නේද, ඔහු (අල්ලාහ්ට) ආදේශ කළේය’ යනුවෙන් පැවැසූ බව ඉබ්නු උමර් (රලි) තුමාද,

'කවරෙක් විශ්වාසයට භාරකරනලද දේ කෙරෙහි දිවුරන්නේද, ඔහු අපට අයත් කෙනෙකු නොවන් නාය' යනුවෙන් පැවැසූ බවට ඉබ්නු බුරෛදා (රලි) තුමාද වාර්තා කරති. (ග්‍රන්ථය : අබූදාවූද්)

'කඅබා' දේවස්ථානය කෙරෙහිද, විශ්වාසය සඳහා භාර කරන දේ කෙරෙහිද, ගෞරවභාවය කෙරෙහිද, උපකාරයක් කෙරෙහිද, කෙනෙකුගේ භාග්‍යය කෙරෙහිද, කෙනෙකුගේ ජීවිතය කෙරෙහිද, නබි මුහම්මදු (සල්) තුමාගේ උත්තම භාවය කෙරෙහිද, වලීවරුන්ගේ අවංක භාවය කෙරෙහිද, කෙනෙකුගේ ගෞරවය කෙරෙහිද, පියවරුන් හා මව්වරුන් කෙරෙහිද, දරුවාගේ හිස කෙරෙහිද හා මෙවන් වෙනත් දේ කෙරෙහිද දිවුරුම් කිරීම හරාම් හෙවත් තහනම්ය. කව රෙක් මෙසේ දිවුරුම් කළේද එයට ප්‍රතිකාරයක් වශයෙන් ඔහු 'ලාඉලාහ ඉල්ලල්ලාහ්' යනුවෙන් උසුරිය යුතුයි. මන්ද යත්, නබිනායක මුහමම්දු (සල්) තුමා පැවැසූ වදනක් අබූ හුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙක් හෝ දිවුරුමක් කර, එම දිවුරීමෙහි ලාත් හා උස්සා (යන ව්‍යාජ දෙවිවරුන්)ගේ නම් සඳහන් කළේනම්, ඔහු ලාඉලාහ ඉල්ලල්ලාහ් යනුවෙන් පැවසිය යුතුයි. (ග්‍රන් ථය : බුහාරි හා මුස්ලිම්)

සමහර මුස්ලිම්වරු මෙවන් ෂිර්කය හා හරාමයට අදාල විවිධ වැකියන් උපයෝගී කරති. ඒවා මෙසේය.

අල්ලාහ්ට ආදේශ කිරීමේ වැකිවලට උදාහරණයනම්, අල් ලාහ්ගෙන් හා ඔබගෙන් මා රැකවරණය පතමි. මා අල්ලාහ් කෙරෙහි හා ඔබ කෙරෙහි විශ්වාසය තබන්නෙමි. මෙය අල් ලාහ්ගෙන් හා ඔබගෙන් ලැබූ දෙයකි. මාහට අල්ලාහ් සහ ඔබ හැර වෙනත් කවරෙකු හෝ නොමැත. මාහට අහසෙහි අල්ලාහ්ද පොළොවෙහි ඔබද සිටී. අල්ලාහ් හා මෙම පුද්ග ලයා නොමැතිනම් .. මා ඉස්ලාමයෙන් ඉවත්වී සිටිමි.

කාලය කෙරෙහි දොස් පැවැරීමට උදාහරණනම්, අනේ, මේ කාලයට සිදුවූ විපතනේ. මෙය නපුරු කාලයනේ. මෙය අසුභ ලකුණට යුතු වේලාවනේ. මෙය දුෂ්කර කාලයනේ. මෙය දුර්භාග්‍ය වේලාවනේ. මෙය ස්වභාවික සිදුවීමක්නේ. යනුවෙන් කීම. (කාලයට කරන දෝෂාරෝපනය එය මැවූ අල්ලාහ්ට කරන එකක් බැවින් එයින් වැළකිය යුතුයි.)

වැරදි අරුථ ගෙන දෙන නම් තැබීම යනුවෙන් හැඳින් වන්නේ, මැවිලිවලට අයත් නම් සමග අබ්දු හෙවත් දාසයා නැමැති නම එකතු කිරීමකි. එනම්, අබ්දුල් මසීහ්, අබ්දුන් නබී, අබ්දුල් රසූල් සහ අබ්දුල් හුසෙයින් යනුවෙන් නම් කිරීම.

මෙසේම, මෙවැනි ඒක දේවත්වයට පටහැනි වැකි සහ චාරිත්‍ර වාරිත්‍ර සියල්ලම ෂිර්කයට ඇතුලත් වේ. ඉස්ලාමීය සමාජවාදය, ඉස්ලාමීය ප්‍රජාතන්ත්‍රවාදය, අධික ජනතාවගේ පැවැත්ම අල්ලාහ්ගේ පැවැත්ම බව සිතීම, ආගම අල්ලාහ්ටද රට සැම දෙනාටද යනුවෙන්

සිතීම, අරාබි (භාෂා, ජාති හා ආගම්)වාදය හා විප්ලවවාදය යනාදීන් මෙයට උදාහරණවේ.

පුද්ගලයෙකුට මලිකුල් මුලූක් (සියළුම රජුන්ටම මහ රජා) හා කාලියුල් කුලාත් (සෑම විනිශ්ය කරුවන්ටම අග්‍ර විනිශ්චය කරුවා) යනාදි වශයෙන් නම් කිරීමද, මුනාෆික් (වේශධාරියා) හා කාෆිර් වරයෙ (ප්‍රතික්ෂේප කරුවෙ) කුට සෙයියිදු (නායකයා) යනුවෙන් නම් කිරීමද (මෙය අරාබි යෙන් හෝ වෙනත් භාෂාවෙන් හෝ වේවා එය) තහනම්ය. අතෘප්තිය, ශෝකය, හා නින්දාවට ලක්වූ කළ, 'මා මෙසේ කලානම් එය මෙසේ සිදුවන්නේ නැත' යනුවෙන් සිතීමද 'දෙවියනේ ඔබ කැමතිනම් මාහට පව් සමාව ලබා දෙන්න' යනාදි වශයෙන් ප්‍රාර්ථනා කිරීමද තහනම්වන අතර, මේවා ෂෙතාන් (සාතන්)ට අදාල ක්‍රියාවන් විවෘත කිරීමකි.

# වේශධාරීන් හා නපුරු මිනිසුන් සමග අසුන් ගැනීම

තම සිත්සතන්තුල විශ්වාස භාවයෙහි හීනවූ අධික පිරිස් සමහර නපුරු නරක මිනිසුන් හා සමග අසුන් ගනිති. සම හර අවස්ථාවල ඔවුන් හා සමග අසුන් ගන්නන් අල්ලාහ්ව හා ඔහුගේ ආගම කෙරෙහි ලැදියාවන් ඇති යහපත්ශීලීන්ව හා ඔවුන්ගේ භාරකාරයාවූ අල්ලාහ්ව විහිළු කරමින් ඔවුන්ට අපහාස කරති. මේ සියල්ල සන්සුදක්සේ තහනම් හා ප්‍රති

පත්තිය කඩකරන ක්‍රියාවන්ය. අල්ලාහ් මේ පිළිබඳව මෙසේ පවසන්නේය.

*තවද, (නබි) අපගේ වාක්‍යයන් ගැන (අනවශ්‍ය ලෙස තර්ක කරමින්) ගිලිහී සිටින්නන්ව ඔබ දුටුවානම්, එය හැර වෙනත් පුවතෙහි ඔවුන් ගිලෙනා තෙක් ඔබ ඔවුන්ව ඉවත ලන්න. (මෙම අණය පිළිබඳව) සැබැවින්ම ෂෛතාන් ඔබව අමතක කරවා, (ඔවුන් සමග ඔබද හිඳගත්තේ නම්) එය සිහියට පැමිණීමෙන් පසුව, එම අපරාධකාර සමූහය සමග ඔබ හිඳ නොගන්න. (අල්කුර්ආන්-6:68)*

මෙවන් අවස්ථාවල ඔවුන් කිට්ටුම ඥාතීන් වුවද, කරුණා වන්තයන් වුවද, කථා බහවල සරලව සිටියද ඔවුන් සමග අසුන් ගැනීම තහනම්ය. ඔවුන් සුමග කරා කැඳවීම සඳහා හෝ ඔවුන් සිටින නොමග කෙරෙහි පිළිතුරු දීම සඳහා හෝ ඔවුන් ප්‍රතික්ෂේප කිරීම සඳහා හෝ ඔවුන් හා සමග_අසුන් ගත හැක. නමුත්, ඔවුන් කෙරෙහි තෘප්තිවීම හෝ නිශ්ශබ්දව සිටීම සඳහා හෝ අසුන් ගත නොහැක. මෙම කරුණ කෙරෙහි අල්ලාහ් මෙසේ පවසන්නේය.

*ඔබලා ඔවුන් ගැන තෘප්ති වුවද නියතව අල්ලාහ් පවුකාර සමාජය ගැන තෘප්ති නොවන්නේය. (අල්කුර්ආන්-9:96)*

# සලාතයෙහි සැනසුමට පත්නොවීම

සොරකම් කිරීමේ පාපයන් අතර සලාතයෙහි සොරකම් කිරීමට වඩා මහා පාපය අන් කිසිවක් හෝ නොමැත. මේ පිළිබඳ නබිවදනක් අබ්දුල්ලාහ් බින් අබී කතාදා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

නබිනායක මුහම්මදු (සල්) තුමා 'සොරකම් කරන මිනි සුන් අතර ඉමහත් නපුරු පුද්ගලයා, සලාතයෙහි සොරකම් කරන්නාය' යනුවෙන් පැවැසූ කළ, ඔවුන් (සහාබා වරුන්) අල්ලාහ්ගේ දූතයාණෙනි, සලාතයෙහි සොරකම් කරන්නේ කෙසේද ? යනුවෙන් විමසූහ. එයට නබිතුමා 'සලාතයෙහි රුකූඋව හා සුජූදය නිසි පරිදි පරිපූර්ණ නොකරන්නා සලා තයෙහි සොරකම් කරන්නාය' යනුවෙන් ප්‍රකාශ කළේය. (ග්‍රන්ථය : අහ්මද්)

කවරෙක් සලාතයේ සැනසුමට පත්නොවීම, රුකූඋවෙහි හා සුජූදයෙහි සිය කොන්ද කෙළින් නොකිරීම, රුකූඋවෙන් සිට නැගිට කෙළින් නොසිටීම, සජ්දා දෙක අතර හිඳ ගැනී මේදී ක්‍රමානුකූලව හිඳ නොගැනීම යනාදී කරුණු සලාතය ඉටු කරන අධික පුද්ගලයන්ගෙන් පැහැදිළිවම දැක ගත හැක. මෙසේ සැනසීමෙන් හා ක්‍රමානුකූලභාවයෙන් තොරව සීඝ්‍රයෙන් සලාතය ඉටු කරන දේවස්ථානයන්ද අදට දැකිය හැක. සලාතයෙහි සැනසීමෙන් සිටීම අනිවාර්ය කරුණක් වන අතර, එය නොමැති සලාතයන් පිළි

ගනු නොලැබේ. මෙම කරුණු ඉතාමත් භයානකය. මන්ද යත්, නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූ මස්ඌද් අල්බද්රී (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

රුකූවෙහි හා සුජූදයෙහි සිය කොන්ද කෙළින් තබන තෙක් කිසියම් කෙනෙකුගේ හෝ සලාතය වලංගු නොවන් නේය. (ග්‍රන්ථය : අබූදාවූද්)

සැබැවින්ම, මෙසේ කොන්ද කෙළින් නොකර සලාතය ඉටු කිරීම අසතුටු දායක කරුණක් වන අතර, මෙසේ ඉටු කරන්නා අවවාදයට ලක් වේ. මේ පිළිබඳ නබිතුමාගේ වද නක් මෙසේ වාර්තාවේ.

නබි නායක මුහම්මදු (සල්) තුමා තම සහාබා හෙවත් අනුගාමිකයින්ට සලාතය ඉටුකළ පසු ඔවුන් සමහරු සමග අසුන්ගෙන සිටිය. එවිට (දේවස්ථානයට) පිවිසී පුද්ගලයෙක් සලාතය ඉටුකිරීමට පටන් ගත්තේය. ඔහු රුකූඋව හා සුජූ දය රැඳීමෙන් තොරව ඉතා සීඝ්‍රයෙන් ඉටු කළේය. මෙය දුටු එතුමා 'ඔබලා ඔහුව දුටුවේද ? කපුටා කොටන්නා සේ ඔහු සිය සලාතයෙහි කොටන්නේය. මෙවන් සලාතයෙහි මරණ යට පත්වන්නා මුහම්මද් (සල්) තුමාගේ ආගමෙන් බැහැරව (අන් ආගමෙහි) මරණයට පත්වේ. සැබැවින්ම, රැඳීමෙකින් තොරව සීඝ්‍රයෙන් රුකූඋව හා සුජූදය ඉටු කරන්නාට උදා හරණයනම්, අධික කුස ගින්නෙන් සිටින්නා ඉඳි ස්වල්පය (එකක් හෝ දෙක)ක් අනුභව කරන්නාට සමනවේ. එය ඔහුට

(කිසිසේත්) ප්‍රමාණවත් නොවන්නේය .....' යනුවෙන් පැවැසූ බව අබූ අබ්දුල්ලාහ් අල් අෂ්අරී (රලි) තුමා වාර්තා කරන්නේය. (ග්‍රන්ථය : ඉබ්නු ග්හුසෙමා)

සලාතය ඉටු කරන රුකූඋව හා සුජූදය සම්පූර්ණ යෙන් නොකළ පුද්ගලයෙකු දුටු හුදෛෆා (රලි) තුමා 'ඔබ සලාතය ඉටු නොකළේය. (මෙසේම) ඔබ මරණයට පත්වූ යේනම්, අල්ලාහ් නබිනායක මුහම්මදු (සල්) තුමාට පහළ කළ ආගමෙන් තොරව ඔබ මරණයට පත් වේ' යනුවෙන් ප්‍රකාශ කළ බවට සෙයිද් ඉබ්නු වහබ් (රලි) තුමා වාර්තා කරන්නේය. (ග්‍රන්ථය : බුහාරි)

සැනසීමෙන් තොරව සලාතය ඉටු කළ පුද්ගලයා එසේ ඉටුකිරීම තහනම් බව පසුව වටහා ගත්තේනම්, ඔහු එම සලාතය එකී වේලාවේ සැනසීමෙන් නැවත ඉටුකළ යුතුයි. එසේම, මීට පෙර ඉටුකළ සලාතයන් සඳහා අල්ලාහ්ගෙන් පාපොච්චාරණය කළ යුතු අතර, ඒවා නැවත ඉටු නොකළ යුතුයි.

නබි මුහම්මදු (සල්) තුමා සැනසිමේන් තොරව සලාතය ඉටුකල පුද්ගලයෙකු අමතා 'ඔබ නැවත එය ඉටු කරන්න. මන්ද, ඔබ සලාතය ඉටු නොකළේය' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූ හුරෛරා (රලි) තුමා වාර්තා කරන නබි වදනක් ග්‍රන්ථ කීපයක සඳහන්ව පවතී.

# සලාතයෙහි සෙලවීම

සලාතය ඉටුකරන අධික පිරිස් සලාතයෙහි චලනයවීම හා අනවශ්‍ය දේ කිරීම කෙරෙහි නොසැළිකිලිමත්ව සිටින අතර, අල්ලාහ්ගේ ආඥාවද නොපිළිපදිමින් සිටිති. එසේම ඔවුන් අල්ලාහ්ගේ වැකි කෙරෙහි කිසියම් කල්පනාවකින් තොරවද සිටිති. මේ පිළිබඳව අල්ලාහ් *'(සලාතය ඉටුකරන කළ) අල්ලාහ්ගේ ඉදිරියේ පිරිසිදු චේතනාවෙන් සිටින්න'* යනුවෙන් පවසන්නේය. (අල්කුර්ආන්-2:238)

අල්ලාහ් වෙනත් තැනැක මෙසේ පවසන්නේය.

*නියතවශයෙන්ම, විශ්වාසවන්තයින් ජයග්‍රහණය කළහ. ඔවුහු කවුරුන් නම්, ඔවුන් තම සලාතයෙහි නිශ්කලංක යෙන් සිටින්නන්ය. (අල්කුර්ආන්-23:1,2)*

නබිනායක මුහම්මදු (සල්) තුමාගෙන්, 'සලාතයෙහි සුජූ දය කරන කළ පොළොවෙහි ඇති පස් හා ගල්කුඩු වැනි දේ පිළියෙල කිරීම හා ඉවත් කිරීම ගැන' විමසූකළ එතුමා 'ඔබ සලාතය ඉටු කරන කළ (පොළොවෙහි ඇති කිසියම් දෙයක් හෝ) පිස නොදමන්න. එසේ අනිවාර්යයෙන්ම කළ යුතුමනම්, එක් වරක් පමණක් මෙවන් ගල්කුඩු වැනි දෙය පිස දමන්න' යැයි පැවැසීය (ග්‍රන්ථය : අබූදාවූද්)

අවශ්‍යතාවයෙන් තොරව අඛණ්ඩව අධිකව සෙලවීමෙන් සලාතය අවලංගුවන බව විද්වතුන්

පවසති. කරුණු මෙසේ නම්, සලාතයෙහි සිටගෙන නිශ්ඵල කරුණුවල යෙදෙන් නන්ගේ තත්ත්වය කෙසේද ? ඔවුන් අල්ලාහ් ඉදිරියෙහි සිට ගෙන සලාතය ඉටු කරන කළ අත් ඔරලෝසුවෙහි වේලාව බැලීම, ඇඳුම සැකසීම, ඇඟිල්ලෙන් නාහය කැණීම, බැල්ම වම් දෙසට හෝ දකුණු දෙසට හෝ අහස් දෙසට හෝ යොමු කිරීම යනාදියන්හි යෙදෙති. ඔවුන් තමන්ගේ බැල්ම උදුරා ගැනීම කෙරෙහි හෝ සාතාන් තම සලාතය උදුරා ගැනීම කෙරෙහි හෝ නොබියව සිටිති.

# ඉමාම්වරයාව අභිබවා යාම

මිනිසා ස්වභාවයෙන්ම ඉක්මන් කාරයාය. 'මිනිසා (ඉව සීමෙන් තොර) ඉක්මන් කාරයාය' (17:11) යනුවෙන් අල්ලාහ් පවසන්නේය. එසේම නබිනායක මුහම්මදු (සල්) තුමාණන් පැවැසූ වදනක් සහ්ල් බින් සඃදු (රලි) තුමා මෙලෙස වාර්තා කරන්නේය.

කල්පනාකාරීව කටයුතු කිරීම අල්ලාහ්ගෙන්ය. (කලබල වී) සීඝ්‍රයෙන් කටයුතු කිරීම සාතාන්ගෙන්ය. (ග්‍රන්ථය : බෛහකී)

බොහෝ අවස්ථාවන්හි පුද්ගලයෙක් ජමාඅත් (සාමූහික) සලාතය ඉටු කරන කළ ඔහු, තම වම් හා දකුණු දෙසෙහි සිට සලාතය ඉටු කරන වැඩි පිරිසක් පොදුවෙන් රුකූඋව, සුජූදය හා අනෙකුත් අවස්ථාවල ඉමාම්වරයාව අභිබවා යාම දකී. සමහරවිට සලාමය පවා

අභිබවා කිරීමද දකී. එසේම, ඔහු මේවා සමහර විට ඔහුගෙන්ම දකී. මෙවැනි කරුණු කෙරෙහි වැඩි පිරිසක් අතර කිසියම් වැදගත් කමක් හෝ සැළකිල්ලක් හෝ නොමැත.

මේ පිළිබඳව නබිනායක මුහම්මදු (සල්) තුමා අවවාද කරමින් පැවැසූ වදනක් අබූ හුරෙයිරා (රලි) තුමා මෙලෙස වාර්තා කරන්නේය.

(සලාතයෙහි) ඉමාම්වරයාට පෙර සිය හිස ඔසවන්නාගේ හිස (පරලොව දිනයෙහි) අල්ලාහ් බූරුවාගේ හිස ලෙසට පරිවර්තනය කිරීම කෙරෙහි බිය නොවන්නේද? (ග්‍රන්ථය : මුස්ලිම්)

සලාතය සඳහා පැමිණෙන්නන් කීකරු භාවයෙන් සහ සැනසිමෙන් පැමිණිය යුතු බව අණකර ඇති බැවින්, සලා තය සැනසීමෙන් හා කීකරු භාවයෙන් තොරව ඉක්මන් කාරීව ඉටු කිරීම වරදක් නොවන්නේද ? සමහරුන් ඉමාම් වරයාට වඩා ප්‍රමාදවීමද ඉමාම්වරයාව අභිබවා යාම සේ බව වටහා ගෙන සිටිති. එනිසා, ෆුකහා හෙවත් නීති ක්ෂේත්‍ර යේ විශාරදයින් මේ පිළිබඳව යෝග්‍යමත් නීතිරීති පැහැදිලි කර ඇත. එනම්, ඉමාම්වරයා තක්බීරය (අල්ලාහු අක්බර්) අවසන් කළ පසු මැමූම් වරයා (පිළිපදින්නා) සිය ක්‍රියාව ආරම්භ (අනුගමනය) කළ යුතුයි. එසේනම්, ඉමාම් වරයා පවසන අල්ලාහු අක්බර්හි 'ර්' අක්ෂරය අවසන්වූ පසු මැමූම් වරයා සිය ක්‍රියාව ආරම්භ කළ යුතුයි. මෙයට වඩා අභිබවා යාම

හෝ ප්‍රමාද කිරීම හෝ නොකළ යුතුයි. මෙය ක්‍රමානු කූලව පැවැතීම අනිවාර්යවේ.

නබිනායක මුහමම්දු (සල්) තුමාගේ සහාබාවරුන් (අනු ගාමිකයින්) මෙම කරුණු කෙරෙහි දැඩි උනන්දුව දැක්වූ බැවින් එතුමාව කිසිසේත් අභිබවා නොයා සිටියහ. සහාබා වරයෙකුවන බර්රාඋ බින් ආසිබ් (රලි) තුමා 'සහාබාවරුන් නබි නායක තුමා පිටුපස සලාතය ඉටු කරන කළ එතුමා රුකූඋවෙහි සිට නැගිටි පසු සජ්දාව සඳහා තමාගේ නළල පොළෝ මත තබන තෙක් ඔවුන්ගෙන් කවරෙකු හෝ සිය මුහුණින් පහත්වීම මා නොදිටිමි. පසුව ඔවුන් සජ්දා කරති' යනුවෙන් පවසන්නේය. (ග්‍රන්ථය : මුස්ලිම්)

මුහම්මදු (සල්) තුමා වයසට පත්වූ බැවින්, සලාතයෙහි ක්‍රියාවල යම් යම් ප්‍රමාදයකට පත්වූ නිසා සලාතය ඉටුකිරීම සඳහා තමාගේ පිටු පස සිටින්නන් අමතා මෙසේ පැවැසීය.

මිනිසුනි, නියතව, මම මහත්වූයෙමි. එහෙයින්, (සලාත යේ) රුකූඋවෙහි හා සුජූදයෙහි මාව අභිබවා නොයන්න. (ග්‍රන්ථය : බයිහකී)

ඉමාම්වරයා සලාතය ඉටු කරන කළ, තක්බීරය කීමෙහි නබිනායක මුහමම්දු (සල්) තුමාගේ මග අනුගමනය කළ යුතුයි. මන්ද යත්, එතුමා සලාතයෙහි තක්බීරය කී ක්‍රමය පිළිබඳව අබ්දුල් රහ්මාන් බින් හාරිස් (රලි) තුමා තම පියාවූ අබූහුරෛරා (රලි) තුමාගෙන් සවන්දුන් බව මෙසේ වාර්තා කරන්නේය.

නබිනායක මුහම්මදු (සල්) තුමා සලාතයක් ඉටු කිරීමට අදහස් කළේනම්, ප්‍රථමයෙන් ආරම්භක තක්බීරය කී පසු රුකූඋ කිරීම සඳහා තක්බීරයක් කියන්නේය ... පසුව ප්‍රථම සජ්දාව සඳහා මුහුණින් පහත්වන කළ තක්බීරයක්ද, පසුව හිස ඔසවනවිට තක්බීරයක්ද, පසුව (දෙවැනි) සජ්දා කරන කළ තක්බීරයක්ද, පසුව (නැවත) හිස ඔසවනවිට තක්බීර යක්ද කියන්නේය.

එසේම, දෙවැනි රකඅතයෙහි වාඩිවීමෙන් පසු (තෙවැනි රකඅතය සඳහා) නැගිටින කළ තක්බීරයක්ද කියන්නේය. (ග්‍රන්ථය : බුහාරි)

ඉමාම්වරයා සිය තක්බීරය හා සමග එකී ක්‍රියාවද කරන කළ, පෙර සඳහන් ක්‍රමය අනුව එය අනුගමනය කිරීමට මඃමූම්වරුන්ද උනන්දුවන්නේනම්, ඔවුන්ගේ සාමූහික (ජමා අත්) සලාතය වලංගුවේ.

# දුගඳ සමග පල්ලියට පැමිණීම

සුදු ළූණු, ළූණු හා මෙවැනි අප්‍රිය කරන ගන්ධය ලබා දෙන දේ අනුභව කළ අය එය පිරිසිදු කිරීමෙන් තොරව එකී ගන්ධයෙන් දේවස්ථායට පැමිණීම තහනම්ය. අල්ලාහ් මෙසේ පවසන්නේය.

ආදම්ගේ දරුවෙනි, සෑම දේවස්ථානයෙහිම (සලාතය ඉටුකරන කළ) ඔබලාව අලංකාරමත් කර ගන්න. (අල්කුර් ආන්-7:31)

නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් ජාබිර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙක් හෝ ළූණු හෝ සුදු ළූණු අනුභව කළේද, ඔහු අපෙන් ඉවත්ව සිටිය යුතුයි. නොඑසේනම්, අපගේ දේවස්ථා නයෙන් ඉවත්වී සිය නිවසෙහි හිඳගත යුතුයි. (ග්‍රන්ථය : බුහාරි)

කවරෙක් ළූණු, සුදු ළූණු හා (මෙවන් ගන්ධය දෙන) කුර්රාස් නැමැති දේ අනුභව කළේද, ඔහු අප දේවස්ථාන යට සමීප නොවිය යුතුයි. මන්දයත්, මිනිසුන්ව අපහසුතාව යට පත්කරන දේ මලක් වරුන්වද පීඩනයට පත් කරවති. (ග්‍රන්ථය : මුස්ලිම්)

දිනක් දෙවැනි කලීෆා (ජනාධිපති) උමර් බින් කත්තාබ් (රලි) තුමා මිනිසුන්ට ජුම්ආ දේශනා කළ අවස්ථාවේ සිය දේශනාවෙහි මෙලෙස පැවැසූ බව මිදාන් බින් අබී තල්හා (රලි) තුමා වාර්තා කරන්නේය.

මිනිසුනි, මම පිළිකුල භඟවන පැලැටි වර්ග දෙකක් ඔබලා අනුභව කරන්නෝය. ඒවා ළූණු හා සුදු ළූණුය. නබි නායක මුහම්මදු (සල්) තුමා දේවස්ථානයේ සිටින කවරෙකු හමුවෙහි හෝ මෙවන් ගන්ධ දෙකක් දුටුවේ නම්, ඔහුට දේවස්ථානයෙන් පිටත්වී බකීඋ (සොහොන් පිටිය) කරා යන ලෙසත්, ඒවා අනුභව කිරීමට අදහස් කරන්නේ නම්, ඒවා උයා එකී ගන්ධය ඉවත්කර ගන්නා ලෙසත් අණකිරීම මම දුටුවෙමි. (ග්‍රන්ථය : මුස්ලිම්)

දුෂ්කර වැඩවල යෙදී සිට දහඩියෙන්ද, කිහිල්ල හා ඇඳුම් වල පිළිකුල් ගන්ධ සහිතවද දේවස්ථානයට පැමිණීමද මෙම තහනමෙහි ඇතුලත්වේ. හරාම් හෙවත් තහනම්වූ සිගරෙට් ටුව පානයකර එකී දුර්ගන්ධය සමග දේවස්ථානයට පැමි ණීම මෙයටත් වඩා බරපතල හා නපුරුම ක්‍රියාවකි. ඔවුහු මෙමගින් අල්ලාහ්ගේ දාසයන්වූ මලක් වරුන්ටද සලාතය ඉටු කරන යහපත් ශීලීන්ටද බාධා කරති.

# දුරාචාරයෙහි යෙදීම

ඉස්ලාම් ධර්මයෙහි වැදගත්ම අරමුණු අතර, මිනිසාගේ ගරුත්වය සහ මානව සංහතියේ පරම්පරාව රැක ගැනීමද එකකි. එනිසා, ඉස්ලාමය මිනිසා අනිසි ලෙස දුරාචාරයෙහි යෙදීම තරයේ තහනම් කරයි. මේ පිළිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

*ඔබලා දුරාචාරය කරා ලංවීමෙන් (පවා) වළකින්න. නියත වශයෙන්ම, මෙය ලැජ්ජා සහගත ක්‍රියාවක් ලෙසද, ඉතා නපුරු මාර්ගයක් ලෙසද පවතී. (අල්කුර්ආන්-17:32)*

ඉස්ලාම් ධර්මය දුරාචාරය තහනම්කර ඇති අතර, ස්ත්‍රීන් හිජාබ් පළඳින ලෙස හා සිය බැල්ම පහත හෙලන ලෙස අණ කිරීම සහ විවාහවීමට අනුමත ස්ත්‍රී පුරුෂයන් තනිව සිටීම හා මෙවන් කරුණු තහනම් කිරීම මගින් එය කරා මග පෙන්වන සියලු මාර්ගයන් හා සම්බන්ධතාවයන් වසා ඇත.

ඉස්ලාම් ධර්මය දුරාචාරයේ යෙදුන විවාහක පිරිමියෙකුට හෝ ස්ත්‍රියෙකුට ඉතා තදබල දඬුවමක් පනවයි. එනම්, ඔහු එම පාපයෙහි බරපතලකම වටහා ගැනීමටත්, මෙම පාප යෙහි යෙදී සිටිනවිට එකී සතුට විඳපූ ඔහුගේ සෑම අවයන් දඬුවම විඳීමටත් ඔහු මරණය දකින තෙක් ගල් ගසා ඝාත නය කළ යුතුයි.

එසේම, දුරාචාරයෙහි යෙදෙන්නා අවිවාහක පිරිමියෙකු හෝ ස්ත්‍රියෙකු නම්, ඔහුට ඉස්ලාමීය දණ්ඩ නීතිය අනුව කස පහර සීයයක් ගැසීය යුතුයි. එයද ඔහුව නින්දාවට පත් කිරීම සඳහා විස්වාසනීය පිරිසකගේ ඉදිරියෙහි ඉටු කළ යුතුයි. ඒ අතර, ඔහුව පුරා වසරක කාලයක් සිය ගමෙන් පිටමන් කළ යුතුයි.

දුරාචාරයෙහි යෙදු පිරිමින් හා ස්ත්‍රින් මිනීවළේදී උදුනක නිරුවත්ව සිටිති. එම උදුනෙහි ඉහළ කොටස කුඩා ලෙසද, පහළ කොටස විශාලවද පවතී. එකී පහළ කොටසෙහි ගිනි ඇවිලනු ලැබේ. එකී වේදනාවෙන් ඔවුන් ශබ්ද නගති. එම ගින්න ඔවුන්ව ඉහළට ඔසවා ගෙන යයි. ඔවුන් එයින් මිදී පිටත්වීමට සමීපවන කළ එම ගින්න නිවේ. වහාම ඔවුන් පහළට නැවත පැමිණෙති. මෙසේම ඔවුන්ව පරලොව දිනය පැමිණෙන තෙක් වේදනා කරනු ලැබේ.

මෙයින් ඉමහත් නින්දිත හා අවනම්බුවු දෙයක්නම්, එය මිනිසෙකු වෘද්ධ භාවයෙහි සිටින කළ, ඔහුගේ මිනීවළ ජීවි නය සමීපයෙන් පවතින කළ හා අල්ලාහ් ඔහුව මෙතෙක් ජීවත් කරවන කළ ඔහු දුරාචාරයෙහි

යෙදීමකි. නබි වදනක් අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

පරලොව දිනයෙහි අල්ලාහ් පුද්ගලයන් තුන් දෙනෙකු කෙරෙහි කථාබහ කිරීමෙන්ද, (පාපයන්) පවිත්‍ර කිරීමෙන්ද හා ආශිර්වාදයෙන් බැලීමෙන්ද වැළකී සිටී. ඔවුන්ට වේදනා සහිත දැඩි දඬුවම් ලැබේ. ඔවුන් කවරුන්නම්, දුරාචාරයෙහි යෙදෙන වෘද්ධයා, අසත්‍යය පවසන පාලකයා සහ අහංකාර කම පෙන්වන දිළින්දා යන්නන්ය. (ග්‍රන්ථය : මුස්ලිම්)

ධනය හා ජීවනෝපාය උපයා ගැනීමෙන් ඉතා නින්දිත මාර්ගය දුරාචාරයෙහි යෙදීම මගින් උපයා ගැනීමකි. රැක ගත යුතු තමාගේ අවයන් නොමගෙහි යොදවා දුරාචාරයෙහි යෙදෙන ස්ත්‍රිය අර්ධ රාත්‍රියේ අහස් දොරටු විවෘත කෙරෙන අවස්ථාවේ කරන ප්‍රාර්ථනාවන් පිළිගනු නොලැබේ. ඔවුන් මෙසේ අල්ලාහ්ගේ ආඥාව කඩ කිරීමට ඔවුන්ගේ දිළිඳුකම හෝ අනුමතවූ අවශ්‍යථාවයන් හෝ හේතු නොවන්නේය. 'පත්තිනි කාන්තාවෙකුට කුස ගින්නක් ඇතිවුවද, සිය තන යෙන් පවාද ආහාරය නොගනී' යනුවෙන් පැරැන්නන්ගේ කියමනක්ද පවතී. එනම්, මෙවැනි පත්තිනි කාන්තාවන් කිසිසේත් සිය රහස් අවය විකුණා ධනය උපයා ගනීද ?

අපි ජීවත් වන්නා මෙම යුගයේ නින්දිත හා අවනම්බුවට අදාල සෑම දොරටුද විවෘත කර ඇත. සාතාන් තමාගේ හා තම සගයන්ගේ කුමන්ත්‍රණ මගින්

මෙවන් මාර්ග සරලකර ඇත. ඔහුව පාපීන් සහ වංචනිකයන් පිළිපදින්නට පටන් ගත්හ. මෙමගින් ස්ත්‍රීන්ගේ බාහිර අලංකාර හා අඩ ඇඳුම් පැළඳීම අධිකවිය. නෙත්කලු හා නපුරු බැල්ම පැතිරවිය. ස්ත්‍රීන් හා පිරිමින් මිශ්‍රණයවීම සිරිතක් බව පත්විය. අසභ්‍ය සඟරාවන් හා ජායාරූප සමාජයෙහි පිළිගැනීමට ලක්විය. පාපයන් පැතිරී පවතින නගරයන් කරා මිනිසුන් ගමන් කිරීම වර්ධනය වන්නටවිය. පාප හා නපුරු ද්‍රව්‍යයන් පිරී වෙළඳසැල් මිනිසුන්ගේ සිත්සතන්තුල ආකර්ෂණය විය. මිනි සුන්ගේ ගෞරවය හා නම්බුවට හානි සිදුවීම, දූෂනය, අව ජාතක දරුවන් ප්‍රසූතවීම හා ළදරු ඝාතන අධිකවිය.

ඕ අල්ලාහ්, අප අතර ඔබගේ කරුණාව සහ භාග්‍යයන් පහළ කරනු මැනවි. අපගේ අඩුපාඩු අපෙන් තුරන් කරනු මැනවි. සෑම නින්දිත හා පාප මාර්ගවල උවදුරුවලින් අපව රැකගනු මැනවි. අප සිත්සතන පවිත්‍ර කරනු මැනවි. අප රහස් අවයන් ආරක්ෂා කරනු මැනවි. අප හා තහනම් දේ අතර තිරයක් හා අවහිරයක් පිහිටවනු මැනවි.

# සමලිංගික ආශ්වාදය

ලිවාත් හෙවත් සමලිංගික ආශ්වාදය යනුවෙන් හඳුන්වන් නේ පිරිමින් දෙදෙනෙක් සිය ගුද මාර්ගයෙන් සංසර්ගයෙහි යෙදීමකි. මෙය නබි ලූත් (අලෛ)

තුමාගේ සමාජයේ පැවති මහා පාප ක්‍රියාවකි. අල්ලාහ් මෙසේ පවසන්නේය.

*තවද, ලූත් (තුමාව ඔහුගේ සමාජය අතර වක්තෘවරයෙකු ලෙස එවා ඇත්තෙමු) ඔහු තම සමාජය අමතා 'නියත වශයෙන්ම, මෙම විශ්වයෙහි ඔබලාට පෙර විසූ කවරෙකු හෝ නොකළ ලැජ්ජා සහගත ක්‍රියාවෙහි ඔබලා යෙදෙන්නෝය. ඔබලාට සිදුවූ විපත කුමක්ද ? ඔබලා කාම ලීලාවෙන් පිරිමින් කරා (සොයා) යන්නෝය. මාර්ගයෙහි (මගීන්ට අවහිර කරමින් ඔවුන්ගේ ධනය හා සම්පත්) මංකොල්ල කන්නෝය. ඔබලාගේ සභාවෙහි අසතුටු ක්‍රියාවල යෙදෙන්නෝය. (අල් කුර්ආන්-29:28,29)*

මෙම නින්දිත හා පිළිකුල් මහා පාපය හා එකී විපාකය වෙනුවෙන් මෙවන් පාපයේ යෙදු එම සමාජයින්ට මෙතෙක් කවර සමාජයන්ට හෝ නොදුන් දඬුවම් සතරකින් අල්ලාහ් දඬුවම් කළේය. ඒවා නම්, ඔවුන්ගේ දෑස්හි පෑනීම ඉවත් කළේය, ඔවුන් විසූ ගම්මාන පෙරළීය. ඔවුන් මත පිළිස්සූ පස්වලින් යුත් ගල් වර්ෂාවක් පහළ කළේය. එසේම, ඔවුන් මත හෙණක් පහළ කළේය.

මෙම නින්දිත ක්‍රියාවේ යෙදු දෙදෙනා සිය කැමැත්තෙන් යෙදුනේනම්, ඔවුන් දෙදෙනාම කඩුවෙන් කොටා ඝාතනය කළ යුතුයි. නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව ඉබ්නු අබ්බාස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

ඔබලා (නබි) ලූත් (අලෛ තුමා)ගේ සමාජයින්ගේ ක්‍රියා වෙහි යෙදු පුද්ගලයෙකු දුටුවේනම්, ඔවුන් දෙදෙනාම ඝාත නය කරන්න. (ග්‍රන්ථය : අහ්මද්)

පැරණි කාලයෙහි විසූ අප පැරන්නන් අතර නොබිහිවූ ඒඩ්ස් (AIDS) වැනි බෝවන රෝග හා වෙනත් විවිධ රෝග මෙවන් පාපයන් නිසා අප ජීවත්වන මෙම කාලයෙහි පැතිරී පවතී. මෙවන් රෝග මෙසේ පැතිරීම, මෙවන් පාපයන් වෙනු වෙන් ඉස්ලාම් ධර්මය පනවා ඇති දඬුවමෙහි සූක්ෂමභාවය වටහා දෙන්නේය.

# සැමියාගේ යහනයට එම වැළකීම

ස්ත්‍රියෙකු තම සැමියා සිය යහනයට කැඳවූ කළ කිසිඳු අනුමත හේතුවෙකින් තොරව එය ප්‍රතික්ෂේප කිරීම තහ නම්ය. නබිනායක මුහමම්දු (සල්) තුමා ප්‍රකාශ කළ වදනක් අබූහුරෙරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

පුද්ගලයෙකු තම බිරිඳ යහනයට කැඳවූ කළ එය ඇය ප්‍රතික්ෂේප කළේනම්, එකී හේතුවෙන් ඔහු ඇය කෙරෙහි කෝපයෙන් සිය රාත්‍රිය ගත කළේනම්, (පසු දින) උදාවන තෙක් මලක්වරුන් ඇයට ශාප කරමින් සිටිති. (ග්‍රන්ථය : බුහාරි)

ස්ත්‍රීන්ගෙන් වැඩි පිරිස් සිය සැමියන් සමග කිසියම් ප්‍රශ් නයක් ඇතිවූ කළ, පළිගැනීමේ චේතනාවෙන් සැමියන්ගේ යහනයට යාමෙන් වළකිති. මෙය සැමියා තහනම්වූ අනියම් ඇසුරකට යාම හා බිරිඳට එරෙහිව වෙනත් විවාහයක් ගැන කල්පනා කිරීම වැනි ඉමහත් විපාකය කරා යාමට හේතු වේ. එබැවින් බිරිඳකු තම සැමියාගේ ආරාධනය පිළිගෙන ඔහු කරා ඉක්මන්වීම අනිවාර්යවේ. මෙය නබිනායක තුමා ගේ මාර්ගයකි. නබි නායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ වදනක් සෛද් බින් අර්කම් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

පුද්ගලයෙකු තම යහනයට පැමිණෙන මෙන් සිය බිරිඳට අඩගැසීම කළේනම්, ඇය රන්හිලිගෙය (ඔටුන් වැනි වාහන මත සකසා ඇති ආසනය) මත අසුන් ගෙන සිටියත් එය පිළිගත යුතුයි. (ග්‍රන්ථය : බස්සාර්)

සැමියා හා බිරිඳ අතර අමනාපය නොවී නිරන්තරයෙන් සතුට භුක්ති විඳීම සඳහා බිරිඳ රෝගාතුරව හෝ ගැබිණි යෙක් ලෙස හෝ නොයෙකුත් පීඩාවට ලක්වී හෝ සිටින අවස්ථාවල සංසර්ගයේ යෙදීම සඳහා ඇයට බල නොකිරීම සැමියාට අනිවාර්යවේ.

# හේතුවෙන් තොරව බිරිඳ දික්කසාද පැතීම

කිසිදු ආගමික හේතුවකින් තොරව ස්ත්‍රියෙක් සිය සැමි යාගෙන් දික්කසාද පැතීම තහනමිය. බොහෝ ස්ත්‍රීන් තම සැමියන් හා සමග සුළු ප්‍රශ්නයක් ඇතිවන අවස්ථාවන්හි ඔවුන්ගෙන් දික්කසාද පැතීමට පෙලඹෙති. සමහරවිට ස්ත්‍රිය තමා කැමැතිවූ දේ සිය සැමියා ලබා නොදෙන කළ දික්ක සාද පතන්නීය. සමහරවිට ස්ත්‍රිය තම නපුරු පවුල් ඥාතීන් හා අසල් වැසියන් මගින් මෙසේ කිරීමට උසිගන් වන්නීය. සමහර අවස්ථාවල 'ඔබ පිරිමියෙකු නම් මාව දික්කසාදය කරන්න' යනාදි හැඟීම උසිගන්වන හා පුරසාරම් දොඩවන වචනවලින් සිය සැමියාට අභියෝග කරන්නීය.

මෙවන් ක්‍රියාවන් මගින් දික්කසාදය වීමෙන් පවුල කැඩී යාම, ඔවුන්ගේ දරුවන් අතරමංවීම යනාදී දුර්භාග්‍යයන් සිදු වේ. මෙවැනි භාරදූර විපාකයන් කෙරෙහි නොසිතා අධික කෝපය හා ක්ෂණික තීරණයෙන් සිදුවන මෙවන් ක්‍රියාවන් ගැන පසුව කණගාටුවීමෙන් කිසිදු පළක් හෝ නොලැබේ. එබැවින් මෙසේ දික්කසාදය පැතීම තහනම් කිරීම මගින් ඉස්ලාම් ධර්මයෙහි සූක්ෂ්මභාවය පැහැදිළිවේ.

නබිනායක මුහමම්දු (සල්) තුමා පැවසූ වදනක් තව්බාන් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවර ස්ත්‍රියෙක් හෝ කිසියම් හේතුවකින් තොරව සිය සැමියාගෙන් දික්කසාදය පැතුවේනම්, ඇයට ස්වර්ගයෙහි සුවඳ (පවා) තහනම්වේ. (ග්‍රන්ථය : අහ්මද්)

එසේම දික්කසාදය පතන ස්ත්‍රීන් අවස්ථාවාදීන් බව නබි නායක තුමා පැවැසූ වදනක් උක්බා බින් ආමිර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

නියතව, දික්කසාදය පතන, වෙන්වීම අපේක්‍ෂා කරන ස්ත්‍රීන් වේශධාරී ස්ත්‍රීන්ය. (ග්‍රන්ථය : තබරානී)

ඉස්ලාම් ධර්මයේ අනුමත හේතූන් මත බිරිඳ සිය සැමියා ගෙන් දික්කසාදය පැතිය හැක. උදාහරණයක්නම්, සැමියා සලාතය ඉටු නොකිරීම හෝ ඔහු මත්පැන් හා මත් ද්‍රව්‍යයට වහල්වීම හෝ තහනම් කාර්ය කෙරෙහි බිරිඳට බල කිරීම හෝ ඉස්ලාම් ධර්මය ඇයට ලබාදී ඇති අයිතිවාසිකම් ඇයට නොදී ඇයට වද දීම යනාදි අවස්ථාවල ඇය ඔහුට උපදෙස් හා අවවාද කළ යුතුයි. එයින් කිසිඳු පළක් හෝ නොලැබූ වේනම්, බිරිඳ තමාව හා තමාගේ ආගම ආරක්‍ෂාකර ගැනීම සඳහා සැමියාගෙන් දික්කසාදය පැතීමෙන් කිසියම් වරදක් නොවන්නේය.

# ළිහාර් කිරීම

පැරැණි අඥාන කාලයේ සැමියන් තම බිරියන් දික්කසා දය කිරීම සඳහා සමහර වචන පරිහරණය කළෝය. එනම්, සැමියා බිරිඳ අමතා 'ඔබ මාගේ මවට සමානය. ඔබ මාහට මාගේ සහෝදරිය සේ තහනමිය' යනාදි වචන පරිහරණය කිරීම ළිහාර් යනුවෙන් හැඳින්වේ. මෙවන් නින්දිත ක්‍රියාව මෙම සමාජයෙහිද පැතිර පවතී. මෙමගින් ස්ත්‍රීන්ට අපරාධ යක් සිදුවන බැවින් ඉස්ලාමය මෙය තහනම් කරයි. අල්ලාහ් මේ බව මෙසේ පවසන්නේය.

*ඔබලාගෙන් සමහරු සිය බිරිඳන්ව මව්වරුන් ලෙස පව සන්නෝය. එමගින් ඔවුන් ඔවුන්ගේ මව්වරුන් (බවට පත්) නොවෙති. ඔවුන්ගේ මව්වරුන්, ඔවුන්ව ජනකවූ (කාන්තා) වන්මයවේ. එනමුත්, නිසැකයෙන්ම, ඔවුන් තම කියමන්හි පිළිකුල් හා ව්‍යාජ දේම පවසති. නමුදු, සැබැවින්ම අල්ලාහ් ඉතා සමා හා කමා වන්තයාය. (අල්කුර්ආන්-58:2)*

ඉස්ලාම් ධර්මය ළිහාර් කළ පුද්ගලයාට දඬුවමක් වශ යෙන් දුෂ්කර ප්‍රතිකාරයක් පණවා ඇත. එනම්, අත් වැරදී මකින් කෙනෙකුව ඝාතනය කළ අය කළ යුතු ප්‍රතිකාරයට සමාන හා රමදාන් සමයේ දහවල්හි (උපවාසය යෙදී සිටි මින්) සිය බිරිඳ සමග සංසර්ගයේ යෙදු පුද්ගලයා කළ යුතු ප්‍රතිකාරයට සමාන වන්දියක් ළිහාර් කළ අය කළ යුතුයි. ළිහාර් කළ පුද්ගලයා මෙම ප්‍රතිකාරය ඉටු කරන තුරු සිය බිරිඳ සමග

සංසර්ගයෙහි නොයෙදිය යුතුයි. මෙම කරුණු පිළිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

*තවද, කවරෙකු තම බිරිඳන් මව්වරුන් ලෙස පැවැසීමෙන් පසු (කණගාටුවී) තමන් කියු දේයින් මිදී නැවත (බිරිඳ හා සමග දිග පවත්වීමට) අදහස් කළේ නම්, ඔවුන් දෙදෙනා සංසර්ගයෙහි යෙදීමට පෙර එක් වහලෙක් නිදහස් කළ යුතුයි. මෙසේම ඔබලාට උපදෙස්කර ඇත. තවද, අල්ලාහ් ඔබලා කරන දෙය කෙරෙහි ඉතා දැනුවත්ව සිටී. එනමුත්, කවරෙක් (වහලෙක් නිදහස් කිරීමට) අපහසු වන්නේද, ඔවුන් දෙන්නා සංසර්ගයේ යෙදීමට පෙර දෙමාසයක් අඛණ්ඩව උපවාසයෙහි යෙදිය යුතුයි. කවරෙක් මෙයට ශක්තිය නොලබන්නේද, ඔහු දිළින්දන් හැට දෙනෙකුට ආහාර සැප යිය යුතුයි. (මෙලෙස අණකර ඇත්තේ) ඔබලා අල්ලාහ් හා ඔහුගේ දූතයා විශ්වාස කිරීම සඳහාය. එසේම මෙය අල්ලාහ් අණ කරන සීමාවන්ය. එනමුත්, ප්‍රතික්ෂේප කරන කාෆිර් වරුන්ට රිදුම් සහිත වේදනා ඇත. (අල්කුර්ආන්-58:3,4)*

# ඔසප්වන සමයේ සංසර්ගයේ යෙදීම

මෙම කරුණ පිළිබඳව අල්ලාහ් අල්කුර්ආනයෙහි මෙසේ පවසන්නේය.

*(ඕ නබිතමනි, ඔවුන්) ඔසප්වීම පිළිබඳවද ඔබගෙන් විම සන්නෝය. 'එය (පීඩාවක්වූ) ඍතු වීමකි. එබැවින්, ඔසප්වී සිටින කල සිය බිරිඳන්ගෙන් ඉවත්වී සිටින්න.*

*ඔවුන් පිරිසිදු වන තෙක් ඔවුන් කරා ළංනොවන්න' යනුවෙන් ඔවුන්ට ඔබ පවසන්න. (අල්කුර්ආන්-2:222)*

ඔසප්වූ ස්ත්‍රීන් පිරිසිදුවී ජලස්නානය කරන තෙක් ඔවුන් සමග සංසර්ගයෙහි යෙදීම තහනම්ය. මේ පිළිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

*ඔවුන් පිරිසිදු වීමෙන් පසු අල්ලාහ් ඔබලාට අණකර ඇති පරිදි ඔවුන් කරා යන්න. (අල්කුර්ආන්-2:222)*

ඔසප්වූ සමයේ බිරිඳ සමග සංසර්ගයේ යෙදීම කෙතරම් නින්දිත පාපයක් යන්න නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් අබූහුරෙයිරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙක් (තම බිරිඳ) ඔසප්වී සිටින සමයේ හෝ ඇගේ ගුද මාර්ගයෙන් හෝ සංසර්ගයෙහි යෙදුනේද, හෝ ශාස්ත්‍ර ඥයන් කරා ගියේද ඔහු මුහම්මදුට පහළවූ ධර්මය ප්‍රතික් ෂේප කළේය. (ග්‍රන්ථය : තිර්මිදී)

කවරෙක් හෝ මෙවන් කාර්යයෙහි නොදැනුවත්ව වැරදී මකින් යෙදුනේද, ඔහුට කිසියම් ප්‍රශ්නයක් නොවන්නේය. නමුදු, ඔහු දැනුවත්ව ඕනෑකමින් මෙවන් කාර්යයෙහි යෙදු නේනම්, ආගමික විද්වතුන්ගේ මතය පරිදි ඔහු ඒ වෙනු වෙන් ප්‍රතිකාරයක් කළ යුතුයි. ඔවුන්ගේ ප්‍රතිකාරය පිළිබඳ නබිතුමාගේ වදනක් සාධක ලෙස පවතී. එනම් ඔහු දීනාර් එකක් හෝ දීනාර් අඩක් හෝ ප්‍රතිකාරයක් වශයෙන් පින් කළ යුතුයි. ඔවුන්ගේ සමහරුන් 'එය

ඔහුගේ කැමැත්ත පරිදි දීනාර් එකක් හෝ දීනාර් අඩක් හෝ ගෙවිය යුතුයි' යනුවෙන්ද, තවත් පිරිසක් 'රුධිරය අධිකව පිටවන ඔසප්වූ ආරම්භයේ ඇය සමග සංසර්ගයෙහි යෙදුනේ නම්, දීනාර් එකක්ද, රුධිරය අඩුවෙන් පිටවන ඔසප්වූ අවසානයේ හෝ ජලස්නානය කිරීමට පෙර ඇය සමග සංසර්ගයේ යෙදුනේ නම්, දීනාර් භාගයක්ද ගෙවිය යුතුයි' යනුවෙන්ද සිය මතය පවසති. දීනාර් එකක් යනු, අදට භාවිතයේ පවතින ප්‍රමා ණය අනුව රත්රන් ග්‍රෑම් 4.25 කි. ඔහුට මෙම ප්‍රමාණයට රත්රන් හෝ එකී වටිනාකම මුදලින් හෝ ගෙවීමට හැක.

# ගුද මාර්ගයේ සංසර්ගයෙහි යෙදීම

දේව විශ්වාසයෙහි බෙලහීන සමහර පුද්ගලයන් තම බිරි දත්ගේ ගුද මාර්ගයේ සංසර්ගයෙහි යෙදීමෙන් වැළකී සිටීම කෙරෙහි නොසැළිකිලිමත්ව සිටිති. මෙසේ යෙදීම මහා පාප ක්‍රියාවකි. නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේ යෙදෙන් නාට ශාප කරමින් පැවැසූ වදනක් අබූහුරෛරා (රළි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

ස්ත්‍රියගේ ගුද මාර්ගයෙන් සංසර්ගයේ යෙදෙන්නා ශාප යට ලක් අයෙකි. (ග්‍රන්ථය : අබූදාවූද්)

එසේම, නබිතුමා 'කවරෙකු (තම බිරිඳ) ඔසප්වී සිටින කළ හෝ ඇගේ ගුද මාර්ගයෙන් හෝ සංසර්ගයෙහි යෙදු නේද, හෝ ශාස්ත්‍රඥයන් වෙත

ගියේද ඔහු මුහම්මදුට පහළ වූ ධර්මය ප්‍රතික්ෂේප කළේය' යනුවෙන්ද පැවැසූ බව අබූ හුරෙරා (රළි)තුමා වාර්තා කරන්නේය. (ග්‍රන්ථය : තිර්මිදි)

විශ්වාසනීය යහපත්ශීලී ස්ත්‍රීන් මෙම ක්‍රියාව ප්‍රතික්ෂේප කළත්, සමහර සැමියන් 'මෙයට එකඟ නොවන්නේ නම්, ඔබව දික්කසාද කරමි' යනුවෙන් තරවටු කරති. තවත් සම හර සැමියන් මෙම ක්‍රියාව අනුමතද නොඑසේනම් තහනම් ද බව විද්වතුන්ගෙන් විමසීමට ලැජ්ජාවන තම බිරියන්ට 'මෙම ක්‍රියාව අනුමත බවට රවටා එයට සාධකයක් ලෙස පහත සඳහන් අල්ලාහ්ගේ වැකිය පවසන්නෝය.

*ඔබලාගේ බිරිඳන් ඔබලාගේ අස්වනු බිම්ය. එනිසා, ඔබ ලාගේ කැමැත්ත පරිදි ඔබලාගේ අස්වනු බිම් කරා යන්න. (අල්කුර්ආන්-2:223)*

සැබැවින්ම, අල්කුර්ආනයට පැහැදිළි කිරීමක් වශයෙන් නබිතුමාගේ වදන් පැවතීම අපි සැමදෙනා දැන සිටින කරු ණකි. නබිනායක මුහම්මදු (සල්) තුමා 'මිනිසා තම බිරිඳ ගේ ඉදිරියෙන් සිට හෝ පිටුපස සිට හෝ සිය මතය පරිදි ඇගේ උපත් අවයවන යෝනියෙහි සංසර්ග විය හැකි බව' පැහැදිළි කර ඇත. ගුද යනු, මල පිටත්වන ස්ථානයෙකි. එසේ නොමැතිව එය උපත් අවයක් නොවන්නේය. මෙයට අඥාන කාලයේ නපුරු සිරිත් විරිත් අප අතර බෝවීම හෝ අසභ්‍ය තිල් චිත්‍රපටයෙහි විපාක මෙවන් තහනම් නින්දිත සිරිත් විරිත් පවිත්‍රවූ පවුල් ජීවිතයෙහි පිවිසීමට

හේතුවිය. මෙවැනි දෙය කෙරෙහි සමාව අයැදීම අනිවාර්ය වේ. මෙම ක්‍රියාව සැමියා හා බිරිඳගේ එකඟතාවයෙන් සිදුවුවත් එය තහනම්ය. මක්නිසාදයත්, තහනම් කරුණක් එකඟවීමෙන් එය අනුමත කරුණක් බව පරිවර්තනය වීමට නොහැක.

# බිරියන් අතර අසමානව හැසිරීම

බහු භාර්යාවන් සිටින සැමියෙකු ඔවුන් අතර නීතියෙන් හා යුක්ති සහගතව හැසිරිය යුතු බවට අල්ලාහ් අල්කුර් ආනයෙහි මෙසේ උපදෙස් කරන්නේය.

*(විශ්වාස වන්තයිනි) ඔබලා කෙතරම් කැමැති වුවද, බිරි ඳන් අතර සමානව හැසිරීමට ඔබලාට නොහැක. එනමුත්, (එකම බිරිඳ කරා පමණක්) ඇලවී අනෙක් බිරිඳව ආධාර යක් නොමැතිව එල්ලා තබනලද තැනැත්තියක් ලෙසට පත් නොකරන්න. ඔබලා (අල්ලාහ්ට බියවී) බැතිසිතින් සාවදා නව හැසිරෙන්නේ නම්, අල්ලාහ් ඉතා සමාව හා කරුණා වන්තයා ලෙස සිටී. (අල්කුර්ආන්-4:129)*

මෙහි සමානව හැසිරීම යනුවෙන් හැඳින්වන්නේ, බිරිඳන් හා සමග රාත්‍රී ගත කිරීම හා ඔවුන්ට ආහාර පාන, ඇඳුම් පැළඳුම් හා නවාතැන් ලබා දීමෙහි ඔවුන් එක් එක්කෙනාට අදාල අයිතීන් ලබා දීමකි. නමුත්, මෙහි තේරුම හදවතින් ප්‍රේමය දැක්වීම නොවේ.

මන්ද, ආදරය කිරීමෙන් මිනිසාට සමානව හැසිරීමට නොහැක.

සමහර මිනිසුන් ඔවුන්ට බහු භාර්යාවන් සිටි කළ එක් බිරිඳකු කරා පමණක් මුළුමනින් ඇලවී අනෙක් බිරිඳ ගැන නොසළකති. එක් බිරිඳ සමග අධික රාත්‍රීන් ගතකර හෝ බිරිඳකට පමණක් වියදම් කර අනෙක් බිරිඳ ගැන නොසළ කති. මෙසේ කිරීම තහනම්ය.

මෙලෙස බිරිඳන් අතර වෙනස්කම්කර අනීතියෙන් හැසි රෙන්නන් පරලොව දිනයෙහි කුමන තත්ත්වයෙන් පැමිණිද යනුවෙන් නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙකුට බිරිඳන් දෙදෙනෙකු සිට එක් බිරිඳකු කරා පමණක් ඇල ගියේනම්, එලෝ දිනයේ ඔහු එක් බාහුවකින් පහත්වූ තත්වයෙන් පැමිණේ. (ග්‍රන්ථ : අබූදාවූද්, ධාරමී)

# අන් ස්ත්‍රිය සමග තනිව සිටීම

මිනිසුන් අතර කලබල හා ප්‍රශ්න ඇති කිරීමටද, තහ නම් දෙය කරා ඔවුන්ව පරිහානියට ලක් කිරීමටද සාතාන් දැඩි උනන්දුවෙන් සිටී. එබැවින්, අල්ලාහ් අපව මෙසේ අව වාද කරන්නේය.

*විශ්වාස වන්තයිනි, ඔබලා සාතාන්ගේ මාර්ග අනුගමනය නොකරන්න. තවද, කවරෙක් සාතාන්ගේ මාර්ග අනුගම නය කරන්නේද, නියතවශයෙන්ම, සාතාන් ලැජ්ජා සහගත හා අප්‍රිය කළ යුතු කාර්යයන් කිරීම (කෙරෙහි) ඔහුට අණ කරයි. (අල්කුර්ආන්-24:21)*

මිනිස් ශරීරයේ රුධිරය දුවන සෑම තැන් පාසාම සාතාන් දුවන්නේය. මිනිසාව අවනම්බුවට සහ නින්දාවට ලක් කිරී මට සාතාන් දරන වෑයමෙන් පිරිමියෙකු පිටස්තර ස්ත්‍රියෙක් හා සමග තනිව සිටීමේ අවස්ථා සලසා දීමද එකකි. එනිසා, ඉස්ලාම් ධර්මය මෙය තහනම් කිරීම මගින් මෙවන් මාර්ග වසා තබන්නේය. මේ පිළිබඳව නබිනායක මුහම්මදු (සල්) තුමා මෙලෙස ප්‍රකාශ කළ බවට උක්බත් බින් ආමිර් (රලි) තුමා වාර්තා කරන්නේය.

පිරිමියෙකු ස්ත්‍රියෙක් හා සමග තනිව සිටින කළ (ඔවුන් සමග) තුන්වන්නා ලෙස සාතාන් සිටී. (ග්‍රන්ථය : තිර්මිදී)

නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ දීර්ඝ වද නක මෙසේ සඳහන්ව පවතින බව ඉබ්නු උමර් (රලි) තුමා වාර්තා කරන්නේය.

අද (දින)ට පසු කිසියම් පිරිමියෙකු හෝ ස්ත්‍රියෙකුගේ සැමියා සිය නිවැසේ නොමැති අවස්ථාවක ඔහු සමග තවත් කෙනෙකු හෝ දෙදෙනෙකු හෝ එකතුවී යාමෙන් තොරව (ඔහු පමණක්) ඇය කරා නොයන්න. (ග්‍රන්ථය : මුස්ලිම්)

එහෙයින්, කිසියම් පිරිමියෙකු හෝ තම සහෝදරයෙකු ගේ බිරිඳ හා මෙහෙකාරිය යනාදීන් සමග නිවසෙහි හෝ කාමරයෙහි හෝ වාහනයෙහි හෝ තනිව සිටිය නොයුතුයි. එසේම, වෛද්‍යවරයා ලෙඩට භාජනයවූ ස්ත්‍රියකු හා සමග තනිව සිටීමද තහනම්ය. බොහෝ දෙනා මෙවැනි කරුණු ගැන නොසැළකිලිමත්ව සිටිති. මෙම කරුණු ගැන ඔවුන් තමන් කෙරෙහි හෝ වෙනත් අය කෙරෙහි හෝ විශ්වාසය තබා සිටිති. එබැවින්, මෙය නින්දාවට පත්වන පාපයන්හි හෝ එයට මග පෙන්වන පෙරහුරුවෙහි හෝ වැටීමට ඉඩ සැලෙසේ. මෙමගින් වැරදි මගක් හා පරම්පරාගත න්‍යාය ධර්මයක් නොමැති ස්ථාවරයෙන් අවජාතක දරුවන් බිහිවී මට හේතුවේ.

# ස්ත්‍රිය සමග අතට අතදී ආචාර කිරීම

අප සමාජයේ අද පවතින සමහර සිරිත් විරිත් හා චාරිත්‍ර වාරිත්‍ර ඉස්ලාමීය සාරධර්මයන් අභිබවා මුල් තැනට පත්ව පවතී. සමාජයේ මිනිසුන්ගේ වැරදි සහගත සිරිත් විරිත් හා ඔවුන්ව කිසිඳු පිළිවෙළකින් තොරව පිළිපැදීම අල්ලාහ්ගේ නීතිරීතීන්ට වඩා ඉතා උසස් ස්ථානයක් හිමිකරමින් පවතී. කෙතරම් නම්, කවරෙක් හෝ සැබෑ ඉස්ලාමීය නීතිරීති පිළි බඳ කරුණු පවසා ඒවාට අදාල සාධකයන් ඉදිරිපත් කළත්, මෙවන් වැරදි සහගත සමාජය ඔහුව අමතන්නේ

කල්ගත තත්ව වාදයා, මූලධර්ම අන්තවාදයා, පවුල් ඥාතිත්වය කඩ කරන්නා, සැකකරුවා යනාදි නම්වලින්ය. පිටස්තර ස්ත්‍රිය හා සමග අතට අත දී ආචාර කිරීමද මෙවැනි වැරදි සහ ගත සිරිත් විරිත්වලින් එකකි.

බාප්පාගේ දියණිය, නැන්දම්මාගේ දියණිය, මාමාගේ දිය ණිය, පුංචි අම්මාගේ දියණිය, සහෝදරයාගේ බිරිඳ, බාප්පා ගේ බිරිඳ, මාමාගේ බිරිඳ යනාදි විවාහවීමට අනුමත ස්ත්‍රින් සමග අතට අත දී ආචාර කිරීමේ සිරිතක් අද සමාජයෙහි ජලය පානය කිරීමක් සේ සරලව පවතී. ආගමික වශයෙන් මෙම ක්‍රියා කෙතරම් අනතුරුදායක බව පැහැදිළි සිත්සත තින් වටහා ගන්නන් එසේ කිරීමෙන් වැළකී සිටිති. මෙම කරුණ ගැන නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව මඃකල් බින් යසාර් (රලි) මෙසේ වාර්තා කරන්නේය.

ඔබලාගෙන් කවරෙකුගේ හෝ සිරසෙහි යකඩ කටුව කින් ඇණීම ස්පර්ශ කිරීම තහනම් ස්ත්‍රීයෙකු ස්පර්ශ කිරී මට වඩා ඔහුට උතුමිය. (ග්‍රන්ථය : තබරානී)

මෙය අතින් සිදුවන දුරාචාරයකි. මන්දයත්, නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව ඉබ්නු මස්ඌද් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

(මිනිසාගේ) ඇස් දෙක දුරාචාරයෙහි යෙදෙන්නේය. අත් දෙක දුරාචාරයෙහි යෙදෙන්නේය. කකුල්දෙක

දුරාචාරයෙහි යෙදෙන්නේය. ලිංකේන්ද්‍රයන් දුරාචාරයෙහි යෙදෙන්නේය. (ග්‍රන්ථය : අහ්මද්)

නබිනායක මුහම්මදු (සල්) තුමාට වඩා පවිත්‍ර හදවතක් ඇති කෙනෙකු මෙම විශ්වයෙහි සිටින්නේද ? එසේ සිටින කළ එතුමා 'මම ස්ත්‍රීන් සමග අතට අතදී ආචාර නොකරන් නෙමි' යනුවෙන්ද, 'මම ස්ත්‍රීන්ගේ අත් ස්පර්ශ නොකරන් නෙමි' යනුවෙන්ද ප්‍රකාශකර ඇති බව අහ්මද් හා තබරානී ග්‍රන්ථයන්හි සටහන්වී ඇත. නබිනායක තුමාගේ බිරියක්වූ ආයිෂා (රලි) තුමිය මෙසේ පවසන්නිය.

මා අල්ලාහ් කෙරෙහි දිවුරා කියමි. අල්ලාහ්ගේ දූතයාගේ අත කිසි දිනක හෝ කිසියම් ස්ත්‍රියකගේ අත් මත ස්පර්ශ වූයේ නොමැත. නමුත්, එතුමා දිවෙන් ප්‍රකාශ කිරීම මගින් ඔවුන්ගෙන් දිවුරුම් ලබා ගන්නේය. (ග්‍රන්ථය : මුස්ලිම්)

සමහර සැමියන් 'තම සහෝදරයන් සමග අතට අත දී ආචාරය නොකරන්නේනම්, දික්කසාදය කරන බව' සිය යහපත්ශීල බිරියන්ට අවවාද කරති. මෙවන් සැමියන් අල් ලාහ් කෙරෙහි බියකමෙන් සිටිය යුතුයි. මෙහිදි කරුණක් වටහා ගත යුතුයි. එනම්. තිරයේ පිටුපස සිට අතෙහි රෙද් දක් දමා එමගින් අතට අතදී ආචාරය කිරීම අනුමත බවට නොසිතිය යුතුයි. මුහුණට මුහුණලා මෙසේ කිරීම හෝ රෙද් දක මගින් කිරීම හෝ යන දෙකම තහනම්ය.

# ස්ත්‍රීන් සුගන්ධය තවරා පිරිමින් අතර ගැවසීම

ස්ත්‍රීන් සුවඳ විලවුන් තවරාගෙන පිරිමින් ඉදිරියෙහි ගැව සීම අද අධිකව සාමාන්‍ය දෙයක් ලෙස පවතී. මෙවන් ස්ත්‍රීන් කෙරෙහි නබි මුහම්මදු (සල්) තුමා දැඩි ලෙස අවවාද කර මෙසේ පැවැසූ බව අබූමූසා (රලි) තුමා වාර්තා කරන්නේය.

ස්ත්‍රියෙකු සුවඳ විලවුන් තවරා, පසුව මිනිසුන් එකී සුවඳ දැනීම සඳහා මිනිසුන් අතර ගැවසියේ නම්, ඇය ගණිකා වකි. (ග්‍රන්ථය : අහ්මද්)

සමහර ස්ත්‍රීන් නොසැළකිලිමත්ව හා සාමාන්‍ය සිරිතක් වශයෙන් මෙසේ ගැවසෙති. කෙතරම්නම්, ඔවුන් සුවඳ විල වුන් තවරාගෙන රියදුරන්, මුරකාරයන් හා වෙළෙඳුන් කරා සාමාන්‍යයෙන් ගමන් කරති. මෙවැනි ස්ත්‍රීන් සිය නිවසින් පිටවීමට අදහස් කරන්නේනම්, එය දේවස්ථානය කරා යාම හෝ වේවා ඔවුන් අනිවාර්ය ජලස්නානය සේ ජලස්නානය කර (එම සුවඳ ඉවත්වීමෙන් පසු) පිටත්විය යුතු බව ඔවුන්ට ඉස්ලාම් ධර්මය දැඩි ලෙස නීතිය පනවා ඇත.

මේ පිළිබඳව නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවර ස්ත්‍රියෙකු හෝ සුවඳ විලවුන් තවරා ගෙන, පසුව එකී සුගන්ධය (මිනිසුන්) දැනීම සඳහා මස්ජිදයටදු පිටත්වූ යේද, ඇය අනිවාර්ය ස්නානයක් සේ ස්නානය කරන තෙක් ඇගේ සලාතයන් පිළිගනු නොලැබේ. (ග්‍රන්ථය : අහ්මද්)

සමහර ස්ත්‍රීන් මංගල්‍ය උත්සවය හා ස්ත්‍රීන්ට අදාල වැඩ සටහන කරා පිටත්වීමට පෙර සුවඳ විලවුන් තවරා ගනිති. එපමණක් නොව සමහර ස්ත්‍රීන් අධික සුගන්ධය විහිදන සුවඳ විලවුන් තවරා ගෙන කඩ වීදිවල ගැවසීම, වාහනවල ගමන් කිරීම, පිරිමින් හා ස්ත්‍රීන් මිශ්‍රවන රැස්වීම් හා සභා වල සහභාගිවීම හා රමදාන් රාත්‍රියන්හි දේවස්ථානය කරා යාම යනාදියෙහි නිරත වෙති. මේ ගැන අපි පැමිණිලි කළ හැක්කේ අල්ලාහ් වෙත පමණි. ස්ත්‍රීන් ගාන සුවඳ විලවුන් මිලින සුවිදෙන් සහ පෙණෙන පැහැයෙන් තිබිය යුතු බව ඉස්ලාම් ෂරීආ නීතිය වටහා දෙන්නේය.

'විශ්වයේ අධිපති අල්ලාහ් අප කෙරෙහි කෝප නොවී සිටිනු මැනවි. දැනුම් ඥානයක් නොලද මෝඩ පිරිමින් හා ස්ත්‍රීන් කරන වැරදි ක්‍රියාවන් කෙරෙහි යහපත්ශීල පිරිමින් හා ස්ත්‍රීන් කෙරෙහි දඬුවම් නොකරනු මැනවි. එසේම, අප සැමට යහමග පෙන්වනු මැනවි' යනුවෙන් අල්ලාහ් වෙත යොමුවී ප්‍රාර්ථනා කරමු.

# ස්ත්‍රිය පිරිමියෙකු සමග ගමන් කිරීම

ස්ත්‍රියෙකු විවාහවීමට අනුමත පිරිමියෙකු සමග ගමන් බිමන්හි යෙදීම ඉස්ලාම් තහනම්කර ඇත. නබි (සල්) තුමා පැවැසූ බව ඉබ්නු අබ්බාස්(රලි) මෙසේ වාර්තා කරන්නේය.

කිසියම් ස්ත්‍රියෙකු හෝ විවාහවීමට තහනම් පිරිමියෙකු හා සමග හැර ගමන් බිමන්හි නොයෙදෙන්න. (ග්‍රන්ථය : බුහාරි හා මුස්ලිම්)

හජ් කර්තව්‍යය ඉටු කිරීම සඳහා පිටත්වීම ඇතුලු සෑම ගමන්ම මෙහි අන්තර්ගතවේ. විවාහවීමට අනුමත පිටස්තර පිරිමියෙකු සමග ස්ත්‍රියෙකු ගමන් කිරීම ඔහු ඇය හා සමග අනිසි ලෙස හැසිරීමට හේතුවන අතර, අසරණ ස්ත්‍රිය එයට යටත්වීමටද ඉඩ සැලැසේ. මෙමගින් අවම වශයෙන් ඇයගේ කණ්‍යාභාවයට හා ගරුත්වයට හානි සිදුවීමට හැක.

එසේම ස්ත්‍රිය වෙනත් පිරිමියෙකු හා සමග ගුවන් යාන යෙන් ගමන් කිරීමද තහනම්ය. ගුවන් තොටුපලට ගොස් පිටත් කරන්නේද, ගුවන් තොටුපලහි පිළිගන්නේද මහ්රම් හෙවත් විවාහවීමට තහනම් පිරිමින් බවට ඔවුහු සිතුවුද එයද තහනම්ය. මන්දයත්, ගුවන් යානයෙහි ඇය හා සමග ගමන් කරන්නේ කවරෙක්ද ? ගුවන් යානයට කිසිඳු ආබාධයක් සිදුවී වෙනත් ගුවන් තොටුපලහි ගොඩ බැස්සේනම් හෝ ගුවන් යානය පිටත්වීමට

ප්‍රමාදවූයේනම්, හෝ කිසියම් හේතුවක් මත පිටත්වීමේ දිනය වෙනස් වූයේනම්, ඇගේ තත්ත්වය කෙසේ පවතීද? මෙවන් සිදුවීම් රාශියක් දක්නට ඇත.

ස්ත්‍රියකු ගමන් බිමන්හි යෙදීමට අනුමත හා විවාහවීමට තහනම්වූ මහ්රමී යනුවෙන් හැඳින්වන පුද්ගලයා වයසට පත්, සියුම් බුද්ධියලත්, මුස්ලිම් පිරිමියෙකු විය යුතුයි.

නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූ සර්ද් අල්කුද්රී (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

**...ස්ත්‍රීයකු සිය පියා හෝ පුත්‍රයා හෝ සහෝදරයා හෝ වෙනත් ඇගේ මහ්රමී (විවාහවීමට තහනම් ගෞරවනීය) අය සමග හැර ගමන් බිමන් කිරීම තහනම්ය. (ග්‍රන්ථය : මුස්ලිම්)**

# ඕනෑකමින් අන් ස්ත්‍රීන් කරා බැලීම

මෙම කරුණ කෙරෙහි අල්ලාහ් මෙසේ පවසන්නේය.

*(නබිතුමනි) විශ්වාසනීය පිරිමින්හට 'ඔවුන් තම බැල්ම පහත හෙළිය යුතු බවත්, තම ලිංකේන්ද්‍රයන් රැකගත යුතු බවත්' ඔබ පවසන්න. මෙය ඔවුන්ට පවිත්‍රතාවයකි. නියතව අල්ලාහ් ඔවුන් කරන දේ කෙරෙහි ඉතා සදාන වන්තයාය. (අල්කුර්ආන්-24:30)*

නබි මුහම්මදු (සල්) තුමා 'ඇසින් කරන දුරාචාරය (තහ නම් දෙය) බැලීම වේ' යනුවෙන් පැවැසූ බව අබූ

හුරෙරා (රලි) තුමා වාර්තා කරන්නේය. (ග්‍රන්ථය : බුහාරි)

පිරිමියෙකු තමා විවාහවීමට අදහස් කරන ස්ත්‍රිය බැලීම, වෛද්‍යවරයා ලෙඩෙක්වූ ස්ත්‍රිය බැලීම යනාදී ඉස්ලාම් අනු මත හෝ නොවැළක්විය හැකි හේතූන් මත හෝ පිටස්තර ස්ත්‍රිය කරා බැලීමෙන් ප්‍රශ්නයක් නොවන්නේය. එසේම, ස්ත්‍රීයෙක් වැරදි ආකල්පයකින් පිටස්තර පිරිමියකු බැලීමද තහනම්ය. මේ පිළිබඳව අල්ලාහ් අල්කුර්ආනයෙහි මෙසේ පවසන්නේය.

*තවද, (නබිතුමනී) විශ්වාසනීය ස්ත්‍රීන්ටද 'ඔවුන් තමාගේ බැල්ම පහත හෙළිය යුතු බවත්, තම ලිංගික ප්‍රදේශය රැකගත යුතු බවත්' ඔබ පවසන්න. (අල්කුර්ආන්–24:31)*

එසේම පිරිමියකු සෞන්දර්යමත් යෞවනයන් හා කොල් ලන් කාම හැඟීමෙන් බැලීමද, පිරිමියෙකු අන් පිරිමියෙකු ගේ රහස් ප්‍රදේශය බැලීමද ස්ත්‍රියෙකු අන් ස්ත්‍රීයෙකගේ රහස් ප්‍රදේශය බැලීමද තහනම්ය. එසේම, රහස් ප්‍රදේශය බැලීම හෝ තිරයෙන් පිට සිට ඇල්ලීම තහනම්ය.

සමහර මිනිසුන් පුවත්පත් හා සඟරාවල පළවන රූප හා චිත්‍රපටිවල ප්‍රදර්ශණය කරන රූප ඒවා සැබෑ රූපයන් නොවන පදනම යටතේ බලති. මේවා සාතාන්ගේ පිළිකුල් කළ යුතු මග පෙන්වීමකි. මෙවන් රූපවල කාමය හඟවන හා නපුරු දේ අන්තර්ගතව පැවතීම සැමදෙනා වටහාගෙන සිටින කරුණකි.

# පවුලෙහි වැරදි නොසළකා හැරීම

මිනිසුන් සිය පවුලෙහි තුල සිදුවන වැරදි දැනගෙන ඒවා කෙරෙහි නොසැළකිලිමත්ව සිටිති. මෙය ඉස්ලාම් ධර්මයට පටහැනි කාර්යයෙකි.

නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබ්දුල්ලාහ් බින් උමර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

අඛණ්ඩව මත්පැන් පානය කරන්නා, තම දෙමාපියන්ට නින්දා කරන්නා සහ සිය පවුලෙහි සිදුවන වැරදි (නොව ළක්වා නිහඬව සිටීම මගින්) අනුමත කරන්නා යන තුන් දෙනාට අල්ලාහ් තිවන තහනම් කරයි. (ග්‍රන්ථය : අහ්මද්)

නවීනතම මෙම යුගයෙහි පවුල්වල සිදුවන වැරදි ගැන වැඩි පිරිස් නොසැළකිලිමත්ව සිටිති. එනම්, පවුලෙහි දිය ණියය හෝ බිරිඳ දුරකථනයෙන් අමතමින් පිටස්තර පිරිමින් සමග පරස්පරව ලලිතභාවයෙන් පෙම් කතා බස්වල යෙදීම කෙරෙහි නොසැළකිලිමත්වීම, නිවසෙහි ස්ත්‍රියකු පිටස්තර පිරිමියෙකු සමග තනිව සිටීමට අනුමත කිරීම, මෙහෙකා රයා හා රියදුරා වැනි පිටස්තර පුද්ගලයන් සමග ස්ත්‍රියෙකු ගමන් කිරීමට අවසර දීම, ස්ත්‍රින් හිජාබ් හෙවත් ආවරණ යක් පැළඳීමකින් තොරව සිය නිවෙසින් පිටත්වීමද එමගින් පිටස්තර පිරිමින් ඔවුන්ගේ සෞන්දර්ය රස විඳීමද අනුමත කිරීම හා

සමාජයෙහි අශීලාචාරයද පරිහානියද සිදු කරන අසභ්‍ය සංගරා හා වීඩියෝ කැසට් පට නිවෙස්තුල පිවිසීමට අනුමත කිරීම යනාදීන් මෙයට උදාහරණවේ.

# ඥාතිත්වය වෙනස් කිරීම

ඥාතිත්වය වෙනස් කිරීමෙන් හැඳින්වන්නේ, දරුවෙකුට සිය පියා නොවන වෙනත් පුද්ගලයෙකු පියා ලෙස සම්බන් ධකර කැඳවීම සහ පුද්ගලයෙකු සිය දරුවාට තම දරුවා නොවන බව පැවැසීම වේ.

මුස්ලිම්වරයා තම පියාව අතහැර වෙනත් පුද්ගලයෙකු සිය පියා ලෙසට සම්බන්ධකර කීම හෝ ඔහු තම උපන් පවුල අතහැර වෙනත් පවුල හා සමග සම්බන්ධකර කීම හෝ තහනමිය. සමහරුන් ලෞකික වාසිය තකා මෙසේ කර, එම ව්‍යාජ ඥාතිත්වය රජයේ නිල ලේඛණවලද සට හන් කරති. තමාගේ පියා තමාව කුඩා වියේදී නොසලකා අත හැර ගිය වෛරයෙන් සිය පියා කෙරෙහි අප්‍රියභාවය පෙන්වමින් මෙසේ කරන අයද සිටිති. මේවා සියල්ල තහ නමිය. මෙයින් විවාහවීමට අනුමත හා තහනම් අය තෝරා ගැනීම, සම්පත් කෙරෙහි හිමිකම් ලබා ගැනීම යනාදිවල එළඹන ගැටලුවලදි ප්‍රශ්න කීපයක් ඇතිවේවි. නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් අබූබක්ර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙකු හෝ දැනුවත්ව සිය පියා නොමැති අයෙකුව සිය පියා බව තර්ක කළේනම්, ඔහුට ස්වර්ගය තහනම්වේ. (ග්‍රන්ථය : බුහාරි)

ඥාතිත්වය වෙනස් කරන හා ව්‍යාජ ඥාතිත්වය සම් බන්ධ කරන ක්‍රියාවන් හා කරුණු සියල්ලම තහනම්ය. සමහරුන් තම බිරිඳන් හා සමග ප්‍රශ්න ඇතිවන කළ තම බිරිඳව නින්දිත වචනවලින් දොස්පද කියති. තම දරුවාද කිසිදු සාධකයෙන් තොරව තමාගේ දරුවා නොවන බවද දොඩවති. සමහර ස්ත්‍රීන් සිය සැමියන්ට ද්‍රෝහිකම් කරමින් අන් අය හා සමග ඇතිවූ අනියම් ඇසුරකින් ලැබූ ගර්භය සිය කුසෙහි උසුලා ගෙන එය තම සැමියන්ගේ නමින් පව සති. නබිනායක මුහමම්දු (සල්) තුමා මේ ගැන දැඩි ලෙස අවවාද කර ප්‍රකාශ කළ වදනක් අබූ හුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

ස්ත්‍රියෙකු යම් පවුලකට කිසිදු සම්බන්ධයක් නොමැති (දුරාචාරායෙන් ඇතිවූ කලළය හෝ) දරුවෙකුව එම පවුල සමග සම්බන්ධ කළානම්, ඇයට අල්ලාහ්ගෙන් කිසියම් දෙයක් නොමැති අතර, අල්ලාහ් තම ස්වර්ගයෙහි ඇය පිවි සීම වළක්වයි. එසේම, පුද්ගලයෙකු තම දරුවෙකුව තමා ගේ බව දැනගැනත් (තමාගේ නොවන බවට) ප්‍රතික්ෂේප කළේනම්, අල්ලාහ් ඔහුගෙන් ඈත්වී සිටී. තවද, අල්ලාහ් ඔහුව (පරලොව) දිනයේ පෙරවුවන් හා පසුවූවන් ඉදිරියෙහි නින්දාවට ලක් කරයි. (ග්‍රන්ථය : අබූදාවූද්)

# පොලිය අනුභව කිරීම

පොලිය ලබා ගන්නා අය හා සමග හැර අන් කිසිවෙකු සමග හෝ යුද ප්‍රකාශ නොකරන බව අල්ලාහ් ශුද්ධවූ අල් කුර්ආනයෙහි පවසන්නේ මෙසේය.

*විශ්වාසවන්තයිනි, ඔබලා සැබෑ විශ්වාස වන්තයින්නම්, අල්ලාහ් කෙරෙහි බියබවෙන් ඉතිරිව පවතින පොලිය නොලබා අතහැර සිටින්න. මෙසේ ඔබලා නොකළේ නම්, (ඔබලාට එරෙහිව) අල්ලාහ් හා ඔහුගේ දූතයාගෙන් යුද්ධය ප්‍රකාශවී ඇති බව දැන ගන්න. (අල්කුර්ආන්-2:278,279)*

පොලිය ලබා ගැනීම අල්ලාහ්ගෙන් කෙතරම් නින්දිත විපාකයක් ගෙනදෙන කාර්යයක් බව වටහා ගැනීමට මෙම වදන් දෙක ප්‍රමාණවේ. පොලී සහගත ගැණුම් විකුණුම් ක්‍රම යෙන් සිදුවන විපාකය පැහැදිළිවම පවතී. මෙය රජයේද පෞද්ගලික ආයතන හා පුද්ගලයන්ගේද තත්ත්වය කරා හදවත යොමුකරන සැම දෙනාට දැනගත හැකිවේ. බංක ලොත්වීම, අලාභ සිදුවීම, වෙළඳ පොළ දුබලවීම, ණය ගෙවා ගැනීමට නොහැකිවීම, ආර්ථිකය පසුබෑමට පත්වීම, රැකියා විරහිතයන්ගේ ප්‍රතිශතය අධිකවීම, බොහෝ සමාගම් හා වෙළඳසැල් වසා තැබීම, දිනාපතා තම දහඩිය පොළොවෙහි හෙලා උපයාගත් දේ මගින් පොළිය ගෙවීමට නොහැකිවීම හා මානව සමාජයෙහි සම්පත් හා ධනය යම් පිරිසකගේ අතේ මිටේ පමණක්

පැවැතීම යනාදීන් පොලිය සහගත ගැණුම්, විකුණුම් ක්‍රමයෙහි සිදුවන නින්දිත විපාකයන්ය. මේවා සියල්ල පොලිය සම්බන්ධවූ කටයුතුවල යෙදෙන්නන් සමග අල්ලාහ් කරන යුධ අවවාදයේ විපාකයන් විය හැක.

පොලිය වෙළඳාමක් ලෙස පවත්වන්නන්, එහි කොටස් කරුවන් හා එයට උදව් උපකාර කරන්නන් නබිතුමාගේ ශාපයට ලත් අයකි. මන්ද ජාබිර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

නබි මුහම්මදු (සල්) තුමා පොලිය ලබා ගන්නාට, ලබා දෙන්නාට, එහි ගිණුම් සටහන් කරන්නාට, එයට සාක්ෂි ලෙස ඉදිරිපත් වන්නාට ශාප කළේය. ජාබිර් (රලි) තුමා 'ඔවුන් සැම දෙනා පාපයෙහි සමාන වන්නන්ය' යනුවෙන්ද පවසයි. (ග්‍රන්ථය : මුස්ලිම්)

නබිතුමාගේ මෙම වදන අනුව පොලිය පිළිබඳ ගිණුම් ලිවීම, සසඳා බැලීම, ලබා ගැනීම, ලබා දීම, එකතු කිරීම, ආරක්ෂා කිරීම යනාදීන් තහනම්ය. පොදුවෙන් කිසිඳු ආකාර යකින් හෝ එයට සම්බන්ධවීම හා සහාය දැක්වීම තහ නම්ය. මෙම පාපයෙහි නින්දිතභාවය හා විපාකය පිළිබඳව නබි (සල්) තුමා පැහැදිළිකර පැවැසූ වදනක් අබ්දුල්ලාහ් බින් මස්ඌද් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

පොලිය හැත්තෑ තුන් කොටස්වලට ඇතුලත්වේ. ඒවායින් (පාපයෙන්) ඉතා පහත්ම කොටසනම් කෙනෙකු සිය මව විවාහකර ගැනීමකි. පොලිය අතර

ඉතා කෲර පොලියනම්, මුස්ලිමෙකුගේ නම්බුවට හානි කිරීමකි. (ග්‍රන්ථය : හාකිම්)

එසේම නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් අබ්දුල්ලාහ් බින් හන්ළලා (රලි) මෙසේ වාර්තා කරන්නේය.

පුද්ගලයෙකු දැනුවත්ව පොලිය අනුභව කිරීම, හැටතුන් වතාවක් දුරාචාරයෙහි යෙදීමට වඩා කෲරයෙකි. (ග්‍රන්ථය : අහ්මද්)

පොලිය ගනුදෙනු කිරීම සැම දෙනාට හා සැම අවස්ථා වන්හිම පොදුවෙන් තහනම්වූ දෙයකි. සමහර අය සිතන පරිදි පොලිය ධනවතා හා දුප්පතා අතර පමණක් තහනම්වූ දෙයක් නොවේ. අධික ධනවතුන් හා සුපිරි වෙළුන්දුන් සම හරු මෙම පොලියේ විපාකයෙන් බංකලොත් භාවයට පත් වූහ. අද පවතින මෙවන් විපාක මෙයට සාධක ලෙස පවතී. පොලියෙන් සිදුවන අවම විපාකය නම්, ධනය කොපමණ හා කෙතරම් ප්‍රමාණයෙන් තිබුනද, පොලිය ඒවාහි බරකත් හෙවත් අභිවෘධිය විනාශ කරයි. නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබ්දුල්ලාහ් බින් මස්ඌද් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

පොලියෙන් උපයාගත් ධනය කොපමණ අධිකවූවද, අව සානයේදී එය අඩු වශයෙන්ම පවතී. (ග්‍රන්ථය : අහ්මද්)

අධික ප්‍රමාණයෙන් පවතින පොලිය පමණක් තහනම් නොවන්නේය. ප්‍රමාණයෙන් අධිකයෙන් හෝ

අඩුවෙන් හෝ වේවා ඒ සියල්ලක්ම තහනම්ය. පොලිය අනුභව කරන්නා පරලොව දිනයෙහි ෂෛතාන්ගේ පහරදීමට ලක්වූ පිස්සෙකු සේ සිය මිනීවළෙන් සිට නැගිට පිටත්වේ.

පොලිය අනුභව කිරීම මෙතරම් නින්දිත පාපයක් වුවද, මේ සඳහාද පාපොච්චාරණයක් ඇති බව පවසන අල්ලාහ් ඒ පිළිබඳ ක්‍රමයද මෙසේ පැහැදිළි කරයි.

*ඔබලා පාපොච්චාරණය කර (මෙම පාපයෙන්) නිදහස්වූ යේනම්, ඔබලාගේ ධනයෙන් මූල ධනය ඔබලාට හිමිවේ. (ණය කරුවන්ට) ඔබලා අපරාධ නොකරන්න. ඔබලාද අප රාධයට ලක් නොකෙරේ. (අල්කුර්ආන්-2:279)*

විශ්වාස වන්තයා මෙම මහා පාපය ඉතා නින්දිතවූ ක්‍රියා වක් ලෙස හඟවා එය ඔහු සිය සිත්සතනින් පිළිකුල් කළ යුතුයි. කෙතරම්නම්, තම ධනය වියදම්වී විනාශයට පත්වී මෙන් වැළකී සිටීම හෝ සොරුන්ගෙන් රැකගැනීම යනාදි නොවැළක්විය හේතුන් මත පොලී පරිහරනය වන බැංකු වල තැන්පත් කිරීම පවා පිළිකුල හැඟවිය යුතුයි.

වෙනත් මගක් නොමැති නිසා මෙසේ තැන්පත් කරන පුද්ගලයන්ද මෙමගින් ඔවුන් මැරුණු සතෙක් හෝ එයටත් වඩා නින්දිත දෙයක් අනුභව කරන්නෙකු සේ බව හැඟීම් ඇතිකර ගත යුතුයි. ඒ අතර ඔවුන් අල්ලාහ්ගෙන් සමාවද අයැදිය යුතුයි. එසේම මෙය

වෙනුවෙන් හැකිතාක් විකල්ප මාර්ගයක් සොයාගත යුතුයි.

බැංකුවෙන් ඔවුන් පොලිය අයැද සිටිය නොයුතු අතර, ඔවුන්ගේ ගිණුම්වල පොලිය බැරකර තිබේනම්, ඒවා සදකා හෙවත් පින් කිරීමේ චේතනාවෙන් තොරව වෙනත් අනුමත මාර්ගවල වියදම් කළ යුතුයි. මක්නිසාදයත්, අල්ලාහ් පවිත්‍ර වන්තයාය. ඔහු පවිත්‍රතාවයෙන් තොර කිසියම් දෙයක් පිළි නොගනී. එපමණක් නොව ඔවුන් කුමන ආකාරයෙන් හෝ එයින් ප්‍රයෝජනය ලබාගැනීම සඳහා එය පරිහරනය කිරීම තහනම්ය. මෙම පොලියෙන් කෑම බීම ගැනීම, ඇඳුම් පැළ ඳුම් මිළදී ගැනීම, වාහන හා නිවසට වියදම් කිරීම, තමාගේ බිරිඳ හෝ දරුවන් හෝ දෙමාපියන්ට වියදම් කිරීම, සකා තය ගෙවීම, වරිප්පනම් ගෙවීම හා තමා ලක්වූ පීඩනයෙන් නිදහස්වීමට වියදම් කිරීම යනාදී කුමණ කාර්යයකට හෝ පරිහරනය කිරීම තහනම් වේ. අල්ලාහ්ගේ දඬුවමට බියවී මේවායින් වැළකී සිටීම අනිවාර්ය වේ.

# විකුණන ද්‍රව්‍යයෙහි දුර්වලතා සැඟවීම

නබි මුහම්මදු (සල්) තුමා (දිනක්) එක් ආහාර ගොඩක් පසුකර ගමන් කළේය. එවිට එකී ආහාර ගොඩ තුලට තම අත දැමූ නබිතුමාගේ ඇගිලිවලට තෙත ගතියක් දැනිත. එවිගස එතුමා ආහාර වෙළෙන්දනී මෙය කුමක්ද ? යනුවෙන් විමසීය. එයට

ඔහු ‘අල්ලාහ්ගේ දූතයාණෙනි, වැහි ජලයට එසේ තෙත්විය’ යැයි කීය. එකළ එතුමා ‘ඒවා (තෙත්වූ දේ) මිනිසුන්ගේ පෙනීමට පෙනෙන සේ මතුපිටට දැමිය යුතුව තිබුනානේද ? කවරෙක් වංචා කරන්නේද, ඔහු මට අයත් කෙනෙකු නොවන්නේය’ යැයි පැවැසීය. මෙය අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය. (ග්‍රන්ථය : මුස්ලිම්)

අල්ලාහ් කෙරෙහි බැතිසිතක් නොමැති අධික වෙළඳුන් වෙළඳ භාණ්ඩවල දුර්වලතා හා අඩුපාඩු වසං කිරීමට විවිධ උපාය මාර්ග යොදවති. ඔවුහූ භාණ්ඩවල පළුදු මත ටේප් අලවති. සමහරුන් පළුදු භාණ්ඩයන් පෙට්ටියෙහි යට තබා ගනිති. සමහරුන් රසායන ද්‍රව්‍ය මගින් භාණ්ඩවල පෙනීම ආලේප කරති. සමහරු පළුදු එන්ජිමක් ක්‍රියාවෙහි යෙදෙන කළ එයින් පිටවෙන (පළුදු) ශබ්දය වසං කරති. මෙලෙස කෙනෙකු පළුදු දෙයක් මිළදී ගත්තේ නම්, එය ඉතා සීඝ්‍ර යෙන් විනාශ වේ. සමහරුන් කාලය ඉකුත්වන දිනය පවා වෙනස්කර ගනිති. සමහරුන් මිළදී ගැනීමට අදහස් කරන භාණ්ඩය හා වාහනයෙහි අඩුපාඩුකම් සොයා බැලීම හෝ පරීක්ෂා කිරීම අනුමත නොකරති. අධික පිරිස් වාහනවල සහ වෙනත් භාණ්ඩවල අඩුපාඩුකම පැහැදිලි නොකරති. මෙවන් ක්‍රියාවන් සියල්ල හරාම් හෙවත් තහනම්ය.

නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ වදනක් උක්බත් ඉබ්නු ආමිර් (රලි) තුමා උපුටා වාර්තා කරන්නේ මෙසේය.

මුස්ලිම් වරයා අන් මුස්ලිම් වරයාට සහෝදරයා වේ. තම සහෝදරයාට අඩුපාඩු ඇති දෙයක් විකුණන කවර මුස්ලිම් වරයා හෝ එම අඩුපාඩුව පැහැදිලි නොකිරීම තහනම්ය. (ග්‍රන්ථය : ඉබ්නු මාජා)

සමහරුන් (වාහන) වෙන්දේසි කරන කළ 'මම යකඩ විකුණන්නෙමි, යකඩ විකණන්නෙමි' යනුවෙන් මිනිසුන්ට පැවැසුවෙනම්, පළුදු වාහන විකුණුම් කළ වරද්දට ඔහු අසු නොවී තමා එම වගකීමෙන් නිදහස්වන බව සිතති. මෙවන් වෙළඳාම බරකත් හෙවත් අභිවෘධිය ඉවත් කරන බව නබි නායක මුහම්මදු (සල්) තුමා පවසන්නේය.

එතුමා එලෙස ප්‍රකාශ කළ වදනක් හකීම් බින් හිසාම් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

විකුණුම් කරන්නා සහ මිළදී ගන්නා යන දෙදෙනාට (එකී ස්ථානයෙන්) ඉවත්වන තෙක් (තමන් අතරෙහි සිදුවූ) වෙළඳාම පිළිගැනීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට හෝ හිමි කම් ඇත. ඔවුන් දෙදෙනා සත්‍යයම පවසා (කිසියම් දෙයක් නොසඟවා) පැහැදිලි කළේ නම්, එම වෙළඳාමෙහි ඔවුන්ට අභිවෘධිය ලැබේ. ඔවුන් අසත්‍යය පවසා (යම් දෙයක්) සැඟ වූයේනම්, ඔවුන්ට එම වෙළඳාමෙන් අභිවෘධිය ඉවත් කරනු ලැබේ. (ග්‍රන්ථය : බුහාරි)

# නජ්ෂ් වෙළඳ ක්‍රමයෙහි යෙදීම

නජ්ෂ් යනු, වෙළෙන්දෙකු විසින් කිසියම් දෙයක් හෝ මිළදී නොගන්නා කෙනෙකුව පත්කර, ඔහු විසින් මිළ වැඩි කොට එමගින් පාරිභෝගිකයන් රවටමින් ඔවුන් අධික මිළ කට භාණ්ඩ මිළදී ගැනීම සඳහා උනන්දු කිරීම වෙනුවෙන් යොදා ගන්නා උපාය මාර්ගයකි. නබිනායක මුහම්මදු (සල්) තුමා 'නජ්ෂ් ක්‍රමය මගින් වෙළඳාම් නොකරන්න' යනුවෙන් ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන වද නක් බුහාරි ග්‍රන්ථයේ සටහන්වී ඇත.

මෙසේ කිරීම සත්සුදක්සේ රැවටීම් ක්‍රමයකි. මක්නිසාද යත්, නබිනායක මුහම්මදු (සල්) තුමා 'ද්‍රෝහිකම් කරන්නා හා රවටන්නා නිරයෙහි පිවිසේ' යනුවෙන් පවසන්නේය.

වෙළඳ පොළවල, වාහන වෙන්දේසි කරන ස්ථානවල හා ප්‍රදර්ශනාගාරවල සිටින බොහෝ තැරව් කරුවන් තහනම් කරුණුවල අධිකව යෙදෙන හෙයින් ඔවුන්ගේ ජීවනෝපාය හරාම් හෙවත් තහනමිය.

උදහාරනයක් නම්, ඔවුන් නජ්ෂ් ක්‍රමයෙන් භාණ්ඩවල මිළ වැඩි කරමින් පාරිභොගිකයන් මිළදී ගැනීමට උනන්දු කරති. නොඑසේ නම්, එහි පැමිණෙන වෙළෙන්දුන් රවටා ඔවුන්ගේ භාණ්ඩවල මිළ පහළට බස්වති. නමුත් භාණ්ඩ මෙම තැරව්කරුවන්ට අයත් නම්, ඒවා මිළදී ගැනීම සඳහා පැමිණෙන

වෙළඳුන් රවටා එකී මිල වැඩි කරති. මෙසේම මෙවන් තැරව්කරුවන් මිනිසුන් රවටා ඔවුන්ට අනීතිය හෝ අපරාධය කරති.

# ජුම්අා අදානයෙන් පසු වෙළඳාම් කිරීම

ජුමුආ (සිකුරාදා) දිනයේ සලාතයට කැඳවන අදානයෙන් පසු වෙළඳ කටයුතුවල නියලීම පිළිබඳව අල්ලාහ් මෙලෙස පවසන්නේය.

*විශ්වාස වන්තයිනි, ජුම්ආ (සිකුරාදා) දිනයෙහි සලාතය සඳහා ඔබලා කැඳවනු ලබන්නේ නම්, සිය වෙළඳ කටයුතු සියල්ල අතහැර දමා, අල්ලාහ්ව සිහිකිරීම සඳහා (දේවස්ථා නය කරා) යුහුසුළු ගමන් කරන්න. ඔබලා දැනුම් හා ඥාන ලත් බුද්ධිමතුන් වන්නේනම්, මෙසේ කිරීම ඔබලාට කුසල් සහගත කරුණකි. (අල්කුර්ආන්-62:9)*

සමහරුන් දෙවැනි අදානයෙන් පසුද තම වෙළඳසැල්වල හා දේවස්ථාන ඉදිරියෙහි වෙළඳ කටයුතුවල නිරතවී සිටිති. ඔවුන්ගෙන් දත් මදින මිස්වාක් (බ්‍රෂ්) හෝ වෙවා මිළදී ගත් නත් පාපයෙහි ඔවුන් හා සමග කොටස්කරුවන් වෙති. විද් වතුන්ගේ නිවැරදි මතය අනුව මෙවන් වෙළඳ කටයුතුවල යෙදීම තහනම් වේ.

සමහර හෝටල්, බේකරි හා කර්මාන්ත ශාලාහි අධිපති වරුන් තම සේවකයන් ජුම්ආ සලාතයේ වේලාවෙහිද වැඩ කළයුතු බවට බල කරති. භාහිරයෙන් ඔවුන්ට ලාභ වැඩි වුවද, යථාර්තයෙන් ඔවුන්ට වැඩිවන්නේ අලාභයකි. නමුදු, සේවකයන් නබිනායක මුහම්මදු (සල්) තුමාගේ 'අල්ලාහ්ට පටහැනි කරුණුවල කිසියම් මිනිසෙකුටද යටත් නොවිය යුතුයි' යන කියමනට අනුව ක්‍රියා කළ යුතුයි.

# සූදු කෙළීම

සූදු කෙළීම පිළිබඳව අල්ලාහ් අල්කුර්ආනයෙහි මෙසේ පවසන්නේය.

*විශ්වාස වන්තයිනි, මත්පැන් පානය කිරීම, සූදු කෙළීම, පිළිම් වන්දනාමාන කිරීම හා ඊතල විද නිමිති බැලීම යනා දීන් සාතාන්ගේ පිළිකුල් කළ යුතු කාර්යයන්ය. එහෙයින්, ඔබලා මේවායින් වැළකී සිටින්න. (එමගින්) ඔබලා ජයග්‍රහ ණය කළ හැක. (අල්කුර්ආන්-5:90)*

ජාහිලියියා හෙවත් අඥාන කාලයේ මිනිසුන් අතර සූදු කෙළීම විවිධ ක්‍රමයෙන් පැවතිනි. ඔවුන් අතර ප්‍රසිද්ධ ක්‍රම යනම් මෙසේය.

දස දෙනෙක් සමව එකතුවී ඔටුවෙකු මිළදී ගනිති. පසුව ඔවුනතර (ඊතලය මගින්) සීට්ටු අදිනු ලැබේ. ඒ අනුව හත් දෙනෙකු පමණක් එම ඔටුවාව කොටස්කර

ගනිති. ඉතිරි තුන්දෙනාට කිසියම් කොටසක් හෝ නොලැබේ.

## අද පවතින සූදු කෙළීමේ ක්‍රමයන් මෙසේය.

1- ලොතරැයිය : මෙය විවිධ වර්ගයෙන් පවතී. එයින් සාධාර ණයෙන් පවතින්නේ මෙසේය. එනම්, මිනිසුන් විවිධ අංක යෙන් පවතින වාසනා සම්පත් මිළදී ගනිති. නියමිත දින එම සම්පත් වෙනුවෙන් වාසනා වන්තයින් තේරීම සිදු කෙරේ. එකී අවසානයේදී වාසනාව ලත් පළමු, දෙවැනි, තෙවැනි ....... යනුවෙන් තෑගි මුදල් පිරිනමනු ලැබේ. ඔවුන් මේවා කුමන ආකර්ශණීය සහ මිහිරි නම්වලින් හැඳුන්වුවද ඒවා හරාම් හෙවත් තහනම්ය.

2- කිසියම් දෙයක් මිළදී ගැනෙන කළ එහි නොදෙනෙන දෙයක් සඟවා තබනු ලැබේ. නොඑසේ නම්, යම්කිසි දෙයක් මිළදී ගැනෙන කළ ඒ වෙනුවෙන් අංකයක් හෝ කාඩ් පතක් හෝ ලබා දෙනු ලැබේ. පසුව ඒ වෙනුවෙන් වාසනා වන්තයින් තේරීම සිදු කෙරේ. ඒ අනුව වාසනා වන්තයින්ට තෑගි පිරිනමනු ලැබේ.

3- අද පවතින සූදු කෙළීමේ ක්‍රම අතර රක්‍ෂණය කිරීමද එකකි. ඒවා ජීවිත රක්‍ෂණය, වාහන රක්‍ෂණය, භාණ්ඩ සඳහා රක්‍ෂණය, ගින්නෙන් ඇතිවන අලාභය සඳහා රක්‍ෂණය, අන් අයගෙන් ආරක්‍ෂාවීමේ රක්‍ෂණය යනාදි වශයෙන් විවිධ රක්‍ෂණ ක්‍රමද පවතී. මෙපමණක් නොව, සමහර

ගායකයන් තම කට හඬ හා ක්‍රීඩකයන් තම අවයන් වෙනුවෙන්ද රක්‍ෂණය කරති.

මේවා සියල්ල සූදු කෙළීම අන්තර්ගත කරුණු ලෙසට සැළකිය හැකිය. අද සූදු කෙළීම සඳහා පෞද්ගලික ක්ලබ් හා සමාජයන් බිහිකර ඇත. එහි මෙවන් පාපයෙහි යෙදීම සඳහා කොළ පැහැති මේස කීපයක් සවිකර ඇත. එසේම, පාපන්දු හා ක්‍රිකට් යනාදි ක්‍රීඩා තරගාවලිය සඳහා ඔට්ටු ඇල්ලීමද සූදු කෙළීමෙහි එක්තරා වර්ගයෙකි. මෙසේම, ක්‍රීඩාංගනවල හා විනෝදාංශ උයන්වල සූදු කෙළීමට සමාන ක්‍රීඩාවන්ද පවතී. ඒවා සියල්ල තහනම්ය.

# තරග කිරීම හා ඔට්ටු ඇල්ලීම

1- ආගාමානුකූල අරමුණු කෙරෙහි පවත්වන තරගාවලිය. මෙවන් තරගාවලිය තෑගිබෝග මත හෝ තෑගි බෝග යෙන් තොරව හෝ පැවත්වීම අනුමතවේ. ඔටු හා අශ්ව තරග, තුවක්කු වැනි අවි මගින් වෙඩි තැබීමේ තරග හා ඉලක්කය කරා පහරදීමේ තරග යනාදිවල යෙදිය හැක. මෙවන් පුහුණු ශුද්ධවූ යුද්ධ සඳහා උපකාරවේ. එසේම, ආගමික විද්වතුන්ගේ මතය පරිදි අල්කුර්ආනය පාඨය නය කිරීම වැනි තරගාවන්ද අනුමතවේ.

2-සාමාන්‍යයෙන් අනුමත තරගාවලිය. එනම්, පාපන්දු තරග, ක්‍රිකට් තරග හා දිවීමේ තරග යනාදි තරග අනුමතකි. නමුදු, සලාතය මගහැරීම හා ආවරණය කළයුතු ප්‍රදේශ විවෘතව පැවතීම යනාදි තහනම්

කරුණු වලින් වැළකී සිටිය යුතුයි. මෙවන් තරඟාවලියෙහි ඔට්ටු ඇල්ලීම සිදු නොවන්නේනම්, ඒවා අනුමතවේ.

3- තහනම් හා තහනම් කාර්ය කරා යොමුකරන තරඟාව ලිය. එනම්, ආයෝමය පුරුෂ හා රූප රැජින තරඟ, මුහු ණෙහි තුවාල සිදුකරන බොක්සිං තරඟ, අං ඇති සිව්පා වන් හා කුකුළන් කැටවීමේ තරඟ යනාදී තරඟාවලියන් සියල්ල තහනම්ය.

# සොරකම කිරීම

සොරකම පිළිබඳව අල්ලාහ් මෙසේ පවසන්නේය.

*සොරකම් කළ පිරිමි හා ගැහැණු යන දෙදෙනා උපයා ගත් පාපය සඳහා අල්ලාහ්ගෙන් නියමවූ දඬුවමක් වශයෙන් ඔවුන්ගේ අත් කපා ඉවත් කරන්න. අල්ලාහ් සැම දේ අභි භවත්නා හා ඥාන වන්තයා වේ. (අල්කුර්ආන්-5:38)*

සොරකම් අතර ඉමහත් නින්දිත මහා සොරකම නම් පැරණිම අල්ලාහ්ගේ දේවස්ථානයවූ කාබාවෙහි සොරකම් කිරීමකි. මෙවන් සොරුන් විශ්වයේ ඉතා ශ්‍රේෂ්ඨ හා පවිත්‍ර ස්ථානයක් වන මස්ජිදුල් හරාම් (කාබා) දේවස්ථානයේ හා අවට ප්‍රදේශවල අල්ලාහ්ගේ අණට කීකරු නොවී කිසියම් වටිනාකමක් හෝ ගෞරවයක් හෝ නොදක්වා හැසිරෙති.

නබිනායක මුහම්මදු (සල්) තුමා ග්‍රහණ සලාතය ගැන පැහැදිලි කළ අවස්ථාවේ මෙසේද ප්‍රකාශ කළ බව ජාබිර් (රලි) තුමා මෙලෙස වාර්තා කරන්නේය.

නරකාදියේ ගිනි දැල්ල මාගේ දේහයට බලපායිද ? යනු වෙන් බියවී (සලාතයෙහි සිටින කළ) මා සුළුවෙන් පසුපසට යාම ඔබලා දුටු අවස්ථාවෙහි නරකාදිය මා වෙත ගැනෙනු ලැබ පෙන්නුම් කරනු ලැබින. එවිට (කුඩා මිටියක සමාන) නැමී ඇති කෝටුවක් සමග සිටින කෙනෙක් නරකාදියෙහි සිය බොක්ක ඇදගෙන යාම මම දිටිමි. ඔහු (කවරෙකුනම්) එම කෝටුව මගින් හාජි වරුන්ගෙන් සෙරෙකම් කරමින් සිටී අයකි. (එනම්, ඔහු ඇවිදගෙන සිටින අවස්ථාවල එම කෝටුවෙන් හාජිවරුන්ගේ බඩු බාහිරාදියට කොක්ක දමා සොරකම් කළේය) මෙය හාජිවරයා දුටුවේ නම් 'ඔබේ බඩු බාහිරාදිය නොදැනුවත්ව මාගේ කොක්කට මාට්ටුවිය' යැයි (සමාදානය කරමින් නිදහසට කරුණු) පවසයි. හාජිවරයා එය නොදුටුවේනම් ඔහු ඒ සියල්ල රැගෙන යයි. (ග්‍රන්ථය : මුස්ලිම්)

පොදු සම්පත් සොරකම් කිරීම ඉතාමත් නින්දිත සොර කමකි. මෙසේ කරන සමහරුන් 'පිටස්තර අය සොරකම් කරන සේම අපිද සොරකම් කරන්නෙමු' යනුවෙන් පවසති. නමුදු, ඔවුන් තමන් සෑම මිනිසුන්ගෙන්ම සොරකම් කරන බව නොදනිති. මන්ද, මේවා සෑම මිනිසුන්ටම අයත් පොදු සම්පත්ය. අල්ලාහ් කෙරෙහි බැතිපෙමක් නොමැති අයගේ

මෙවන් ක්‍රියාව පිටස්තර අය කරන ක්‍රියාවන් අනුගමනය කිරීමට සාධකයක් නොවන්නේය.

සමහරු කාෆිර්වරුගේ සම්පත් ඔවුන් කාෆිර්වීම සාධක කරගෙන සොරකම් කරති. මෙය අනුමත නොවන කරු ණකි. මුස්ලිම් වරුන්ට විරුද්ධකම් පවත්වා යුද්ධය කරන කාෆිර්වරුන්ගේ සම්පත් පමණක් මුස්ලිම්වරුන්ට අනුමතවී ඇති අතර සෑම කාෆිර්වරුන්ගේ සමාගම්, සංස්ථා හා සම් පත් මුස්ලිම්වරුන්ට අනුමත නොවන්නේය.

සමහරු අන් අයගේ සාක්කුවල අත දමා කොල්ල කති. සමහරු පිටස්තර අයගේ නිවෙස්වලට ඔවුන් මූනගැසීමේ අරමුණෙන් ගොස් සොරකම් කරති. වෙනත් සමහරු තමා වෙත පැමිණෙන අමුත්තන්ගේ මලුවලින් සොරකම් කරති. තවත් සමහරු වෙළඳසැල්වල ගොස් එහි ඇති දේ තමාගේ සාක්කුවල හා ඇඳුම්තුල සඟවා තබා ගනිති. සමහර ස්ත්‍රීන් පවා මෙවන් දේහි යෙදෙති. වෙනත් සමහරු කුඩා හා සුළු දේ සොරකම් කිරීම සාධාරණයක් ලෙස සිතති. නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබු හුරෙරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

සොරකම් කරන්නාට අල්ලාහ් ශාප කරනු මැනවි. ඔහු බිත්තරයක් සොරකම් කළේනම් ඔහුගේ අත කපනු ලැබේ. ලණුවක් සොරකම් කළේ නම්, ඔහුගේ අත කපනු ලැබේ. (ග්‍රන්ථය : බුහාරි)

කවරෙක් හෝ කිසියම් දෙයක් සොරකම් කළේනම්, ඒ වෙනුවෙන් ඔහු අල්ලාහ් වෙත පාපොච්චාරණය කිරීම සහ එය අයිතිකාරයා වෙත භාරදීම අනිවාර්යවේ. එය ප්‍රසිද්ධව හෝ රහසිගතව හෝ වෙනත් අය මාර්ගයෙන් හෝ භාර දිය යුතුයි. නමුත්, එය ඔහු වෙත හෝ ඔහුගේ මරණයෙන් පසු ඔහුගේ හිමිකරුවන්ට භාර දීමට දැඩි මහන්සි වුවද නොහැකි වූයේනම්, එය ඔහුගේ නාමයෙන් පින්කර, එකී කුලිය ඔහුට ලැබිය යුතු බව සිතාගත යුතුයි.

# අල්ලස ලබාගැනීම හා ලබාදීම

සත්‍යය වසං කිරීමට හෝ අසත්‍යය පවත්වා ගැනීමට හෝ මිනිසුන් අතර තීරණය දෙන මහේස්ත්‍රාත් වරයාට අල්ලස ලබාදීම ඉමහත් පාපයකි. මන්ද, එය තීන්දු කිරීමේදී නීතිය මග හැරීමට හා සාධාරණය ලැබිය යුතු පුද්ගලයාට අසාධාර ණයක් ලැබීමට හේතුවේ. එසේම, මෙමගින් ප්‍රශ්න රාශියක් ඇතිවීමටද ඉඩ සැලසේ. මේ පිළිබඳව අල්ලාහ් මෙලෙස පව සන්නේය.

*තවද, ඔබලා, ඔබලා අතර වැරදි සහගත අනිසි මාර්ග යෙන් සම්පත් අනුභව නොකරන්න. තවද, ඔබලා දැනගෙන පිටස්තර පුද්ගලයන්ගේ ධනයෙන් (කිසිදු) කොටසක් හෝ අනිසි ලෙස අසාධාරණයෙන් අනුභව කිරීම සඳහා නිළධා රීන් වෙත (අල්ලස ලබාදීම සඳහා) සමීප නොවන්න. (අල් කුර්ආන්-2:188)*

නබිනායක මුහම්මදු (සල්) තුමා මෙලෙස ශාප කළ බව අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය.

(කිසියම් කරුණක් ගැන) තීන්දුවක් ලබා ගැනීම සඳහා අල්ලස ලබා දෙන්නාට සහ අල්ලස ලබා ගන්නාට අල්ලාහ් ශාප කරනු මැනවි. (ග්‍රන්ථය : අහ්මද්)

නමුදු, සාධාරණයක් ලබා ගැනීම සඳහා හෝ අසාධාරණ යක් වැළකීම සඳහා අල්ලස ලබා නොදී සාර්ථක නොවන් නේද, එවන් අවස්ථාවක අල්ලස ලබා දෙන්නා නබිනායක තුමාගේ අවවාදයට නොලක්වේ.

අද අල්ලස වර්ධනයවී සමාජයේ ව්‍යාප්තව පවතින්නේය. කෙතරම්නම්, සමහර කම්කරුවන් සිය වැටුපට වඩා අධික ආදායමක් අල්ලස මාර්ගයෙන් ලබා ගන්නා පමණක් නොව සමහර සමාගම්වල අයවැය වාර්තාවෙහි විවිධ නම් වලින් අල්ලස් ගනුදෙනු විස්තර සටහන් ප්‍රදර්ශනය කරනු ලබන් නේය. අධික ගනුදෙනු කරුණු අල්ලසෙන්ම ආරම්භවී අල් ලසෙන්ම අවසන් වන්නේය මෙගින් දිළින්දන් අධික දුෂ්කර තාවයට පත්වෙති. මිනිසුන් අතර භාරකරන ලද විවිධ වග කීම් අල්ලස හේතුවෙන් විනාශ විය. මුදලාලිලාට එරෙහිව කම්කරුවන් අයහපත් මගට පොළඹවීම කෙරෙහි යොමු කිරීමට අල්ලාස හේතුවේ.

අල්ලස ලබා දෙන්නාගේ කාර්ය සාර්ථක ලෙස සීඝ්‍රයෙන් ඉටුකර දෙනු ලැබේ. නමුත්, අල්ලස ලබා නොදෙන්නාගේ කාර්ය එසේ සාර්ථක ලෙස සීඝ්‍රව ඉටු

නොකරනු ලැබේ. නොඑසේනම්, එය ප්‍රමාද කරනු ලැබේ. අල්ලස ලබා දෙන් නන් අල්ලස ලබා නොදෙන්නන්ට පසුව පැමිණියද ඔවුන් තම කාර්ය ඔවුන්ට වඩා කඩිනමින් සහ පෙරාතුරුව ඉටු කර ගෙන පිටත්වති.

අල්ලස හේතුවෙන් මුදලාලිලාට ලැබිය යුතු භාණ්ඩයන් වෙළුඳ නියෝජිතයන්ගේ සාක්කුවට පත්වන්නේය. 'මේ හා මෙවන් හේතූන් මත මෙවැනි කාර්යයන්හි සම්බන්ධවන එකී කොටස්කරුවන් අල්ලාහ්ගේ දායාදයෙන් ඈත් කරනු මැනවි' යනුවෙන් නබිනායක මුහමම්දු (සල්) තුමා ප්‍රාර්ථනා කිරීම පුදුමයක් නොවේ. එතුමා පැවැසූ වදනක් අබ්දුල්ලාහ් බින් අම්රු (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

අල්ලස ලබා දෙන්නාට හා අල්ලස ලබා ගන්නාට අල්ලාහ් ගේ ශාපය පහළ වේවා. (ග්‍රන්ථය : ඉබ්නු මාජා)

# ඉඩම් පැහැර ගැනීම

පුද්ගලයෙකුට අල්ලාහ් කෙරෙහි බියබැතිකම නොමැති නම්, ඔහුගේ ශක්තිය හා කපටිකම ඔහුට එරෙහිව පවතී. එවිට ඔහු අන් අයට අයත් දේහි තම අත දමන්නා සේ සිය ශක්තිය අපරාධයෙහි යොදවයි. අන් අයගේ ඉඩම් පැහැර ගැනීම හා අත්පත්කර ගැනීමද මෙවන් අපරාධයකි. මෙකී අවසානය ඔහුව අති දුෂ්කරතාවයට පත් කරයි.

නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබ්දුල්ලාහ් බින් උමර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙකු හෝ තමාට අයිතියක් නොමැති වියත ප්‍රමාණ යක ඉඩමක් අපරාධයක් ලෙස පැහැර ගත්තේ නම්, පර ලොව දිනයෙහි ඔහුව පොළෝ හතක් තුල ගිල්ලනු (කිඳා බස්සනු) ලැබේ. (ග්‍රන්ථය : බුහාරි)

එසේම, නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බවට යඃලා බින් මුර්රා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙකු හෝ වියත ප්‍රමාණයක ඉඩමක් අනිසි ලෙසට පැහැර ගත්තේද, පරලොව දිනයේ අල්ලාහ් ඔහුට පොළෝ හතෙහි පහළ දක්වා එය සාරන ලෙසට අණ කරයි. පසුව, (එදින) මිනිසුන් අතර තීන්දු කරන තෙක් එය ඔහුට මාල යක් ලෙස පළන්දවනු ලැබේ. (ග්‍රන්ථය : අහ්මද්)

ඉඩමෙහි මායිම් හා සළකුණු වෙනස් කොට තම අසල් වැසියාගේ ඉඩම (හෝ කොටසක්) සිය ඉඩම හා සමග යා කොට එමගින් තම ඉඩම විශාල කරන්නා පැහැර ගැනීමේ වරද්දක් කළ අයෙකු සේය. නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් අලී (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙකු ඉඩමෙහි මායිම වෙනස් කරන්නේද, ඔහුට අල් ලාහ්ගේ ශාපය ඇතිවේවා. (ග්‍රන්ථය : මුස්ලිම්)

# නිර්දේශ කිරීම සඳහා තෑගිබෝග ලබා ගැනීම

සමහර මිනිසුන්ට සමාජයෙහි ලැබෙන ගරුත්වය සහ තරාතිරම සඳහා ඔහු තුති පුද කළේනම්, ඒවා අල්ලාහ්ගේ මාර්ගයෙන් ලැබූ භාග්‍යයන්ය. මෙවන් භාග්‍යයන් මුස්ලිම් සමාජයට පලක් ලබාදෙන කාර්යයන්හි යොමු කිරීම එය කෙරෙහි තුති පුද කිරීමකි. මේ පිළිබඳව නබිනායක මුහම් මදු (සල්) තුමා ප්‍රකාශ කළ වදනක් ජාබිර් බින් අබ්දුල්ලාහ් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

ඔබලාගෙන් කවරෙකුට හෝ තම සහෝදරයාට උපකාර කිරීමේ හැකියාවන් තිබේනම්, ඔහු එසේ කළාවේ. (ග්‍රන් ථය : මුස්ලිම්)

පුද්ගලයෙකු තම සහෝදරයාගෙන් අසාධාරණයක් ඉවත් කිරීමට හෝ ඔහුට උපකාරයක් කිරීමට හෝ තම තරාතිරම උපයෝගී කළේනම්, ඔහුට අල්ලාහ්ගෙන් කුසල් හා දායාද යන් ලැබේ. නමුත්, ඔහු තහනම් දේහි නොයෙදමින්ද, අන් අයගේ අයිතිවාසිකම්හි අත නොතබමින්ද සිට පිරිසිදු චේතනාවෙන් හැසිරිය යුතුයි. නබිනායක තුමා 'ඔබලා නිර්දේශ කරන්න. (ඔබලාට) කුලිය ලැබේ' යනුවෙන් පැවැසූ බව අබූ මූසා (රලි) තුමා වාර්තා කරන්නේය. (ග්‍රන්ථය : මුස්ලිම්)

කිසියම් කරුණක් කෙරෙහි නිර්දේශ - රෙකමදාරු කිරීම හා ඒ සඳහා උපකාරවීම වෙනුවෙන් කිසියම් දෙයක් හෝ ලබා නොගත යුතුයි. මක්නිසාදයත්, නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූ උමාමා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙක් තමාගේ සහෝදරයෙකුට (කිසියම් කරුණක් කෙරෙහි) නිර්දේශකර, ඒ වෙනුවෙන් ඔහුට යම් තෑග්ගක් පිරිනමා ඔහු එය පිළිගත්තේ නම්, පොලියෙහි එක් දොරටු වකට ඔහු පැමිණ සිටී. (ග්‍රන්ථ : අබූදාවූද් හා අහ්මද්)

මිනිස් සමාජයෙහි, තම තරාතිරම ප්‍රයෝජනයට ගනි මින් පුද්ගලයෙකුට රැකියාවක් ලබා දීම හෝ තනතුරෙහි උසස්වීමක් ලබා දීම හෝ ස්ථාන මාරුවීමක් ලබා දීම හෝ ලෙඩෙකුට ප්‍රතිකාර ලබා දීම හෝ මෙවන් උපකාර කිරීම සඳහා යම් මුදල් ප්‍රමාණයක් අයැද සිටින සමහරුන්ද සිටිති.

පෙර සඳහන් කළ අබූ උමාමා (රලි) තුමා වාර්තා කළ නබිනායක තුමාගේ වදන අනුව විද්වතුන්ගේ ප්‍රසිද්ධ මතය පරිදි, මෙසේ යම් මුදල් ප්‍රමාණයක් ලබා ගැනීම තහනම්ය. එපමණක් නොව, මෙම වදනෙහි භාහිර තේරුම කෙරෙහි අවධානය යොමු කළවිට නොඅයැද සිටියද, තමාට පිරිනමන කිසියම් තෑග්ගක් හෝ ලබා ගැනීමද තහනම් වේ. කුසල් කරන්නාට අල්ලාහ් පරලොව දිනයෙහි පිරිනමන තෑග්ග ප්‍රමාණවත්වේ.

පුද්ගලයෙකු හසන් බින් සහ්ල් (රහ්) තුමා වෙත පැමිණ, තම අවශ්‍යතාවය පවසා නිර්දේශ කරන මෙන් එතුමාගෙන් ඉල්ලා සිටීය. එයට සවන්දුන් එතුමා ඔහුගේ අවශ්‍යතාවය ඉටුකර දුන්නේය. පසුව එතුමාව හමුවීම සඳහා පැමිණි ඔහු එතුමාට තුති පුද කළේය. එවිට එතුමා ඔහුව අමතා 'ඔබ කුමක් නිසාද මට තුති පුදකරන්නේ ? (අල්ලාහ් අපිට ලබා දුන්) සම්පත්වලට සකාතය(දුගී බද්ද)ක් තිබෙන සේ, (ඔහු ලබා දුන්) තරාතිරමටද සකාතයක් තිබෙන බව අපි සිතන් නෙමු' යනුවෙන් ඔහුට කීය.

මෙම අවස්ථාවේ දෙයක් සඳහන් කිරීම උචිතවේ. එනම්, පුද්ගලයෙකු තමාගේ කටයුත්තක් ඉටුකර ගැනීම සඳහා කෙනෙකුව කුලියට පත්කර එයට පඩියක් ලබාදීම හා තම තරාතිරම ප්‍රයෝජනයට ගනිමින් කෙනෙකුට නිර්දේශකර එයට කුලියක් ලබා ගැනීම අතර වෙනසක් තිබේ. පඩියක් ලබා ගැනීම සමහර ආගමික කොන්දේශි අනුව අනුමතකි. එනමුත්, නිර්දේශ කිරීම වෙනුවෙන් කුලියක් ලබා ගැනීම තහනම්වේ.

# වැඩ ලබාගෙන කුලිය නොදීම

කම්කරුවාගෙන් වැඩ සම්පූර්ණයෙන් ලබා ගෙන එයට අදාල කුලිය සම්පූර්ණයෙන් ලබා නොදීම තහනම්ය. කම් කරුවාට ඔහුගේ කුලිය ඉක්මනින් ලබා දිය යුතු බව නබි නායක තුමාද උනන්දුකර ඇත්තේය.

නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබ්දුල්ලාහ් බින් උමර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කම්කරුට ඔහුගේ දහඩිය වියලීමට පෙර ඔහුගේ කුලිය ලබා දෙන්න. (ග්‍රන්ථය : ඉබ්නු මාජා)

කම්කරුවන්ට, කුලිකරුවන්ට හා වැඩ කරුවන්ට ඔවුන් ගේ අයිතිවාසිකම ලබා නොදීම අද මුස්ලිම් සමාජයෙහි පව තින අසාධාරණයකි. මේවා විවිධ ආකාරයෙන් පවතී.

## 1-කුලිය සම්පූර්ණයෙන් නොගෙවීම හා ඔහුට එය ඔප්පු කිරීමේ සාධක නොවීම

කම්කරුගේ කුලිය මෙලොවෙහි විනාශ වුවත්, පරලොව දිනයෙහි එය අල්ලාහ්ගෙන් විනාශ නොවන්නේය. පරලොව දිනයේදී අසාධාරණයට ලක්වූ තැනැත්තාගේ කුලිය අනිසි ලෙස අනුභව කළ අපරාධකරුවා පැමිණේ. පසුව ඔහුගේ කුසලින් රැගෙන ඔහුගෙන් අනීතියට ලක්වූ තැනැත්තාට ලබා දෙනු ලැබේ. එසේ ලබා දීමෙන් ඔහුගේ කුසල් අවසන් වූයේනම්, අසාධාරණයට භාජනවූ තැනැත්තාගේ අකුසලින් රැගෙන අපරාධකරුවා මත හි පටවනු ලැබේ. පසුව ඔහුව ඔසවා නරකාදියෙහි විසිකරනු ලැබේ.

## 2-කුලිය අඩුකර ගෙවීම

කම්කරුවාට ඔහුගේ කුලිය සම්පූර්ණයෙන් නොගෙවා අඩුකර ගෙවීම. ‘මිණුම් කිරුම්වල වංචා කරන්නන්ට විප තකි’ (83:1) යනුවෙන් අල්ලාහ් පවසන්නේය. සමහර ස්වාමි වරු යම්කිසි නියමිත වැටුපකට ගිවිසගෙන පිට රටවලින් කම්කරුවන් ගෙන්වා, ඔවුන් සේවයෙහි බැඳුන පසු ගිවිසුම වෙනස් කරමින් වැටුප අඩුකර ගෙවති. එවිට ඔවුන් ඉතා පිළිකුල් භාවයෙන්, අසතුටෙන් ඔවුන්ගේ වැඩ කටයුතුවල යෙදෙති. ඔවුන් තම අයිතිවාසිකම පිළිබඳව ස්වාමිවරුන්ගේ අවධානයට යොමුකොට එය ලබා ගැනීමට නොහැකිවී, ඒ කෙරෙහි අල්ලාහ් වෙත පැමිණිළි කරති. අසාධාරනය කරන එම ස්වාමිවරුන් මුස්ලිම්වී ඔවුන් යටතේ සේවය කරන කම් කරුවන් මුස්ලිම් නොවන්නන් වූයේනම්, ස්වාමිවරුන්ගේ මෙවන් ක්‍රියාමාර්ග කම්කරුවන් අල්ලාහ්ගේ යහපත් මගට යොමුවීම වළක්වයි. ඔවුන් පායයෙහිම නිරතවී සිටිති.

## 3-අතිකාල දීමනාවකින් තොරව අධික වැඩ දීම හෝ වැඩ කාලය දීර්ග කිරීම

ගිවිසුමට පටහැනිව කම්කරුවන්ට අධික වැඩ දීම හෝ නියමිත වේලාවට වඩා වැඩ කාලය දීර්ඝ කිරීම තහනම්ය. නමුත්, ඒ වෙනුවෙන් නියමිත වැටුපට වඩා අතිකාල දීමනා වක් ගෙවන්නේනම්, ප්‍රශ්නයක් නොවන්නේය.

# 4-වැටුප් ගෙවීම ප්‍රමාද කිරීම

කම්කරුවන්, ඔවුන්ට අදාල වැටුප දැඩි වෙහෙස දරමින් ඉල්ලා බල කිරීම හා උසාවිය යාම යනාදි ස්ථාවරයෙන් පසු ඔවුන්ට ලැබෙන්නේය. ස්වාමිවරුන් මෙසේ කම්කරුවන්ගේ වැටුප ප්‍රමාදකිරීමේ අරමුණ ඔවුන් අසරණයට පත් කිරිමකි. (ඔවුන් මෙනිසා තම අයිතිවාසිකම හෝ තම වැටුප අයැදීම සැළකිල්ලට නොගනිති) නොඑසේ නම්, ස්වාමිවරුන් කම් කරුවන්ගේ වැටුප තම මූලධනයෙහි යොදවා එමගින් තම ආර්ථිකය වර්ධනය කරවා ගැනීමකි. සමහර ස්වාමිවරුන් එම වැටුප් මුදල පොලියට ලබා දෙති. මෙනිසා කම්කරුවන් තම ආහාර පානයන් සඳහාද, කවර හේතුන් මත තම මව් බිම හා ඥාතීන් අතහැර මෙහි පැමිණියේද, එවන් සිය දරු පවුල් ඥාතීන්ගේ ජීවනෝපාය සහ හියවියදම් සඳහා පවා මුදල් යැවීමට මාර්ගයක් නොමැතිව සේවා ස්ථානයේ ජීවි තය ගත කරති. මෙවැනි අරාජිත ස්වාමිවරුන්ට පරලොව දිනයේ අල්ලාහ්ගෙන් ඉමහත් දඬුවම් ලැබේ. මේ පිළිබඳව අල්ලාහ් පවසන බව නබිනායක තුමා පැවැසූ වදනක් අබූ හූරෙරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

පරලොව දිනයෙහි මම තුන් දෙනෙකුට විරුද්ධව සටන් කරන්නෙකු ලෙසට සිටිමි. ඔවුහු, (ව්‍යාජ දෙයක්) මාගේ නමින් (කෙනෙකුට) ලබාදී (එමගින්) රවටන්නා, නිදහස් පුද්ගලයෙකුව විකුණා එය අනුභව

කරන්නා සහ කෙනෙ කුව කුලියට පත්කර, ඔහුගෙන් වැඩ ලබාගත් පසු ඔහුගේ කුලිය ඔහුට නොගෙවන්නා යන්නන්ය. (ග්‍රන්ථය : බුහාරි)

# දරුවන්ට තෑගිබෝග සමව නොදීම

සමාජයෙහි සමහර මිනිසුන් තමන්ගේ සමහර දරුවන්ට පමණක් තෑගි බෝග ලබා දීමට අදහස් කරති. විද්වතුන්ගේ නිවැරදි මතය අනුව ආගමානුකූල හේතුවෙන් තොරව එසේ කිරීම හරාම් හෙවත් තහනම්ය. එවන් හේතූන් මත සමහර දරුවන්ගේ අවශ්‍යතාවන් පමණක් ඉටුකළ හැක. තම දරු වන් අතර ලෙඩවී සිටින හෝ ණයට පත්වී සිටින හෝ අල් කුර්ආනය කට පාඩම් කිරීම සඳහා වියදම් කිරීමට අවශ්‍යවී සිටින හෝ රැකියා විරහිතව සිටින හෝ විශාල පවුලක්වී සිටින හෝ ඉගැනීමේ කටයුතුවල යෙදී සිටින හෝ මෙවන් දරුවන්ගේ අවශ්‍යතාවන් ඉටුකිරීම සඳහා ඉදිරිපත්වී වියදම් කිරීම මෙයට උදාහරණ වේ. නමුදු, මෙවන් ආගම අනුමත අවශ්‍යතාවයට ලක්වූ එක් දරුවෙකුට තමා වියදම් කරන සේ, අනෙක් දරුවන්ට මෙවන් අවශ්‍යතාවයන් ඇතිවූ කළ එසේම වියදම් කරන බව පියා අධිෂ්ඨානය කළ යුතුයි. මේ සැමට පොදු සාධකයක් ලෙස අල්ලාහ් මෙසේ පවසන්නේය.

*ඔබලා නීතිය ඉටු කරන්න. එය බියබැතිකමට ඉතාමත් සමීපයකි. අල්ලාහ් ගැන බියබැතිකමෙන් සිටින්න. (අල් කුර්ආන්-5:8)*

මෙම කරුණ කෙරෙහි සාධකයක් වශයෙන් නබිනායක මුහම්මදු (සල්) තුමාගේ වදනක් නුඃමාන් බින් බෂීර් (රළි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

තම පියා තමාව නබිනායක මුහම්මදු (සල්) තුමා වෙත කැඳවාගෙන ගොස් 'මම මාගේ මෙම පුත්‍රයාට වහලෙකු තෑග්ගක් ලෙස ලබා දුනිමි' යනුවෙන් කීය. එවිට නබිතුමා 'ඔබ ඔබගේ සියළුම දරුවන්ටම මෙවන් තෑගි ලබාදී ඇත් තේද ?' යනුවෙන් විමසීය. 'එසේ ලබා නොදුන්' බව මාගේ පියා පැවැසූ විට එතුමා 'එසේනම්, එම තෑග්ග ඔබ නැවත ලබා ගන්න' යනුවෙන් පැවැසීය. (ග්‍රන්ථය : බුහාරි)

වෙනත් වාර්තාවන්හි නබිනායක තුමා ප්‍රකාශ කළ බව මෙසේද සඳහන්වේ.

අල්ලාහ් ගැන බියබැතිකමින් සිටින්න. ඔබගේ දරුවන් අතර නීතිය ඉටු කරන්න. (පසුව ඔහු තමා පිරිනැමූ එම තෑග්ග නැවත ලබා ගත්තේය) (ග්‍රන්ථය : මුස්ලිම්)

එසේ නම්, මාව එයට සාක්ෂි ලෙසට පත් නොකරන්න. අනීතියට මම සාක්ෂි නොදරමි. (ග්‍රන්ථය : මුස්ලිම්)

ඉමාම් අහ්මද් (රහ්) තුමා 'දෙවැනි උරුමකම් සඳහා සම් පත් බෙදා දෙනු සේ පිරිමියෙකුට ස්ත්‍රීන්

දෙදෙනෙකුට ලබා දෙන ප්‍රමාණයක් ලබා දිය යුතුයි’ යනුවෙන් තම මතය පළ කරයි.

සමහර පවුල්වල පියවරුන් අල්ලාහ් කෙරෙහි බියබැති කමින් නොසිටින බව පෙනේ. ඔවුහූ තම සමහර දරුවන්ට පමණක් තැගිබෝග ලබාදී දරුවන් අතර වෙනස්කම් පෙන් වති. මෙයින් දරුවන්ගේ සිත්සතන්හි එක්එක්කෙනා ගැන ඊර්ෂියා ඇතිවන්නේය. ඔවුන් අතර අමනාප හා විරුද්ධකම් බෝවන්නේය. සමහර පියවරුන් තම දරුවන් අතර (තමා ගේ හෝ) තම සහෝදරයන්ගේ හැඩයෙන් යුත් දරුවාට තැගිබෝග ලබාදී, වෙනත් (බිරිඳගේ සහෝදරයන්ගේ හෝ) හැඩයෙන් යුත් දරුවාට තැගි බෝග ලබා දීමෙන් වැළකී සිටිති. නැතිනම් තම එක් බිරිඳකුගේ දරුවන්ට පමණක් ලබාදී අනෙක් බිරිඳගේ දරුවන්ට ලබාදීමෙන් වැළකී සිටිති. සමහරවිට බිරිඳන් දෙදෙනාගෙන් එක් බිරියකගේ දරුවන් පමණක් ප්‍රසිද්ධ විදුහලකට ඇතුලත් කරති. ඔහුගේ මෙවන් අයුක්ති සහගත ක්‍රියා මාර්ග අනාගතයේදි ඔහුටම ඉමහත් බාධාවක් ලෙස පවතී.

බොහෝ අවස්ථාවල මෙවන් දරුවන් ඉදිරියේදී තම පිය වරුන්ට උපකාර නොකරති. තම දරුවන් අතර තැගිබෝග බෙදා දීමේදී වෙනස්කම් පෙන්වන මෙවන් පියවරුන් අමතා නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් නුහ්මාන් බින් බෂීර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

ඔවුන් (දරුවන්) ඔබට උපකාර කිරීමෙහි සමානව සිටීම ඔබට සතුට ගෙන නොදෙන්නේද ? (ග්‍රන්ථය : අහ්මද්)

# අවශ්‍යතාවයෙන් තොරව අත පෑම

නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් සහ්ල් බින් හන්ළලා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

'කවරෙක් තමාට අවශ්‍ය ප්‍රමාණයක් තමා සතුව තිබියදී, අන් අයගෙන් අත පා සිටින්නේද, ඔහු වැඩිකර ගන්නේ ගිනි අඟුරුමවේ' යනුවෙන් නබිතුමා පැවැසූවිට, (එතුමාගේ ශ්‍රාවකරුවන්) අල්ලාහ්ගේ දූතයාණෙනි, අන් අයගෙන් අත පා නොසිටීමට අයත් ප්‍රමාණය කුමක්ද ? යනුවෙන් විමසූහ. එකළ නබිතුමා 'එක් දහවලකට හා එක් රාත්‍රියකට අනු භව කිරීමට අවශ්‍ය ප්‍රමාණයක් තිබීමකි' යනුවෙන් ප්‍රකාශ කළේය. (ග්‍රන්ථය : අබුදාවූද්)

එසේම, නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් ඉබ්නු මස්ඌද් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙක් තමාට අවශ්‍ය ප්‍රමාණයක් (තම සතුව) තිබියදී අන් අයගෙන් අත පා සිටින්නේද, ඔහු පරලොව දිනයෙහි දරුණු අවලක්ෂණ මුහුණෙන් පැමිණේ. (ග්‍රන්ථය : අහ්මද්)

සමහරු දේවස්ථානයෙහි මිනිසුන් තස්බීහ් (අල්ලාහ්ව යාඥා) කිරීමට බාධාවක් ලෙස ඔවුන් ඉදිරියෙහි සිටගෙන තමන්ගේ ප්‍රශ්න හා දුක්ගැනවිලි ගැන පවසා සිටිති. තවත් සමහරු ව්‍යාජ තොරතුරු සහිත ලිපි ලේඛණ හා ලියකිවිලි සකස්කර තබාගෙන ව්‍යාජ කරුණු ඉදිරිපත් කරති. සමහර අවස්ථාවල සිඟමන් කිරීම සඳහා පවුලේ සාමාජිකයන් එක් එක් දේවස්ථාන කරා යවති. පසුව ඔවුන් එකතුවී (ලැබුණු දෙය රැස්කර ගෙන පසුව) වෙනත් දේවස්ථාන කරා පිටත් වෙති. මෙවැනි පිරිස් අල්ලාහ් පමණක් දැන සිටින තරමට පොහොසත්ව සිටිති. ඔවුන් මියගිය පසු ඔවුන් එක්රැස් කළ සම්පත් ඔවුන්ගේ පෙහොසත්කම ප්‍රසිද්ධ කරයි.

මෙවැන්නන් හැර යථාර්ථයෙන්ම අවශ්‍ය වුවන්ද සිටිති. ඔවුන්ගේ බැගෑපත්කම දකින්නන් ඔවුන් පොහොසත්ක මින් සිටින බව සිතති. ඔවුහු මිනිසුන්ගෙන් අත පා අයැද නොසිටිති. මෙවැන්නන්ගේ දිළිඳුකම හා තත්ත්වය පිළිබඳව කවරෙකු හෝ අවධානය නොකරන අතර, ඔවුන්ට කිසියම් දානයක් හෝ උපකාරයක් හෝ ලබා නොදෙති.

# නොගෙවීමේ අරමුණින් ණය ඉල්ලීම

අල්ලාහ් වෙත මිනිසුන්ගේ අයිතිවාසිකම ඉමහත් ස්ථාන යකින් පවතී. මිනිසා අල්ලාහ්ගේ අයිතිවාසිකමක් පැහැර හැරියේනම්, පාපොච්චාරණය කිරීම එයට ප්‍රතිකාරයක් බව පිළිගනු ලැබේ. නමුත් මිනිසා වෙනත් මිනිසෙකුගේ අයිති වාසිකමක් පැහැර හැරියේ නම්, දිර්හම් හා දීනාර් මගින් තොරව කුසල් හා අකුසල් මගින් විනිශ්චය කෙරනු ලබන (පරලොව) දිනය පැමිණීමට පෙර ඔහු එම අයතිවාසිකම ඔහුට ඉටුකරන තෙක් ඔහුට එයින් නිදහස්විය නොහැක.

*සැබැවින්ම, සියලු අයිතිවාසිකම් එහි හිමිකරුවන්ට ඉටු කරන ලෙස අල්ලාහ් ඔබලාට අණ කරයි. (අල්කුර්ආන්-4:58)*

අද සමාජයෙහි ණය ඉල්ලා අත පෑම සාමාන්‍ය කරුණක් ලෙසට සිතීම ව්‍යාප්තව පවතී. සමහර මිනිසුන් අනිවාර්ය අවශ්‍යතාවයන් සඳහා ණය නොගන්නා අතර, ඔවුන් වාහන හා නිවෙස් භාණ්ඩ යනාදී විනාශවන දේ අලුත් වැඩියාකර අන් අය සේ අමතර පහසුකමින් සිය ජීවිතය ගත කිරීමේ ආශාවෙන් ණය ලබා ගනිති. සමහර මිනිසුන් නිදහස්වීමට නොහැකිව සිටින තහනම් හෝ සැක සහිත වාරික ගෙවීම් ක්‍රමයෙන් සමන්විත වෙළඳ කටයුතුවල පිවිසෙති.

ණය පහසුකම් ලබා ගැනීමේදී නොසැළකිලිමත් වීම එය නැවත ගෙවීමේදී අයුක්ති සහගතව හැසිරීමට හා කල් දැමී මට හෝ අන් අයගේ සම්පත් විනාශ කිරමට ඉඩ සැළසේ. නබි (සල්) තුමා මෙකී අවසානය ගැන අවවාද කර පැවැසූ වදනක් අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙක් හෝ ආපසු දීමේ අරමුණින් මිනිසුන්ගෙන් සම් පතක් ලබා ගත්තේනම්, අල්ලාහ් එය ඔහුට එසේම ඉටුකර දෙයි. කවරෙකු හෝ (නැවත නොදී ඔහුගේ සම්පත) විනාශ කිරීමේ අරමුණින් සම්පතක් මිනිසුන්ගෙන් ලබා ගත්තේ නම්, අල්ලාහ් ඔහුව විනාශ කරයි. (ග්‍රන්ථය : බුහාරි)

මිනිසුන් ණය ලබා ගැනීමේ කරුණ කෙරෙහි වැඩි සැළ කිල්ලක් නොදක්වන අතර, එයට වැදගත්කමක්ද නොදී අල්ප ලෙසට සිතති. එනමුත්, එය අල්ලාහ් වෙත ඉමහත් වැදගත් කරුණකි. (අල්ලාහ් වෙනුවෙන්) සිය දිවිය පුදකළ තැනැත්තාට ඉමහත් භාග්‍ය, විශාල කුලිය හා උතුම් තරා තිරම් යනාදීන් ඇතත්, ඔහුටද ණය නොගෙවූ වරදෙන් මිදී මට නොහැක. මෙයට සාධකයක් ලෙස නබිනායක මුහම් මදු (සල්) තුමා ප්‍රකාශ කළ වදනක් මුහම්මදු බින් ජහ්ෂ් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

අල්ලාහ් පරිශුද්ධ වන්තයාය. අල්ලාහ් ණය ලබාගැනීමේ කරුණු කෙරෙහි කුමන තරම් දැඩි අවවාදයක් පහළ කර ඇති බව දන්නේද ? මාගේ

ප්‍රාණය කවරෙකුගේ අතෙහි ඇත්තේද, එවැනි අල්ලාහ් මත දිවුරා කියමි. පුද්ගලයෙකු අල්ලාහ්ගේ මාර්ගයෙහි ඝාතනය කරනු ලබයි. පසුව ඔහුට (අල්ලාහ්) පණ දෙයි. (පසුවද,) ඔහු නැවත (අල්ලාහ්ගේ මාර්ගයෙහි) ඝාතනය කරවනු ලබයි. එසේ වුවද, ඔහු කව රෙකුට හෝ ණයක් ගෙවීමට ඇත්නම්, එය ගෙවන තෙක් ඔහුට ස්වර්ගයට පිවිසිය නොහැක. (ග්‍රන්ථය : නසාඉ)

මෙයට පසුව හෝ ණයක් ලබා ගැනීම සහ නොගෙවීම කෙරෙහි නොසැළකිලිමත්ව සිටින්නන් යහපත් භාවයට පැමිණෙන්නේද ?

# තහනම් දේ අනුභව කිරීම

තමාව මැවූ අල්ලාහ් කෙරෙහි බියකමක් නොමැති පුද් ගලයන් තමන් කෙසේ සම්පත් උපයා ගන්නේද ? කුමන කාර්යයන්හි ඒවා වියදම් කරන්නේද ? යන්නෙහි කිසියම් සැලකිල්ලක් හෝ නොදක්වති. එනමුත්, ඒවා සොරකමින් හෝ අල්ලසින් හෝ උදුරා ගැනීමෙන් හෝ වංචා කිරීමෙන් හෝ තහනම් වෙළඳාමෙන් හෝ පොලියෙන් හෝ අනාථ යන්ගේ සම්පත් අනුභව කිරීමෙන් හෝ නිමිති බැලීම, නපුරු ක්‍රියාවන් හා සංගීත යනාදීන් මගින් හෝ මිනිසුන් සඳහා පිහිටුවන ලද බයිතුල් මාල් හෙවත් පොදු අර මුදල අනිසි ලෙස පරිහරණය කිරීමෙන් හෝ අන් අය දුෂ්කරතා වයට පත් කිරීමෙන් හෝ අවශ්‍යතාවයෙන්

තොරව සිගමන් කිරීමෙන් හෝ මෙවැනි වෙනත් මාර්ග මගින් හෝ වේවා උපයාගෙන ඒවා ආරක්‍ෂා කිරීමෙහි ඔහු උනන්දුවෙන් හා සැළකිල්ලෙන් සිටී.

පසුව, ඔහු ඒවා තම ආහාර පානයන්, ඇඳුම් පැළඳුම්, යාන වාහන මිළදී ගැනීම, නිවෙස් ඉදිකිරීම හෝ කුලියට ගැනීම හා නිවෙස් උපකරණ මිළදී ගැනීම යනාදී කරුණු සඳහා වියදම් කරයි. මෙසේ ඔහු තහනම් දේ මගින් තම කුසය පුරවයි. මේ ගැන නබි මුහමම්දු (සල්) තුමා පැවැසූ වදනක් කඃබ් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

අනිසි මාර්ගයෙ (උපයාගත් දේ මගි)න් වර්ධනයවූ සෑම මාංශයට සුදුසුම ස්ථානය අපායවේ. (ග්‍රන්ථය : තබරානී)

පරලොව දිනයෙහි මිනිසුන්ගෙන් තම සම්පත් කෙසේ උපයා ගත්තේද ?, ඒවා කුමන අන්දමට වියදම් කළේද ? යනුවෙන් ප්‍රශ්න කරනු ලැබේ. මිනිසුන්ට අධික විනාශය හා අලාභය සිදුවන්නේ මෙවන් මොහොතේය. එනිසා, කව රෙකු සතුව තහනම් සම්පත් හෝ මුදල් තිබේද, ඔහු එයින් නිදහස්වීමට ඉක්මන්විය යුතුයි. එය යම් මිනිසෙකුට අයත් දෙයක්නම්, දිර්හම් හා දීනාරයෙන් තොර කුසල් හා අකු සල් මගින් විනිශ්චය කරනු ලබන (පරලොව) දිනය පැමිණී මට පෙර ඒ වෙනුවෙන් ඔහුගෙන් සමාව අයැදී, ඒවා ඔහු වෙත නැවත භාරදීමට ඉක්මන්විය යුතුයි.

# මත්පැන් පානය කිරීම

බිඳක් හෝ වේවා මත්පැන් පානය කිරීම. තහනම් වේ. අල්ලාහ් මේ පිළිබඳව මෙසේ පවසන්නේය.

*විශ්වාස වන්තයිනි, මත්පැන් පැනය කිරීම, සූදු කෙළීම, පිළිම් වන්දනාමානය කිරීම හා ර්තලය යවා නිමිති බැලීම යනාදීන් සාතාන්ගේ පිළිකුල් කළ යුතු කාර්යයන්ය. එනිසා ඔබලා මේවායින් වැළකී සිටින්න. (එමගින්) ඔබලා ජයග්‍රහ ණය කළ හැක. (අල්කුර්ආන්-5:90)*

මත්පැන් පානය කිරීමෙන් වැළකී සිටින මෙන් මෙම වද නෙහි අණ කිරීම එය තහනම් දෙයක් ලෙස වීමට බලවත් සාධකයකි. අල්ලාහ් මත්පැන් පානය කිරීම, කාෆිර්වරුන් ගේ දෙවියන්වූ පිළිමයන් සමග සම්බන්ධකර පවසන්නේය. 'අල්ලාහ් තහනම් බව පවසා නොමැත. නමුත්, ඔහු පවසා ඇත්තේ වළක්වා සිටින්න යනුවෙනි' යැයි තර්ක විතර්ක කරන්නන්ට කිසිඳු සාධකයක් හෝ නොමැත.

මත්පැන් පානය කිරීම පිළිබඳව නබි නායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ වදනක් ජාබිර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

මද්‍යපාන ද්‍රව්‍යයන් පානය කරන්නාට අල්ලාහ් (පරලොව දිනයෙහි) තීනතුල් හබාල් පොවන බවට ගිවිස ගෙන සිටී' යනුවෙන් නබිතුමා පැවැසූ කළ (එතුමාගේ අනුගාමිකයන්) තීනතුල් හබාල් යනු

කුමක්ද ? යනුවෙන් විමසූහ. එකල එතුමා 'එය අපායවාසීන්ගේ දහඩිය හෝ සැරව' යනුවෙන් පැවැසීය. (ග්‍රන්ථය : මුස්ලිම්)

නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව ඉබ්නු අබ්බාස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙක් (අඛණ්ඩව) මත්පැන් පානය කරමින් සිටිනවිට නැසී ගියේද, ඔහු පිලිමයන්ට වන්දනාමානය කරන්නෙකු ලෙස සැළකේ. (ග්‍රන්ථය : තබරානී)

අද නවීනතම මෙම යුගයේ මත්පැන් හා මද්‍යපාන ද්‍රව්‍ය විවිධ වර්ගයෙන් ව්‍යාප්තව පවතී. ඒවා රා, අරක්කු, බියර්, විස්කි, බ්‍රැන්ඩි සහ මෙවැනි වෙනත් මත්පැන් වර්ග විවිධ භාෂාවෙන් යුත් විවිධ නම්වලින් පරිහරණය කෙරේ. මෙම සමාජයෙහි මත්පැන්වලට නවීනතම නම්කරන අය බිහිවී ඇති බව සඳහන් කරමින් නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් අබූ මාලික් අල් අෂ්අරී (රලි) තුමා මෙලෙස වාර්තා කරන්නේය.

මාගේ සමාජයේ මත්පැන් පානය කරන මිනිසුන් එයට වෙනත් නම් කියති. (ග්‍රන්ථය : අබූදාවූද්)

මිනිසුන් වංචනිකව මත්පැන්වලට පණ පොවන පානය යනුවෙන් නම් කරති. අල්ලාහ් මේ පිළිබඳව අල්කුර්ආනයේ මෙසේ පවසන්නේය.

*ඔවුහු අල්ලාහ්ට සහ විශ්වාස වන්නයින්ට වංචා කරන් නෝය. නමුදු (නියතව) ඔවුහු තම තමන්ටම*

*වංචා කර ගත් නෝය. එය ඔවුන් නොහැඟෙන්නෝය. (අල්කුර්ආන්-2:9)*

විවිධ කලබල සහ ප්‍රශ්න මතු කරන මෙවන් දෙය සහ මුලින්ම නැතිකර දෙමීම සඳහා ඉස්ලාමය දැඩි නීතිරීතීන් පනවා ඇත. නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව ඉබ්නු උමර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

සෑම මත් ද්‍රව්‍යම මත්පැන්ය. සෑම මත් ද්‍රව්‍යම තහනම්ය. (ග්‍රන්ථය : මුස්ලිම්)

සිහි බුද්ධිය අවුල්කර මත් ගතිය ඇතිකරන සෑම දේ එය ස්වල්ප හෝ අධික හෝ වේවා හරාම් හෙවත් තහනම්ය. ඒවා විවිධ නම් හා වර්ගවලින් වුවද ඒවා සියල්ලම හඳුන් වන්නේ මත්පැන් යන එකම නමකිනි. එයට අදාල නීති රීතීන්ද ප්‍රසිද්ධයකි.

අවසාන වශයෙන්, නබිනායක මුහම්මදු (සල්) තුමා මත් පැන් පානය කරන්නන්ට කළ දේශනාවක් අබ්දුල්ලාහ් බින් උමර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙක් හෝ මත්පැන් පානයකර, මත්වූයේනම්, ඔහු ගේ දින හතලිහක සලාතයන් පිළිගනු නොලැබේ. ඔහු නැසී ගියේනම්, නරකාදියෙහි පිවිසේ. ඔහු පාපොච්චාරනය කළේනම්, අල්ලාහ් එය පිළිගනී. ඔහු නැවත පානයකර මත්වූයේ නම්, ඔහුගේ දින හතලිහක උදෑසන සලාතයන් පිළිගනු නොලැබේ. ඔහු නැසීගියේ නම්, නරකාදියෙහි පිවිසේ. ඔහු

පාපොච්චාරනය කළේනම්, අල්ලාහ් එය පිළි ගනී. ඔහු නැවත පානයකර මත්වූයේ නම්, ඔහුගේ දින හතලිහක සලාතයන් පිළිගනු නොලැබේ. ඔහු නැසීගියේ නම්, නරකාදියෙහි පිවිසේ. ඔහු පාපොච්චාරනය කළේ නම්, අල්ලාහ් එය පිළිගනී. ඔහු නැවත පානය කළේනම්, ඔහුගේ දින හතලිහක සලාතයන් පිළිගනු නොලැබේ. ඔහු පාපොච්චාරනය කළේනම්, අල්ලාහ් එය පිළිගනී. ඔහු නැවත පානය කළේනම්, ඔහුට පරලොව දිනයේ 'රකදතුල් හබාල්' යන පානය පොවන බව අල්ලාහ් තමාහටම අනි වාර්ය කරයි. (යනුවෙන් නබිතුමා පැවැසූ කළ එතුමාගේ සහාබාවරුන්) අල්ලාහ්ගේ දූතයාණෙනි, රකදතුල් හබාල් යනු කුමක්ද ? යනුවෙන් විමසූහ. එකළ නබිනායක තුමා එය 'අපායවාසීන්ගේ සැරව' යනුවෙන් පැවැසීය. (ග්‍රන්ථය : ඉබ්නු මාජා)

මත්පැන් පානය කරන්නන්ගේ තත්ත්වය මෙසේනම්, මෙයට වඩා දරුණු මත් ද්‍රව්‍යයන් පාවිච්චි කරන්නන්ගේ තත්ත්වය කෙසේ පවතීද ?

# රත්රන් හා රිදී භාජන පරිහරණය කිරීම

අද රත්රන් හෝ රිදී භාණ්ඩ හෝ එමගින් ආලේප කරන ලද ගෘහ භාණ්ඩ හා භාජන අලවි නොකරන කිසිදු වෙළඳ සැලක් හෝ නොමැති තරමට ඒවා

බහුලව පවතී. එසේම ධනවතුන්ගේ නිවෙස්වල සහ විවිධ හෝටල්වල මෙවැනි භාණ්ඩ පරිහරණය කරනු ලබන්නේය. එපමණක් නොව, සමහර උත්සවවලට සහභාගිවන මිනිසුන් අන් අයට පිරි නමන වටිනා තෑගි ලෙසද මේවා පවතී.

සමහර මිනිසුන් තම නිවෙස්වල මෙවැනි භාජන පරිහ රණය නොකරන අතර, පිටස්තර මිනිසුන්ගේ නිවෙස්වල සහ එහි පවතින වලීමා (විවාහය) වැනි උත්සවවල එවන් භාජන පරිහරණය කරති. මේවා සියල්ල ඉස්ලාම් ධර්මයේ නීතිරීතීන් අනුව තහනම්ය. මෙවැනි භාජන පරිහරණය කිරීම කෙරෙහි නබිනායක මුහම්මදු (සල්) තුමාණන් දැඩි ලෙස අවවාද කර ප්‍රකාශ කළ වදනක් උම්මු සලමා (රලි) තුමිය මෙසේ වාර්තා කරන්නීය.

කවරෙක් රත්රන් හෝ රිදී භාජනයෙහි අනුභව කරන් නේද හෝ පානය කරන්නේද ඔහු නියත වශයෙන්ම, සිය කුසතුල ඇතුල් කරන්නේ නරකාදියෙහි ගින්නවේ. (ග්‍රන් ථය : මුස්ලිම්)

මෙම නීති රීතීන් රත්රන් හෝ රිදීවලින් යුත් පිඟාන, හැඳි, කටු හැඳි, පිහි, අමුත්තන් වෙනුවෙන් පරිහරණය කරන භාජන, නව මනාල මනාලියන්ට කරන රසකැවිලි සංග්‍රහය සඳහා පරිහරණය කරන බන්දේසි හා මෙවන් භාජනවලටද බලපාන්නේය. සමහරුන් 'අපි රත්රන් හෝ රිදී භාණ්ඩ පරිහරණය නොකරකන්නෙමු. එනමුත්, මේවා කණ්නාඩි අලුමාරිවල ප්‍රදර්ශනය සඳහා

අපි තබා ඇත්තෙමු' යනුවෙන් පවසති. මෙයද තහනම්ය. මන්දයත්, මෙය ඒවා පරිහරණය කිරීමේ මාර්ගයට මග පෙන්වීමට හැක.

# බොරු සාක්ෂි කීම

ඉස්ලාම් ධර්මය බොරු සාක්ෂි කීම තහනම් කරයි. මේ ගැන අල්ලාහ් මෙසේ පවසන්නේය.

*එනිසා, ඔබලා පිලිමයන්ගේ කිලිටුවෙන් වැළකී සිටින්න. එසේම, බොරු කීමෙන්ද වැළකී සිටින්න. ඔහුට කිසියම් දෙයක් ආදේශ නොකොට අල්ලාහ්ට මුළුමනින්ම ඇලවී සිටින්න. (අල්කුර්ආන්-22:30,31)*

අබ්දුල් රහ්මාන් බින් අබූ බකරත් (රලි) තම පියාගෙන් සවන්දුන් වදනක් මෙසේ පවසන්නේය.

අපි නබිනායක මුහම්මදු (සල්) තුමා සමග සිටීමු. එවිට එතුමා 'පාපයන් අතර ඉමහත් පාපය කුමක් බව ඔබලාට දැනුම් දෙන්නද ? (යනුවෙන් තුන් වරක් විමසීය) එනම්, ඒවා අල්ලාහ්ට ආදේශ කිරීම සහ දෙමාපියන්හට නින්දා කිරීම යනුවෙන් පවසා මදක් හාන්සිවී අසුන් ගත්තේය. පසුව අපි එතුමා නිශ්ශබ්ද නොවෙයිද ? යනුවෙන් සිතන තරමට 'බොරු සාක්ෂි කීම' යනුවෙන් නැවත නැවත පැවැසීය. (ග්‍රන්ථය : බුහාරි)

මිනිසුන් බොරු සාක්ෂි කීම කෙරෙහි නොසැලකිලිමත්ව සිටීම, එය කරා පොළඹවන ඊර්ෂ්‍යාව

සහ සතුරුකම අධික හේතුවීම හා එමගින් සමාජයෙහි විවිධ ප්‍රශ්න ඇතිවීම හෙයින් මෙහි ඒ පිළිබඳව නැවත නැවත අවවාදකර ඇත. බොරු සාක්ෂි කීමෙන් අයිතිවාසිකම් කොපමණ නැතිවත් නේද ? නිවැරදිකරුවන් කීප දෙනෙක් මෙය හේතුවෙන් අප රාධයට ලක්වන්නේද ? කීප දෙනෙක් උරුමකම් නොමැති දේට අයිතිවාසිකම් ලබන්නේද ? ඥාතිත්වය නොමැති කීප දෙනෙක් මෙමගින් ඥාතිත්වයට පත්වන්නේද ?

මිනිසුන් නොසැලකිලිමත්ව සිටින කරුණු අතර, පුද්ගල යෙකු උසාවියෙහි දකින පුද්ගලයෙකුව අමතා 'ඔබ මාහට සාක්ෂි දරන්න. මම ඔබ හට සාක්ෂි දරන්නෙමි' යැයි කීමද එකකි. උසාවියෙහි හැර වෙනත් කිසිදු තැනක හෝ නුදුටු ඔහු යථාර්තය හා ස්ථාවරය අනිවාර්යයෙන් දැන සිටිය යුතු කරුණක් කෙරෙහි (නොදැනුවත්ව) සාක්ෂි කියයි. ඔහු මේ පුද්ගලයා අදාල ඉඩමක අයිතිකාරයා ලෙස හෝ නිවසක අයිතිකාරයා ලෙස හෝ නිවැරදි කාරයා ලෙස හෝ සාක්ෂි කීම මෙයට නිදසුනකි. මෙය අමූලික බොරුවක් හා ප්‍රෝඩා වකි. එබැවින්, සාක්ෂි කීම අල්කුර්ආනය පවසන පරිදි සිදු විය යුතුයි. මේ පිළිබඳව අල්ලාහ් අල්කුර්ආනයෙහි මෙසේ පවසන්නේය.

*තවද, අපි දැන සිටින දේ හැර (වෙනත් කිසියම් දෙයක් හෝ) සාක්ෂි නොකියමු. (අල්කුර්ආන්-112:81)*

# තූර්යවාදනය හා සංගීතයට සවන්දීම

පහත සඳහන් අල්ලාහ්ගේ වැකියෙන් හැඳින්වන්නේ ගායනාව බව ඉබ්නු මස්ඌද් (රලි) තුමා අල්ලාහ් මත දිවුරා පවසන්නේය.

*(මිනිසුන්) අල්ලාහ්ගේ මාර්ගයෙන් සිට නොමගට යොමු කිරීම සඳහා (නොදැනුවත්ව) අනවශ්‍ය කතා මිළදී ගන්නා සමහරුන් මිනිසුන් අතර සිටිති. (අල්කුර්ආන්-31:6)*

නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූ ආමිර් (රලි) තුමා සහ අබූ මාලික් අල් අෂ්අරි (රලි) තුමා මෙලෙස වාර්තා කරන්නේය.

මාගේ සමාජයෙහි දුරාචාරය, සේද, මත්පැන් හා සංගීත භාණ්ඩ අනුමත කරන පිරිසක් සිටිති. (ග්‍රන්ථය : බුහාරි)

නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් ඉම්රාන් බින් හුසෛන් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

'මෙම (මාගේ) සමාජයෙහි භූමි කම්පා ඇතිවීම, රූප වෙනස්වීම හා දොස්පද කීම යනාදීන් (පසු කාලයේ) සිදු වේ' යනුවෙන් නබිතුමා පැවැසූ කළ එක් මුස්ලිම් වරයෙකු 'අල්ලාහ්ගේ දූතයාණෙනි, එය කවදා සිදුවේද ?' යනුවෙන් විමසීය. එකළ එතුමා 'නැටුම්

නටන ස්ත්‍රීන්, සංගීත ප්‍රසංග හා මත්පැන් පානය කිරීම ප්‍රසිද්ධවනවිට සිදුවේ' යනුවෙන් පැවැසීය. (ග්‍රන්ථය : තිර්මිදි)

නබිනායක මුහම්මදු (සල්) තුමා බෙර (Drum), වාදනය කිරීම තහනම් කරන අතර, නළාවෙන් (Musical Pipe) පිඹින කළ පිටවන නාදය නපුරු මෝඩයන්ගේ ශබ්දය බවට වර්ණනා කරන්නේය. ඉමාම් අහ්මද් (රහ්) වැනි පැරණි විද්වතුන් කින්නාරම (Lute), මැන්ඩලින් (Mandolin), හා අත්තාලම (Cymbal) යන සංගීත භාණ්ඩයන් තහනම් බව නිගමනය කරති. තවද තත් සහිත තූර්ය භාණ්ඩ (Zither), විනාව (Violin), පියානාව (Piano), ගිතාරය (Guitar) සහ මෙවැනි නවීන පන්නයේ සංගීත භාණ්ඩයන් භාවිතා කිරීමද නබි නායක තුමාගේ වදන අනුව සත්සුදක්සේ තහනම්ය.

නබිනායක තුමා තහනම්කර ඇති පැරණි සංගීත භාණ් ඩවලින් සවන්දීමෙන් ලැබෙන සතුට, වින්දනය සහ මනෝ දර්ශනයට වඩා නවීන පන්නයේ සංගීත භාණ්වලින් අධික සතුට, වින්දනය හා මනෝ දර්ශනය මිනිසුන් ලබති. ඉබ් නුල් කයියූම් වැනි විද්වතුන්ගේ මතය පරිදි මත්පැන් පානය කිරීමෙන් මිනිස් නුවණ කැළඹීමට වඩා සංගීතය රස විඳී මෙන් මිනිස් නුවණ කැළඹීමට පත්වේ.

ගීතය සමග සංගීතයේ වාදනයද, සිත්සතනට වින්දනය හා වශීකරණය ගෙන දෙන නැටුම් නටන ස්ත්‍රීන්ගේ රංග නාදයද එක්වීමෙන් සත්සුදක්සේ එකී

තහනම් භාවය උග්‍ර වේ. අකුසල් භාවය අධිකවේ. ගීතයන්හි වචනවල ආදරය, ප්‍රේමය හා ආලයේ ප්‍රසිද්ධ භාවය හා පෙම්වතියගේ සෞන්දර්ය වර්ණනාව අන්තර්ගතවීම ඉමහත් ඛේදජනක විපතකි. එනිසා විද්වතුන් 'සැබැවින්ම ගීත දුරාචාරය උනන්දු කරයි. එය මිනිස් හදවත්තුල කුහකම හා අවස්ථාවාදය වර්ධනය කරයි' යැයි පවසති. පොදුවෙන් බලනවිට වත්මන් කාලයේ ගීත හා සංගීත ඉමහත් කලහ හා විපතට අදාල කරුණක් ලෙස පවතින බව පෙනේ.

සංගීතයේ විවිධ වර්ග නාදයන් ඔරලෝසු, සීනු, දරුවන් ගේ ක්‍රීඩා භාණ්ඩ, පරිගණක යන්ත්‍ර හා දුරකථන යන්ත්‍ර යනාදියෙහි තුල පවා පිවිසීම අද අධිකව ව්‍යාප්තව පවතින ඛේදජනක කරුණකි. මෙයින් වැළකී සිටීම සඳහා අධික වෙහෙස දැරීමට සිදුවීම අනිවාර්යවූ කරුණක් ලෙස පවතී. අල්ලාහ් සැමට මෙයින් රැකවරණය ලබා දෙන සේක්වා.

# ඕපාදූප කීම

මිනිසුන් රැස්වන සභාවන්හි මිනිසුන් ගැන ඕපාදූප කීම සහ ඔවුන්ගේ නම්බුව පරිහානියට පත් කිරීම අද යුගයේ අධික රසවත් කරුණක් ලෙස පවතින්නේය. මෙය අල්ලාහ් තහනම් කර ඇති අතර, මිනිසුන් එයින් ඈත්වී හා ඉවත්වී සිටින ලෙසද අවවාද කරන්නේය. ඔහු මෙය සිත්සතන පිළි කුල් කරන නින්දිත දෙයකට උපමා කරන්නේය. අල්ලාහ් මේ බව මෙසේ පවසන්නේය.

*ඔබලාගෙන් සමහරුන් තවත් සමහරුන් ගැන ඕපාදූප නොකියන්න. ඔබලාගෙන් කවරෙකු හෝ නැසීගිය තම සහෝදරයාගේ මාංශ අනුභව කිරීමට කැමැති වන්නේද ? එය (අප්‍රියවී) ඔබලා පිළිකුල් කරති. (අල්කුර්ආන්-49:12)*

ඕපාදූප කීම පිළිබඳව නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ වදනක් අබූහුරෛරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

'ඕපාදූප කීම යනු කුමක් බව ඔබලා දැන සිටින්නේද ?' යනුවෙන් නබිනායක තුමා විමසූවිට සහාබාවරු 'එය දැන සිටින්නේ අල්ලාහ් හා ඔහුගේ දූතවරයා පමණී' යනුවෙන් කීහ. එකළ එතුමා 'එය ඔබගේ සහෝදරයා පිළිකුල් කරන දේ ඔබ කීමකි' යනුවෙන් පැවැසීය. එවිට ඔවුහු 'අපි පවසන දේ අප සහෝදරයා හමුවෙහි පවතීනම්, ඒ ගැන ඔබතුමා කුමක් සිතන්නේද?' යනුවෙන් විමසූහ. එයට නබිතුමා 'ඔබ පවසන දේ ඔහු හමුවෙහි පවතීනම්, ඔබ ඔහු ගැන ඕපාදූප කීවෙය. ඒවා ඔහු හමුවෙහි නොපවතීනම්, ඔබ ඔහු ගැන දොස්පද කීවෙය' යනුවෙන් පැවැසීය. (ග්‍රන්ථය : මුස්ලිම්)

ඕපාදූප කීම යනු, පුද්ගලයෙකු හමුවෙහි පවතින ඔහු පිළිකුල් කරන දෙයක්, එය ඔහුගේ ශරීරයේ හෝ ආගමික කරුණුවල හෝ ලෞකික කරුණුවල හෝ ආත්මයෙහි හෝ ගුණාංගයෙහි හෝ සිරිත් විරිත්වල හෝ වේවා එය වෙනත් පුද්ගලයෙකුට ඔබ පැවැසීමකි. මෙසේ කීම විවිධ ආකාර යෙන් පවතී. ඔහුගේ

අඩුපාඩුකම් හෝ ඔහුගේ සිරිත් විරිත් ගැන විහිළුවට කතන්දර කීමද මෙයින් අතර වේ.

ඕපාදූප කීම අල්ලාහ් වෙත පිළිකුල් හඟවන කරුණක් ලෙසට පවතින අතර, මිනිසුන් ඒ ගැන නොසැළකිලිමත්ව සිටිති. නමුත් මෙම කරුණ කෙරෙහි නබිනායක මුහම්මදු (සල්) තුමා මෙසේ පවසන්නේය.

පොලියෙහි දොරටු (වර්ග) හැත්තෑ දෙකක් තිබේ. එකී ඉතා අඩුම තත්ත්වයනම්, මිනිසෙකු සිය මව සමග සංසර්ග යෙහි යෙදීමට සමානකි. එයින් උග්‍රම පොලියනම්, පුද්ගල යෙකු සිය සහෝදරයෙකුගේ නම්බුවට පරිහානිය සිදු කිරී මකි. (ග්‍රන්ථය : සිල්සිලතුස් සහීහා)

සභාවක සිටින්නා එහි සිදුවන පිළිකුල් කරුණු හා තම සහෝදරයෙකු ගැන කියවන ඕපාදූප යනාදීන් වළක්වන්නා ලෙස සිටීම ඔහුට අනිවාර්යවේ. මෙසේ කිරීම කෙරෙහි නබි නායක මුහම්මදු (සල්) තුමා උනන්දුකර පැවැසූ වදනක් අබූදර්දා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙකු තම සහෝදරයාගේ ගෞරවය කෙළසීම වළක් වන්නේද, පරලොව දිනයෙහි අල්ලාහ් ඔහුගේ මුහුණ නර කාදියෙහි විපතෙන් වළක්වයි. (ග්‍රන්ථය : අහ්මද්)

# කේළාම් කීම

සමහරුන් මිනිසුන් අතර කළහ හා ප්‍රශ්න මතු කිරීම සඳහා එක් එක්කෙනා පිළිබඳව කේළාම් කීම වෘත්තියක් වශයෙන් පවත්වාගෙන යති. මෙය මිනිසුන් අතර ක්‍රෝධය හා විරෝධය පතුරුවීමටත්, අන්‍යෝන්‍යභාවය විසන්ධි කිරීම ටත් ඉමහත් හේතුවක් වශයෙන් පවතී. අල්ලාහ් කේළාම් කියන කාර්යයෙහි යෙදෙන්නාට නින්දා කරයි. අල්ලාහ් මේ පිළිබඳව මෙසේ පවසන්නේය.

*අධිකව දිවුරන කිසියම් නින්දිත මිනිසෙකුට හෝ ඔබ කීකරු නොවන්න. (එවන්නා) දොස්පද කියා කේළාම් කියා ගෙන සිටින්නකි. (අල්කුර්ආන්-68:10,11)*

නබිනායක මුහම්මදු (සල්) තුමා 'කේළාම් කියා සිටින් නන් ස්වර්ගයට නොපිවිසේ' යනුවෙන් පැවැසූ බව හුදෛෆා (රලි) තුමා වාර්තා කරන්නේය. (ග්‍රන්ථය : බුහාරි)

එසේම, නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් ඉබ්නු අබ්බාස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

නබිනායක මුහම්මදු (සල්) තුමා මදීනා නගරයෙහි එක් වත්තක් පසුකර ගමන් කරනවිට තමතමන්ගේ මිනීවළෙහි පුද්ගලයන් දෙදෙනෙකගේ වේදනා කරනු ලබන ශබ්දයක් ඇසීය. පසු එතුමා 'ඔවුන් දෙන්නා

වේදනා කරනු ලබන්නේ මහා පාපයන් සඳහා නොවේ' යනුවෙන් පවසා පසුව 'එසේ මයි. ඔවුන් අතර කෙනෙක් මූත්‍රා පහකරනවිට එයින් ප්‍රවේ ශම් නොවී සිටියේය. අනෙකා කේළාම් කියමින් ඇවිද සිටි යේය.....' යනුවෙන් පැවැසීය. (ග්‍රන්ථය : බුහාරි)

සැමියා බිරිඳ ගැන හෝ බිරිඳ සැමියා ගැන හෝ එකිනෙ කාට විරුද්ධව දොස් කියා සිටීම ඔවුන් අතර පවතින සම් බන්ධකම විසන්ධි කිරීමට මගපෙන්වේ. මෙය කේළාම් කීම අතර නින්දිත කරුණකි. එසේම සමහර කම්කරුවන් සම කම්කරුවන්ට හිරිහැර කිරීම සඳහා ඔවුන් ගැන කළමනා කරුට හෝ වගකිව යුත්තන්ට හෝ කේළාම් කියති. මේවා සියල්ල ඉස්ලාම් ධර්මය තහනම් කළ ඒවාය.

# නිවෙස්තුල අනවසරයෙන් එබී බැලීම

තමන්ගේ නොවන පිටස්තර පුද්ගලයන්ගේ නිවෙස් තුල එබී බැලීම තහනම්ය. අල්ලාහ් මෙසේ පවසන්නේය.

*විශ්වාස වන්තයිනි, ඔබලාගේ නිවෙස් හැර පිටස්තර අය ගේ නිවෙස්වල ඔවුන්ට සලාමය පවසා ඔවුන්ගෙන් අවසරය ලැබෙන තෙක් නොපිවිසෙන්න. (අල්කුර්ආන්-24:27)*

අවසරය පැතීමට හේතුවන්නේ, නිවෙස් හිමියාගේ රහස්‍ය භාවය (හා නොදැකිය යුතු දෙය) පිටස්තර අය දැකීම වැළ කීම නිසා බව නබිනායක මුහම්මදු (සල්)

තුමා පැහැදිලි කළේය. 'අවසරය පැතිය යුතු බව අණකර ඇත්තේ (ඇසින්) දිටීමේ හේතුවනි' යන බුහාරි ග්‍රන්ථයෙහි සඳහන් එතුමාගේ වදනක් එයට නිදසුනකි.

අද නිවෙස් හා වෙනත් ගොඩනැගිලි එකින්නෙක සමීපව තදබදයෙන් හා සම්බන්ධකරමින් ඉදිකර ඇත. එසේම එහි ජනේල් හා දොරටු මුහුණට මුහුණලා පිහිටා ඇත. මෙයින් එක් නිවසක රහස්‍යභාවය (දැකීමට නොහැකි දේ) වෙනත් නිවෙස් හිමියන්ට දැකිය හැකි අවස්ථා ඉතාමත් අධික වේ. බොහෝ අය සිය බැල්ම පහත නොහැලී බලති. සමහර අවස්ථාවල උඩු මහල්වල ජීවත්වන්නන් සිය මහලෙන් සිට හා ජනේල මාර්ගයෙන් පහත මාලයෙහි පිහිටා ඇති අසල් වැසියන්ගේ නිවෙස්තුල එබී බලති. මෙවන් ක්‍රියා වංචාවක් වන අතර, එය සිය අසල් වැසියාගේ ගරුත්වය විනාශ කිරී මකි.

එසේම, මෙය හරාම් හෙවත් දුෂ්ට ක්‍රියාවන් කරා ඔහුව යොමු කිරීමට මග පෙන්වයි. මෙවැනි හේතුන් මත සමාජ යෙහි විශාල කලබල හා ප්‍රශ්න රාශියක් සිදුවන්නේය. අන් අයගේ නිවෙස් තුල එබී බලන්නාගේ ඇස් පැහැර ගැනීම නිවෙස් හිමියාට ඉස්ලාම් ධර්මය අනුමත කරන්නේය. එසේ පැහැර ගන්නා ඇහ සඳහා පළිගැනීමක් කළ නොහැක. මෙසේ ඉස්ලාම් සිය නීතිරීතිය (දඬුවම) ලිහිල් කිරීම මෙම ක්‍රියාව කෙතරම් විපාක බවට සාධකවේ. මේ පිළිබඳව නබි නායක මුහම්මදු (සල්) තුමා පැවසූ

වදනක් අබූහුරෙරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙකු හෝ පිටස්තර අයගේ නිවසෙහි එබී බැලුවේ නම්, ඔහුගේ ඇස පැහැර ගැනීම ඔහුට (නීතියෙන්) අනු මතවේ. (ග්‍රන්ථය : මුස්ලිම්)

වෙනත් වාර්තාවකහි නබිනායක තුමා මෙසේද ප්‍රකාශ කළ බව සඳහන්වේ.

කවරෙකු හෝ පිටස්තර අයගේ නිවසෙහි එබී බැලූ හේතු වෙන් ඔහුගේ ඇස ඔවුන් පැහැර ගත්තේනම්, ඒ වෙනුවෙන් වන්දියක් හෝ පළිගැනීමක් හෝ නොවන්නේය. (ග්‍රන්ථය : නසාඉ)

# දෙන්නෙක් රහස් කථා කිරීම

තුන්දෙනෙකු සිටින සභාවක දෙන්නෙකු පමණක් රහස් කථාබහක යෙදීම තහනම්ය. මන්ද යත්, මෙය සභාවෙහි සාම භාවයට විපතක් වන අතර, මුස්ලිම් වරුන් අතර බෙදී මක්, විරෝධයක් හා ක්‍රෝධයක් ඇති කිරීමට සාතාන් කරන කුමන්ත්‍රණයකි.

මෙකී නීතිමය ස්ථාවරය හා එය තහනම් වීමේ හේතුව පිළිබඳව නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ වද නක් වායිල් ඉබ්නු අබ්දුල්ලාහ් (රලි) තුමා මෙලෙස වාර්තා කරන්නේය.

ඔබලා මිනිසුන් අතරෙහි මිශ්‍රවී සිටින අවස්ථාවෙන් හැර තුන් දෙදෙනක් එකට සිටින කළ කෙනෙකුව

නොසළකා දෙන්නෙකු පමණක් රහසිගතව කථාබහක නොයෙදෙන්න. (ග්‍රන්ථය : බුහාරි)

එසේම, සතර දෙනෙකු සිටිනවිට තුන්දෙනෙකු පමණක් රහසිගතව කතාබහක යෙදීම තහනම්ය. කෙනෙකුව අත හැර අන් අය පමණක් රහස් කතා කිරීමද එසේම තහනම්ය. රහස් කතා කරන දෙන්නෙකු තුන්වන්නා නොදන්නා භාෂා වකින් කතා බහක නොයෙදිය යුතුයි. මෙසේ කෙනෙකුව අතහැර රහස් කතා බහක යෙදීම එක් අතකින් තුන්වන් නාට නින්දා කිරීමක් හා ඔහුව අල්ප ලෙස සැළකීමක් බවට පත්වීමෙන් හෝ ඔවුන් දෙදෙනා තමා කෙරෙහි අයහපතක් කතා කරන බව ඔහු සිතීමෙන් සැකයක් නොමැත. එනිසා මෙය තහනම්ය.

# විලුඹට පහත ඇඳුම් ඇඳීම

මිනිසුන් සාමාන්‍ය ලෙස සළකන කරුණු අතර විලුඹට පහත සිටින ආකාරයට ඇඳුම් ඇඳීමද එකකි. නමුදු, අල්ලාහ් කෙරෙහි මෙය ඉතා වැදගත් කරුණකි. සමහරුන් පොළෝ වට ගැවන සේද, තවත් සමහරුන් සිය ඇඳුමෙන් පොළොව අතුගාගෙන යන සේද ඇඳුම් අඳින්නෝය.

නබිනායක (සල්) තුමා 'අල්ලාහ් පරලොව දිනයේ තුන් දෙනෙකු සමග කතා නොකරයි. ඔහු ඔවුන් කරා (ඔහුගේ කරුණාවන්ත) බැල්ම යොමු නොකරයි. ඔහු

ඔවුන්ව පවිත්‍ර නොකරයි. ඔවුන්ට වේදනාවත් සහිත දඬුවම් පවතී. (ඔවුන් කවරෙක්නම්) විලුඹට පහත සිටින සේ සිය ඇඳුම අඳින්නා, කළ උපකාරය ප්‍රසිද්ධ කරන්නා හා බොරු දිවුරුම මගින් භාණ්ඩ විකුණන්නා යන්නන්ය' යනුවෙන් පැවැසූ බව අබූ දර් (රලි) තුමා වාර්තා කරන්නේය. (ග්‍රන්ථය : බුහාරි)

තමා විලුඹට පහත එන සේ ඇඳුම අඳින්නේ අහංකාර කමකින් නොවන බව (නිදහසට කරුණු) කියා සිටින්නා එමගින් තමාව පවිත්‍ර වන්තයෙකු බව පෙන්වීමට උත්සාහ ගනී. නමුදු, එය පිළිගත නොහැකි කරුණකි. එය අහංකාර කමට හෝ වෙනත් හේතූන් මත හෝ වේවා මේ පිළිබඳ නබිනායක මුහම්මදු (සල්) තුමාගේ අවවාදයනම් පොදුවකි. මෙයට සාධක ලෙස පවතින එතුමා පැවැසූ වදනක් මෙසේ අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන්නේය.

සිය විලුඹට පහත එන සේ ඇඳුම් අඳින්නා නරකාදියෙහි සිටී. (ග්‍රන්ථය : බුහාරි)

එසේ අඳින්නා අහංකාරකමින් අඳින්නේනම්, ඔහුට කෲර හා දැඩි ලෙස දඬුවම් පමුණුවනු ලැබේ. මුහම්මදු (සල්) තුමා පැවැසූ බව ඉබ්නු උමර් (රලි) මෙසේ වාර්තා කරන්නේය.

කවරෙකු අහංකර කමින් තම ඇඳුම විලුඹට පහත එන සේ අඳින්නේද, පරලොව දිනයේ අල්ලාහ් ඔහු කරා තමාගේ (කරුණාවන්ත) බැල්ම යොමු නොකරයි. (ග්‍රන්ථය : බුහාරි)

මෙහි (විලුඹට පහත එන සේ ඇඳීම හා අහංකාරකම යන) තහනම් කරුණු දෙකක් එකට එකසේ පවතී. විලුඹට පහත එන සේ ඇඳීම තහනම්වීම සෑම ඇඳුම් සඳහාම පොදු නීතියකි. මෙයට සාධකයක් ලෙස නබි (සල්) තුමා පැවැසූ බව ඉබ්නු උමර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

සරම, කමීසය හා හිස් වෙලුම (තලප්පාව) යනාදී ඇඳුම් විලුඹට පහත එන සේ ඇඳීම තහනම්ය. කවරෙකු මෙයින් එකක් හෝ පොළොවට ගෑවෙන සේ ඇඳින්නේද, පරලොව දිනයේ අල්ලාහ් ඔහු කරා සිය (කරුණාවන්ත) බැල්ම යොමු නොකරයි. (ග්‍රන්ථය : අබූදාවූද්)

නමුත්, ස්ත්‍රියෙකු සිය පාදය ආවරණය කිරීම සඳහා තම ඇඳුම වියත හෝ රියන ප්‍රමාණයක් විලුඹට පහතව ඇඳීම අනුමතවේ. මෙය සුළඟ යනාදි හේතූන් මත පාදය පිටත නොපෑනීමේ ර්‍ෂකවරණය සඳහාය. එනමුත් මෙයින්ද සීමාව ඉක්මවා නොයා යුතුයි. උදාහරණයට, විවාහ උත්සවයන්හි සමහර මනාලියන්ගේ ඇඳුම් අධික වියත හා අධික මීටර ප්‍රමාණ දිර්ඝයෙන් පවතී. කෙතරම්නම්, සමහර අවස්ථාවල මනාලිගේ පිටුපස කෙනෙකු එම ඇඳුම ඔසවාගෙන යායුතු ලෙස පවතින්නේය.

# පිරිමින් රත්රන් පැළඳීම

නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් අබූමූසා අල් අෂ්අරී (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

මගේ සමාජයෙහි ස්ත්‍රීන්හට රත්රන් සහ සේද පැළඳීම අනුමතවේ. නමුත්, පිරිමින්හට ඒවා තහනම්ය. (ග්‍රන්ථය : අහ්මද්)

අද වෙළඳසැල්වල පිරිමින් සඳහා රත්රන් මගින් සාදන ලද හෝ රන් ආලේප කරන ලද අත් ඔරලෝසු, ඇස් කණ්ණාඩි, බොත්තම්, පෑන, මාල, යතුරු කරලි හා මෙවන් දේ විවිධ වර්ගවලින් පවතී. මේවා සියල්ල තහනම්ය. සමහර තරඟාවලියෙහි ජයග්‍රහණය කළ අයට තෑගි වශයෙන් 'පිරි මින්ට අයත් රත්රන් අත් ඔරලෝසු' යැයි නිවේදනය කරනු ලබන්නේය. මෙයද තහනමකි.

මෙයට අදාලව ඉබ්නු අබ්බාස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

පුද්ගලයෙකුගේ අතෙහි රත්රන් මුද්දක් දුටු නබිනායක මුහම්මදු (සල්) තුමා එය ගලවා වීසි කළේය. පසුව ඔහුව අමතා 'ඔබලාගෙන් කවරෙකු හෝ ගින්නෙන් යුත් වළල්ලක් තම අතෙහි පළඳවීමට කැමැතිවෙයිද ? යනුවෙන් විමසීය. නබිතුමා පිටත්ව ගිය පසු ඔහුට 'එම මුද්ද රැගෙන වෙනත් කාර්යයක් සඳහා පාවිච්චි කරන්න' යනුවෙන් පුද්ගලයෙකු

පැවැසූවිට ඔහු ‘මම අල්ලාහ් මත දිවුරා කියමි, අල්ලාහ්ගේ දූතවරයා විසිකළ එම මුද්ද කිසිවිටක හෝ මම නොගනිමි’ යනුවෙන් කීය. (ග්‍රන්ථය : මුස්ලිම්)

# ස්ත්‍රීන් කෙටි, සිනිඳු, තද ඇඳුම් ඇඳීම

අද කාලයේ අප විරුද්ධවාදීන් නවීන හා නව ශිෂ්ඨාචාර ඇඳුම් විවිධ මෝස්තරෙන් හා විලාසිතාවෙන් සාදා මුස්ලිම් සමාජය අතර ව්‍යාප්ත කිරීම මගින් මුස්ලිම්වරුට එරෙහිව මහා යුද්ධයක් පටන්ගෙන තිබේ. මෙම ඇඳුම් කෙටියෙන් හෝ සිනිඳුකමින් හෝ තදයෙන් පවතින බැවින් ඒවා ආව රණය කළ යුතු ප්‍රදේශ ආවරණ නොකරන්නේය. මෙවැනි ඇඳුම් ස්ත්‍රීන් අතරද, ඥාතීන් අතරද ඇඳගෙන සිටීමට පවා නොහැක.

මෙවන් ඇඳුම් වර්ග (පරලොව සමීපවන) අවසන් කාල පරිච්ඡේදයෙහි ස්ත්‍රීන් අතර ව්‍යාප්තවන බව නබි මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් අබූහුරෙරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

මා නොදුටු පිරිස් දෙකක් නරකාදියෙහි සිටිති. පිරිසක්, ඔවුන් අතෙහි ගවයාගේ වලිගය සේ කස කීපයක් තිබේ. ඔවුන් එමගින් මිනිසුන්ට පහර දෙති. අනෙක් පිරිස, ඔවුන් ඇඳුම් ඇඳ සිටියත් නිරුවත්ව සිටින, තමන් (පිරිමින් කරා) ආකර්ශණයවී අන් අයවද තමන් කරා ආකර්ණය කරමින් සිටින හා තම කොණ්ඩය ඔටුවන්ගේ මොල්ලිය සේ හැඩ කර බැඳ

සිටින ස්ත්‍රීන්ය. ඔවුන් ස්වර්ගයෙහි නොපිවිසෙති. (එපමණක් නොව) ඔවුන් ස්වර්ගයෙහි සුගන්ධය පවා රස නොවිඳිති. නියත වශයෙන්ම, එකී සුගන්ධය මෙසේ මෙසේ නුදුරින් සිට පැමිණේ. (ග්‍රන්ථය : මුස්ලිම්)

අද සමහර ස්ත්‍රීන් අඳින ඇඳුම්ද මෙවන් ඇඳුම්වලට ඇතුළත්වේ. ඔවුන්ගේ ඇඳුම් පහළ සිට ඉහළ දක්වා දිර්ඝයෙන් විවෘතව හෝ ඇඳුම්වල අධික තැන්වල සිදුරු සහිතව පවතී. ඔවුන් හිඳ ගන්නා කළ ආවරණය කළ යුතු ප්‍රදේශ පිටතට පෙනේ. එපමණක් නොව, මෙවැනි ඇඳුම් ඇඳීමෙන් ඔවුන් කාෆිර්වරුන්ට සමානවන අතර, සංස්කෘතියෙහි සහ ඔවුන් බිහි කළ ශිෂ්ඨාචාරයෙහි ඔවුන්ව අනුගමනය කරන බවද පවතී. අල්ලාහ් අප සැම රැකගනු මැනවි.

එසේම, අනතුරු දායක කරුණුනම්, ගායික ගායිකාවන්, සංගීත භාණ්ඩ, මත්පැන් භාජන, ප්‍රාණීන්ගේ රූප හෝ කුරුස හෝ සමාජ ශාලා හා නපුරු සංගම්වල ලාංඡන හෝ මිනිස් ගරුත්වයටද ගෞරවයටද පටහැනි අසභ්‍ය වදන් හා නොයෙකුත් භාෂාවලින් යුත් විවිධ වදන් සමහර ඇඳුම්වල සඳහන්වීමකි.

# ව්‍යාජ කොණ්ඩ පැළඳීම

පිරිමින් හා ස්ත්‍රීන් තම කොණ්ඩය හා සමග මිනිසුන්ගේ හෝ වෙනත් ව්‍යාජ කොණ්ඩ එකතුකර පැළඳීම තහනම්ය. මෙයට අදාලව නබිනායක තුමාගේ

බිරියෙක්වූ අස්මා බින්ත් අබී බක්ර් (රලි) තුමිය මෙසේ වාර්තා කරන්නීය.

එක් කාන්තාවක් නබිනායක මුහම්මදු (සල්) තුමා වෙත පැමිණ 'අල්ලාහ්ගේ දූතයාණෙනි, 'මනාලියෙක් ලෙස සිටින මාගේ දියණියක් රෝගයකට ලක්වීමෙන් ඇගේ හිස කෙස් හෙලී ඇත. එබැවින්, මා ඇගේ හිසට ව්‍යාජ කොණ්ඩයක් පළඳින්නද ?' යනුවෙන් විමසීය. එකළ නබිතුමා 'අල්ලාහ් ව්‍යාජ කොණ්ඩය පළඳින්නාට හා පළඳවන්නාට ශාප කරන් නේය' යනුවෙන් පැවැසීය. (ග්‍රන්ථය : මුස්ලිම්)

ජාබිර් බින් අබ්දුල්ලාහ් (රලි) තුමා මෙසේ තවත් වදනක් වාර්තා කරන්නේය.

ස්ත්‍රියෙකු සිය හිසකෙස් හා සමග කිසිවක් එකතු කිරීම පිළිබඳව නබිනායක මුහම්මදු (සල්) තුමා අවවාද කළේය. (ග්‍රන්ථය : මුස්ලිම්)

අද සමාජයෙහි විග් **(Wig)** යනුවෙන් හඳුන්වන කොණ්ඩ වර්ගයක් පැළඳීම මෙයට උදාහරණයකි. මෙයද තහනම්ය. එසේම, අද කාලයේ මෙවන් කෙස්වැටි සරසන්නන් පරිහර ණය කරන හා රූපලාවන්‍ය ස්ථානවල පරිහරණය කරන ද්‍රව්‍යයන්ද සිනමාවල හා නාට්‍යවල රඟපාන නළු නිළියන් පරිහරණය කරන දේද තහනම්ය.

# ස්ත්‍රීන් හා පිරිමින් පරස්පරව සමානවීම

ඇඳුම් පැළඳුම්, කථාබහ සහ හැසිරීම් යනාදිවල පිරිමින් ස්ත්‍රීන්ටද ස්ත්‍රීන් පිරිමින්ටද පරස්පරව සමානවීම තහනම්ය. අල්ලාහ් පිරිමින්ව මවා ඇති පෞරුෂත්වය එසේම පිරිමින්ද, ඔහු ස්ත්‍රීන්ව මවා ඇති ස්ත්‍රීභාවය එසේම ස්ත්‍රීන්ද ආරක්ෂා කිරීම අල්ලාහ් මිනිසුන්ට පිහිටුවා ඇති ස්වභාවික කරුණු වලින් එකකි. මෙසේ ආරක්ෂා කිරීම මිනිස් ජීවිතය ශීලාචාර කිරීමේ කාරාණාවන් අතරද එකකි.

පිරිමින් ස්ත්‍රීන්ටද, ස්ත්‍රීන් පිරිමින්ටද සමානව හැසිරීම මෙම ස්වභාවයට පටහැනි වේ. මෙසේ හැසිරීමට එළඹීම, කළහ හා ප්‍රශ්නයන්හි දොරටු විවෘත වීමටත්, සමාජය පිරි හානියට ලක් වීමටත් මග පාදයි.මෙවන් ක්‍රියා ආගමානුකූල ලව තහනම් කරුණකි. මන්දයත්, කුමන ක්‍රියාවක් ශාපයට ලත් ක්‍රියාවක් ලෙස ආගම වටහා දෙන්නේද, ඒවා නියතව තහනම් හා මහා පාපයක් ලෙස පවති. මේ පිළිබඳව ඉබ්නු අබ්බාස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

ස්ත්‍රීන්ට සමානවන පිරිමින්හට හා පිරිමින්ට සමානවන ස්ත්‍රීන්හට නබිනායක මුහම්මදු (සල්) තුමා ශාප කළේය. (ග්‍රන්ථය : බුහාරි)

ස්ත්‍රීන්ට සමානව හැසිරෙන පිරිමින්ට හා පිරිමින්ට සමා නව හැසිරෙන ස්ත්‍රීන්ට නබිනායක මුහම්මදු (සල්) තුමා ශාප කළේය. (ග්‍රන්ථය : තිර්මිදි)

සමානවීම සමහරවිට සැළුවීමෙන්ද, ඇවිදීමෙන්ද, ගැවසී මෙන්ද පවතී. එනම්, පිරිමින් ශරීරයෙන්, ප්‍රකාශයෙන් හා ඇවිදීමෙන් ස්ත්‍රීන්හට සමානවීමකි. එසේම, ස්ත්‍රීන් පළඳින මාල, වළලු, කුණ්ඩලාභරණ යනාදිය පිරිමින් පැළඳීමද තහ නම්ය. මෙවන් දෙය අද හිප්පි යනුවෙන් හඳුවන්නන් අතර බහුලව ව්‍යාප්තව පවතී.

එසේම, පිරිමින්ට අදාලවූ කමිසය, සරම, කලිසම යනාදි ඇඳුම් ස්ත්‍රීන් පැළඳීමද තහනම්ය. ඔවුන් නිර්මානයෙන් පිරි මින්ගේ ඇඳුම්වලට පටහැනිව පවතින ඇඳුම් ඇඳීම අනිවාර් යවේ.

මෙයට සාධක වශයෙන් අබූහුරෛරා (රලි) තුමා වාර්තා කරන නබි වදනක් මෙසේ සඳහන්වේ.

ස්ත්‍රියගේ ඇඳුම අඳින පිරිමියාට සහ පිරිමයාගේ ඇඳුම අඳින ස්ත්‍රියට නබිනායක මුහම්මදු (සල්) තුමා ශාප කළේය. (ග්‍රන්ථය : අබූදාවූද්)

# කොණ්ඩයට කලු සායම් ආලේප කිරීම

කොණ්ඩය කලු පැහැති සායමෙන් ආලේප කිරීම ගැන නබිනායක මුහමම්දු (සල්) තුමා අවවාද කර ඇති හෙයින් එසේ කිරීම තහනම්ය. එතුමා ප්‍රකාශ

කළ වදනක් ඉබ්නු අබ්බාස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

පරෙවියාගේ (කලු පැහැති) පපු ප්‍රදේශය සේ (තමාගේ කොණ්ඩයට) කලු සායම් ආලේප කරන සමාජයක් අවසන් කාලයේ බිහිවේ. ඔවුහු ස්වර්ගයේ සුගන්ධය පවා නොවිඳිති. (ග්‍රන්ථය : අබූදාවූද්)

හිසකෙස් පැසුණු අධික පිරිස් අතර මෙම ක්‍රියාව බහුලව පවතී. ඔවුන් තම පැසුණු කොණ්ඩයට කලු සායම් ආලේප කරති. ඔවුන්ගේ මෙවන් ක්‍රියා අධික පාපයන් කරා ඔවුන්ව යොමු කරයි. රැවටීම, අල්ලාහ් මැවූ නිර්මාන වෙනස් කිරීම, තම යථාර්තභාවය වසංකර ව්‍යාජ පෙනුම දර්ශනය කිරීම යනාදීන් එවන් පාපවේ. මේවා මිනිස් චරිතයෙහි නපුරු බල පෑමක් ඇති කිරීම ගැන කිසියම් සැකයක් හෝ නොමැත. සමහරවිට ඔහුට මෙමගින් යම් රැවටීමක්ද සිදුවීමට හැක.

නබිනායක මුහම්මදු (සල්) තුමා තම පැසුණු කොණ්ඩය මරිතොන්ඩි හා වෙනත් කහ, රතු හා දුඹුරු පැහැයට සමාන පාටවලින් වෙනස් කළ බවට නබි වදන්වලින් සාධක පවතී. මක්කා නගරය ජයග්‍රහණය කළ දින (අබූබක්ර් (රලි) තුමා ගේ පියාවූ) අබූකුහාෆාව නබිනායක තුමා වෙත ගෙනෙනු ලැබිත. ඔහුගේ කොණ්ඩය හා යටි රැවුල සුදු පැහැති මල් හා ගෙඩි සහිත පැලෑටියක් සේ සුදේ සුදට තිබිත. එය දුටු නබිනායක තුමා 'කිසියම් දෙයක් මගින් හෝ මෙම

පැසුණු කොණ්ඩය වෙනස් කර ගන්න. (එනමුත්,) කලු පැහැයින් වැළකී සිටින්න' යනුවෙන් ප්‍රකාශ කළේය. මෙම කරුණෙහි ස්ත්‍රීන්ද පිරිමින්ට සමාන වේ. ඔවුන්ද පැසුණු කොණ්ඩයට කලු පැහැයෙන් ආලේප කිරීම තහනම්ය.

# පණ ඇති දේහි රූප ඇඳීම

ඇඳුම්, බිත්ති හා කඩදාසි යනාදිවල පණ ඇති දේහි රූප ඇඳීම තහනම්ය. නබි (සල්) තුමා පැවසූ බවට අබ්දුල්ලාහ් බින් මස්ඌද් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

සැබැවින්ම, පරලොව දිනයේ අල්ලාහ්ගේ දඬුවමට අධික වශයෙන් ලක්වන්නේ රූප අඳින්නන්ය. (ග්‍රන්ථය : බුහාරි)

අල්ලාහ් පවසන බවට නබි මුහමම්දු (සල්) තුමා ප්‍රකාශ කළ බව අබූහුරෛරා (රලි) මෙසේ වාර්තා කරන්නේය.

මා මවන සේ මැවීමට වෙහෙස දරන්නන්ට වඩා අපරාධ කරුවන් කවරෙකු විය හැකිද ? ඔවුන්ට හැකිනම්, බීජයක් හෝ කුහුඹියෙකු හෝ මවා පෙන්නවා. (ග්‍රන්ථය : බුහාරි)

නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ බව ඉබ්නු අබ්බාස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

රූප අඳින සෑම දෙනා නරකාදියෙහි පිවිසේ. ඔහු විසින් අඳින ලද සෑම රූපවලටම අල්ලාහ් පණ දෙන්නේය. පසුව නරකාදියේ ඒවා ඔහුව වේදනා කරයි. මෙසේ වාර්තා කරන ඉබ්නු අබ්බාස් (රලි) 'ඔබ අනිවාර්යයම ඇඳිය යුතුම නම්, ගස් හා පණ නොමැති දේ අඳින්න' යනුවෙන් පවසන්නේය. (ග්‍රන්ථය : මුස්ලිම්)

මෙම නබිවදන් සියල්ල සෙවනැල්ල ඇති හෝ නොමැති හෝ වේවා මිනිසුන් හා වෙනත් පණ ඇති ප්‍රාණීන්ගේ රූප ඇඳීම තහනම් බව වටහා දෙන්නේය. ඒවා මුද්‍රණයකර හෝ චිත්‍රකර හෝ (ගල් හා ලීවල) කැටයම්කර හෝ ප්‍රතිමා ඇඳ හෝ (අච්චුවේ) වාත්තුකර හෝ වේවා ඒවා තහනම්ය. මෙම නබිවදන් මෙවන් සියළු දේ අන්තර්ගතව පොදුවෙන් තහනම් කරන්නේය.

මුස්ලිම්වරයා මෙවන් ආගමානුකූල සාධකවලට කීකරුවී ඒවායින් වැළකී සිටිය යුතුයි. එසේ නොමැතිව 'එයට මම වන්දනාමානද කරන්න යන්නේ ? ඒවාට හිස නමන්නටද යන්නේ ? යනාදි තර්ක විතර්ක නොකළ යුතුයි. අපි ජීවත් වන මෙම කාලයේ රූප වර්ධනයවී ව්‍යාප්තවීමෙන් පවතින එක් විපාකයක් කරා පමණක් හෝ බුද්ධිමතෙකු පැහැදිළි අරමුණකින් කල්පනා කළේනම්, මෙසේ රූප ඇඳීම තහනම් කිරීමෙන් ඉස්ලාම්හි සූක්ෂ්මභාවයක් ඇති බව වටහා ගනී. එනම්, එමගින් මිනිසාගේ ආසාවන්ට රුකුල් දීම හා කාම හැඟීම් ඇවිස්සීම යනාදි ඉමහත්

විපාක සිදු වේ. එපමණක් නොව සමහර රූපයන් මිනිසාව නින්දිත හා දූෂිත ක්‍රියාවන් කරාද යොමු කරයි.

එනිසා, මුස්ලිම්වරයා පණ ඇති දේහි රූප තම නිවසෙහි අරක්ෂාකර තබා ගැනීමෙන් වැළකි සිටිය යුතුයි. මෙය ඔහු ගේ නිවසට අල්ලාහ්ගේ දූත (මලක්)වරුන් නොපැමිණීමට හේතුවේ. නබිනායක මුහම්මදු (සල්) තුමා මේ ගැන පැවසූ වදනක් අබූ තල්හා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

බල්ලන් සහ රූප ඇති නිවෙස්වලට අල්ලාහ්ගේ මලක් වරුන් නොපැමිණෙති. (ග්‍රන්ථය : බුහාරි)

සමහර නිවෙස්වල විවිධ රූප දක්නට ලැබේ. ඒවා අතර, කාෆිර්වරු වන්දනාමාන කරන සමහර පිලිමයන්ගේ රූපද තිබේ. ඒවා තෑගි ලෙස ලැබූ බවත්, අලංකාරය සඳහා තබා ඇති බවත් ඔවුහු පවසති. නමුත් මේවා අනෙක් රූපයන්ට වඩා තදබල ලෙස තහනම්ය. එසේම බිත්තිවල එල්ලා ඇති රූප එල්ලා නොමැති රූපවලට වඩා තදබල ලෙස තහනම්ය. මක්නිසාද යත්, මෙවන් සමහර රූප ගරුත්වය හා යාඥාව කරා යොමු කරන්නේය. තවත් සමහර රූප අමතකවූ දුක් හා ශෝක නැවත නැවත සිහි ගන්වන්නේය. තවත් සමහර රූප පැරැන්නන් පිළිබඳ අහංකාරය ඇති කරන්නේය.

එසේම, රූප අනුස්මරණය කිරීම සඳහා බව පැවැසීමටද නොහැක. මක්නිසාදයත්, යථාර්තයෙන්

අනුස්මරණය කිරීම යනුවෙන් හැඳින්වන්නේ සිය සහෝදරයෙකුව හෝ ඥාති යෙකුව හෝ පුද්ගලයෙකුව සිත්සතන්තුල තබා සිහිකිරීම හා ඔහුට පව් සමාව හා දයාදයන් ලබාදෙන ලෙස ප්‍රාර්ථනා කිරීම වේ.

එහෙයින්, මෙවන් රූප ඉවත් කිරීම හෝ විනාශ කිරීම අනිවාර්ය වේ. එනමුත්, එසේ කිරීමට අපහසු වන්නේ නම් ප්‍රශ්නයක් නොවන්නේය. උදාහරණයට, අද විවිධ භාණ්ඩ, පැකැට්ටු, ගැලුම්, ටින්, ප්‍රයෝජනවත් පොත්පත්, ශබ්දකෝෂ යනාදීන්හි රූපයන් වැළක්වීමට නොහැකි තරමට බහුලව පවතී. නමුදු, ඒවාද ඉවත් කිරීමට හැකිතාක් වෙහෙස දැරිය යුතුයි. සමහර භාණ්ඩවල ඇති රූප අනිවාර්යයෙන්ම ඉවත් කළ යුතුයි. නොඑසේනම්, ඒවා කෙරෙහි දැඩි අවවාදයෙන් සිටිය යුතුයි. අත්‍යවශ්‍ය අවශ්‍යථාවන් සඳහා හැඳුනුම් පත්, ගමන් බලපත් හා වෙනත් රජයේ ලිපි ලේඛණයන්හි ඇති රූප ආරක්‍ෂාකර තබාගත හැක. ගරුත්වය නොකරන, පාද වල පෑගීමට ලක්වන රූප කෙරෙහි සමහර විද්වතුන් අනු මතකර ඇත. අල්ලාහ් මෙසේ පවසන්නේය.

*ඔබලාට හැකිතරම් අල්ලාහ්ට බිය වන්න.*

(අල්කුර්ආන්-64:16)

# සිහින ගැන අසත්‍යය පැවසීම

සමහරුන් මිනිසුන් අතර තමාට කීර්තියක් හා ප්‍රසිද්ධි යක් ලබා ගැනීම සඳහා හෝ මුදල්මය

ප්‍රයෝජනයක් ලබා ගැනීම සඳහා හෝ තම සතුරන් බිය ගැන්වීම සඳහා හෝ වෙනත් මෙවන් හේතූන් මත හෝ නොදුටු සිහින පිළිබඳව දුටු බවට ව්‍යාජ තොරතුරු පතුරුවෙති.

සාමාන්‍ය මිනිසුන් අතරේ බහුලව සිහින පිළිබදව දැඩි විශ්වාසයක් සහ ඔවුන්ට ඒවා ගැන අධික ලැදියාවක් පව තින බැවින් ඔවුහු මෙවන් ව්‍යාජ සිහිනවලින් රැවටීමට ලක් වෙති. මෙවැනි ක්‍රියාවෙහි යෙදෙන්නන් පිළිබඳව නබිවදන් වල දැඩි ලෙස අවවාද කර ඇත. නබි මුහමම්දු (සල්) තුමා ප්‍රකාශ කළ බව වාතිලා බින් අල්අස්කඋ (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

පුද්ගලයෙකු තම පියා නොවන්නෙකුව පියා ලෙස තර්ක කිරීම හෝ තමා නුදුටු සිහිනයක් දුටු ලෙස පැවසීම හෝ අල්ලාහ්ගේ දූතවරයා නොපැවැසූ දෙයක් පැවැසූ බව කීම හෝ ඉමහත් පාප ක්‍රියාවකි. (ග්‍රන්ථය : බුහාරි)

නබිනායක මුහමම්දු (සල්) තුමා ප්‍රකාශ කළ බව ඉබ්නු අබ්බාස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

නොදුටු සිහිනයක් දුටු බව පවසන්නා (පරලොව දිනයේ) තිරිඟු ඇට දෙකක් එකතුකර බඳින ලෙස බලකරනු ලැබේ. එනමුත්, ඔහු එයට අසමත් වේ. (ග්‍රන්ථය : බුහාරි)

තිරිඟු ඇට දෙකක් එකට එකතු කර බැඳීම අසාර්ථක කරුණක්වන අතර, එයම ඔහුට දඬුවමකි.

# මිනීවළ අභියස හිඳ ගැනීම, පෑගීම හා මලමූත්‍රා පහකිරීම

මෙම කරුණ පිළිබඳව නබිනායක මුහම්මදු (සල්) තුමා පැවසූ බව අබූහුරෛරා (රලි) මෙසේ වාර්තා කරන්නේය.

ඔබලාගෙන් කෙනෙකු ගින්නක් මත හිඳගෙන එමගින් ඔහුගේ ඇඳුම් හා ශරීරය දැවීම, මිනීවළ මත හිඳ ගැනීමට වඩා ඔහුට උතුම්ය. (ග්‍රන්ථය : මුස්ලිම්)

සමහරුන් මල අය භූමිදානය කරන කළ යාබද මිනීවල් පෑගීමද, එහි තැන්පත් කර ඇති අයට කිසියම් ගරුත්වයක් හෝ සැළකිල්ලක් හෝ නොදී හැසිරීමද අද කාලයේ දැකි මට හැක. මෙසේ කිරීම කෙතරම් බරපතල කරුණක් බව නබිනායක මුහම්මදු (සල්) තුමා පැවසූ වදනක් උක්බත් බින් ආමිර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

ගින්නක් මත මා පා තබා ඇවිදීම හෝ තියුණු කඩුවක් මත මා පා තබා ඇවිදීම හෝ මාගේ පාවහන මාගේ පාදය හා සමග සම්බන්ධකර මැසීම හෝ, මුස්ලිම් වරයෙකුගේ මිනීවළ මත මා පා තබා ඇවිදීමට වඩා මාහට ඉතා සතුටකි. (ග්‍රන්ථය : ඉබ්නු මාජා)

නබිනායක තුමා ප්‍රකාශ කළ පරිදි කරුණු මෙසේ නම්, සුසාන භූමියක් අත්පත්කර ගෙන එහි

ගොඩනැගිලි සාදා වෙළඳාම් කරන්නාගේ සහ පදිංචිවී සිටින්නාගේ තත්ත්වය කෙසේ පවතීද ?

සමහර අයහපත්ශීලී දුෂ්ඨ පුද්ගලයන් මිනීවළ මත මල මූත්‍රා පහ කරති. ඔවුන්ට මලමූත්‍රා පහකිරීමට අවශ්‍යවූ කළ ඔවුන් තාප්පයෙන් පැනගෙන හෝ වෙනත් කුමන මාර්ගය කින් හෝ සුසාන භූමියතුලට පිවිස එහි තම අවශ්‍යතාවය ඉටු කරන අතර, කිලිටු සහ දුගඳ මගින් එහි තැන්පත්ව සිටින්නන්ට අවහිර කරති. මේ ගැන නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් උක්බත් බින් ආමිර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

සුසාන භූමියෙහි මල මූත්‍රා පහ කිරීම හා කඩ වීදියෙහි (ලැජ්ජාවීමෙන් තොරව) මලමූත්‍රා පහකිරීම අතරෙහි මාහට කිසිදු වෙනසක් නොමැත. (ග්‍රන්ථය : ඉබ්නු මාජා)

එනම්, පොදු ස්ථානයක්වූ කඩ වීදියේ මිනිසුන් ඉදිරියේ ආවරණය කළ යුතු ප්‍රදේශ විවෘතව පවතින තත්ත්වයේ මල මූත්‍රා පහකිරීම කෙතරම් ලැජ්ජා සහගත වන්නේද, එසේම සුසාන භූමියෙහි මල මූත්‍රා පහ කිරීමද නින්දිත ක්‍රියාවකි. සමහරු සුසාන භූමිවල (විශේෂයෙන් පාලුවූ හා වට තාප්ප කඩා වැටී පවතින සුසාන භූමිවල) කුණු ගොඩ සහ කැලි කසල යනාදී දමති. නබිතුමාගේ මෙම අවවාදයෙහි ඔවුන්ද කොටස් කරුවන්ය. මිනීවල බැහැදැකීමට අදහස් කරන්නන් මිනීවල අතර ගමන් කරනවිට තම පාවහන් ගලවා ගැනීම එකී සාරධර්මයන් අතර එකකි.

# මූත්‍රාවෙන් ආරක්ෂා නොවීම

මිනිසාගේ සියළුම විෂයයන්ම ශීලාචාර කිරීමේ මාර්ගය වටහා දීම ඉස්ලාම් ධර්මයෙහි විශේෂභාවයකි. අපවිත්‍රයෙන් ඉවත්වී පිරිසිදුකමින් සිටීමද මෙවන් අතර එකකි. එබැවින් ඉස්ලාම් ධර්මය ජලය හා ගල් මගින් පවිත්‍ර කළ යුතු බව අණ කරයි. එපමණක් නොව, පිරිසිදුකම සහ පවිත්‍රතාවය විය යුතු ක්‍රමද ඉස්ලාම් වටහා දෙන්නේය. සමහර මිනිසුන් තමන්ගේ ඇඳුම්හි හෝ ශරීරයෙහි හෝ අපිරිසිදු දෙය ගැවී මට හේතුවන දෙයින් ප්‍රවේශම් වීම ගැන නොසැළකිලිමත්ව සිටිති. එපමණක් නොව, (පසුව) එය ඔවුන්ගේ (සලාතය) නැමදුම පවා අවලංගුවීමටද හේතුවේ. මෙය මිනීවළෙහි වේද නාවට ලක් කිරීමටද හේතුවන බවද නබිනායක මුහම්මදු (සල්) තුමාණන් පවසන්නේය. මෙවැනි නබි වදනක් ඉබ්නු අබ්බාස් (රලි) තුමා මෙලෙස වාර්තා කරන්නේය.

නබිනායක මුහම්මදු (සල්) තුමා මදීනා නගරයෙහි එක් වත්තක් පසුකර ගමන් කරනවිට තමතමන්ගේ මිනීවළෙහි පුද්ගලයන් දෙදෙනෙකගේ වේදනා කරනු ලබන ශබ්දයක් ඇසීය. පසු එතුමා ‘ඔවුන් දෙන්නා වේදනා කරනු ලබන්නේ මහා පාපයන් සඳහා නොවේ’ යනුවෙන් පවසා පසුව ‘එසේ මයි. ඔවුන් අතර කෙනෙක් මූත්‍රා පහ කරන කළ එයින් ප්‍රවේශම් නොවී සිටියේය. අනෙකා කේළාම් කියමින් ඇවිද සිටියේය.....’ යනුවෙන් පැවැසීය. (ග්‍රන්ථය : බුහාරි)

එසේම, වෙනත් වදනක නබි මුහම්මදු (සල්) තුමාණන් ‘මිනීවළෙහි අධික වේදනා මූත්‍රා පහ කිරීම හා සම්බන්ධ නිසා සිදුවේ’ යනුවෙන් පැවැසීය. (ග්‍රන්ථය : අහ්මද්)

පුද්ගලයෙකු මූත්‍රා පහ කරන කළ එය පරිපූරණයෙන් පිටත්වීමට පෙර ඉක්මනින් නැගිටීම හෝ තමා කරා විසිවන ආකාරයේ හා ස්ථානයේ හිඳගෙන පහකිරීම හෝ පහකළ පසු ජලය, ගල් හා කඩදාසි යනාදියෙන් පිරිසිදු නොකිරීම හෝ පරිපූර්ණයෙන් තොරව පවිත්‍ර කිරීම යනාදීන් මූත්‍රා පහ කිරීමේ අසම්පූර්ණ තාවයෙහි අන්තර්ගතවේ.

අද මුස්ලිම්වරුද කාෆිර්වරුන්ට සමානව හැසිරීමේ ක්‍රියා මාර්ගයේ යෙදෙති. එනම් පොදු වැසිකිලි සංකීර්ණවල මූත්‍රා පහකිරීම සඳහා බිත්තිවල සමහර තැන් සකසා ඇත. ඒවා දොරටුවෙන් තොරව විවෘතව පවතී. එහි මිනිසුන් යන එන අය ඉදිරියේ කිසිදු ලැජ්ජාවීමකින් තොරව මූත්‍රා පහකරති. පසුව පිරිසිදු කිරීමෙන් තොරව සිය ඇඳුම ඇඳගෙන පිටත් වෙති. මොවුන් තමන්ගේ ආවරණ ප්‍රදේශ ආවරණය නොකර මිනිසුන්ගේ බැල්මට ලක් කිරීම හා මූත්‍රාවෙන් තමාව රැක ගැනීම සඳහා පිරිසිදු නොකිරීම යනාදි තහනම් නින්දිතවූ කාර්ය දෙකෙහි එකම වේලාවෙහි යෙදෙති.

# හොරෙන් ඇහුම්කන් දීම

මිනිසුන් යෙදී සිටින කතා බහවලට ඔවුන්ද එය පිටස්තර අය ඇහුම්කන් දීම අකැමැතිව සිටින කළ එයට හොරෙන් ඇහුම්කන් දීම තහනම් වේ. අල්ලාහ් තආලා 'ඔබලා සෑරා අවුස්සන විමසීම්හි නොයෙදෙන්න' යනුවෙන් පවසන්නේය. (අල්කුර්ආන්-49:12)

නබිනායක මුහමම්දු (සල්) තුමා ප්‍රකාශ කළ බව ඉබ්නු අබ්බාස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙකු හෝ මිනිසුන් අකැමැත්තෙන් සිටින තත්වයේදී ඔවුන්ගේ කතා බහවලට හොරෙන් ඇහුම් කන් දෙන්නේද, ඔහුගේ කන් දෙකෙහිම ර්යම් තහඩුව උණුකර වක්කරනු ලැබේ. (ග්‍රන්ථය : බුහාරි හා තබරානි)

කෙනෙකු මිනිසුන් නොදැන සිටින පරිදි ඔවුන්ගේ කතා බහවලට හොරෙන් සවන් දී ඔහුන්ට යම් කරදරයක් ඇති කිරීමේ චේතනාවෙන් එහි කතා බහවූ දේ පිටස්තර අයට පැවැසුවේ නම්, ඔහු හොරෙන් ඇහුම්කන් දීමේ (හා සෑරා අවුස්සන විමසීමේ යෙදු) පාපය සමග කේළම් කියූ වෙනත් පාපයක්ද කළ අයෙකු ලෙසට පත්වේ. නබිනායක මුහම්මදු (සල්) තුමාණන් 'කේළම් කියන්නා ස්වර්ගයෙහි නොපිවිසේ' යනුවෙන් පවසන්නේය. (ග්‍රන්ථය : බුහාරි)

# අසල් වාසීන්ට අපරාධ කිරීම

අල්ලාහ් අල්කුර්ආනයෙහි අසල් වැසියා පිළිබඳව මෙසේ පවසන්නේය.

*තවද, ඔබලා අල්ලාහ්ට (පමණක්) වැඳුම් පිදුම් කරන්න. ඔහුට කිසියම් දෙයකින් හෝ ආදේශ නොකරන්න. දෙමාපි යන් සමග යහපත් ශීලයෙන් හැසිරෙන්න. තවද, ඥාතීන්, අනාථයන් සහ දිළින්දන් සමගද යහපත් භාවයෙන් හැසි රෙන්න. එසේම, ඥාතීන්වූ අසල්වැසියන්, ඥාතීන් නොවන අසල්වැසියන්, සමීපයෙන් සිටින මිත්‍රයන්, මගීන් හා ඔබලා යටතේ සිටින වහලුන් සමගද සාරධර්මයෙන් හැසිරෙන්න. නිසැකයෙන්ම, අල්ලාහ් ව්‍යාජ අහංකාර හා ආඩම්බරකරු වන් ප්‍රිය නොකරයි. (අල්කුර්ආන්-4:36)*

අසල් වැසියාට කළයුතු කාර්යන් හා ඔවුන්ගේ අයිතිවාසි කම් වැදගත්වන බැවින්, ඔවුන්ට හිරිහැර කිරීම තහනම්ය. නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූ හුරෙයිරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

මම අල්ලාහ් කෙරෙහි දිවුරා කියන්නෙමි, ඔහු විශ්වාසය නොකරන්නේය. මම අල්ලාහ් කෙරෙහි දිවුරා කියන්නෙමි, ඔහු විශ්වාසය නොකරන්නේය. මම අල්ලාහ් කෙරෙහි දිවුරා කියන්නෙමි, ඔහු විශ්වාසය නොකරන්නේය. (තුන් වරක්) යනුවෙන් නබිතුමා

පැවැසූ කළ, අල්ලාහ්ගේ දූතයාණෙනි, ඔහු කවරෙකුද ? යනුවෙන් අනුගාමිකයෝ විමසූහ. එකළ එතුමා 'කවරෙකුගේ හිරිහැරයෙන් සිය අසල්වැසියා බියෙන් සිටින්නේද ඔහුය' යනුවෙන් පැවැසීය. (ග්‍රන්ථය : බුහාරි)

පුද්ගලයෙකු තමාගේ අසල් වැසියන් හා සමග යහපත් ශීලයෙන්ද අයහපත් ශීලයෙන්ද හැසිරෙන්නේ ? යන්නෙහි මිම්මක් වශයෙන් නබිතුමා හඳුන්වා දෙන්නේ, ඔහු පිළිබඳව ඔවුන් කරන ප්‍රශංසාව හා නින්දාව මගිනි. අබ්දුල්ලාහ් බින් මස්ඌද් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

මිනිසෙකු නබි මුහම්මදු (සල්) තුමාගෙන් 'අල්ලාහ්ගේ දූතයාණෙනි, මම යහපත් ශීලයෙන් හැසිරෙන්නේද ? හෝ අයහපත් ශීලයෙන් හැසිරෙන්නේද ? බව මා දැනගන්නේ කෙසේද ?' යනුවෙන් විමසීය. එයට නබිතුමා 'ඔබ යහපත් ශීලයෙන් හැසිරෙන බව ඔබේ අසල් වැසියා කීම ඔබ සවන් දෙන්නේනම්, ඔබ යහපත්ශීලයෙන් හැසිරෙන්නාය. එසේම, ඔබ අයහපත් ශීලයෙන් හැසිරෙන බව ඔබේ අසල් වැසියා කීම ඔබ සවන් දෙන්නේනම්, ඔබ අයහපත් ශීලයෙන් හැසි රෙන්නාය' යනුවෙන් පැවැසීය. (ග්‍රන්ථය : අහ්මද්)

අසල් වැසියාට කරන හිරිහැරය විවිධ ආකාරයෙන් පවතී. ඒවා අතර, යාබදව පවතින නිවසේ පොදු බිත්තියෙහි අසල් වැසියා සිය වහලේ බාල්කය යනාදි දෙය යාකිරීම වැළකීම හෝ හිරු එළිය හා සුළඟ අසල්

වැසියාට නොලැබෙන සේ ඔහුගේ අනවසරයෙන් තම නිවසේ බිත්තිය උස් කිරීම හෝ ඔහුගේ නිවසට ඉදිරියෙහි ඇති තම ජනේලය විවෘත කර එමගින් ඔහුගේ නිවෙස් තුල පවතින අභ්‍යන්තර දෙය එබී බැලීම හෝ තට්ටු කිරීම් හා ඝෝෂා කිරීම් යනාදි හිරිහැර ඇතිකරන ශබ්ද මගින් විශේෂයෙන් ඔවුන් නිදාගන්නා හා විවේකයෙහි යෙදෙන වේලාවන්හි ඔහුට කරදර කිරීම හෝ ඔහුගේ දරුවන්ට පහර දීම හා ඔහුගේ දොරටුව ඉදිරියෙහි කුණු කසල විසි කිරීම යනාදීන් ඇතුලත්වේ.

අසල් වැසියන්ගේ අයිතිවාසිකම පැහැර හැරීම ඉමහත් පාපයකි. එසේ කරන්නාට එකී පාපය විවිධ ගුණයකින් වර් ධනයවේ. නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව මික් දාද් බින් අස්වද් (රලි) තුමා වාර්තා කරන්නේය.

මිනිසෙක් ස්ත්‍රීන් දස දෙනෙක් හා සමග දුරාචාරයෙහි යෙදීම, තම අසල් වැසියාගේ බිරිඳ හා සමග දුරාචාරයෙහි යෙදීමට වඩා (දඬුවමින්) සරලකි. එසේම, මිනිසෙකු නිවෙස් දහයක සොරකම් කිරීම, තම අසල් වැසියාගේ නිවසෙහි සොරකම් කිරීමට වඩාද (දඬුවමින්) සරලකි. (ග්‍රන්ථය : අහ්මද්)

සමහර දුෂ්ඨයන් තම අසල් වැසියා නිවසෙහි නොසිටින රාත්‍රිය අවස්ථාවක් වශයෙන් ප්‍රයෝජනයට ගනිමින් ඔහුගේ නිවෙස් තුලට පිවිස එහි හානි සිදු කරති. ඉමහත් වේදනා ඇති (අවසන්) දිනයෙහි මෙවන් අයට විනාශය ඇත.

# අන්තිම කැමැත්ත ප්‍රකාශ කිරීමෙහි අපරාධ කිරීම

කවරෙකුට හෝ කිසියම් අපරාධයක් නොකළ යුතුයි යන්නෙහි ඉස්ලාම් ධර්මයෙහි මූලික කරුණෙකි. ඒ අනුව පුද්ගලයෙකු අන්තිම කැමැත්ත ප්‍රකාශ කරනවිට එමගින් හිමිකරුවන්ට හෝ ඔවුන්ගෙන් සමහරුන්ට හෝ අපරාධ කිරීමද තහනම්ය. එසේ කරන්නාට නබිනායක මුහම්මදු (සල්) තුමා අවවාද කර පැවැසූ වදනක් අබූ සර්මත් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙකු (අන් අයට) අපරාධ කරන්නේද, අල්ලාහ් ඔහුට අපරාධ කරයි. එසේම, කවරෙකු (අන් අයට) අපහසුතාවය ඇති කරන්නේද, අල්ලාහ් ඔහුට අපහසුතාවය ඇති කරයි. (ග්‍රන්ථය : අහ්මද්)

මිනිසුන් විවිධ ක්‍රම අනුගමනය කර අන්තිම කැමැත්ත ප්‍රකාශ කිරීම මගින් අපරාධ කරති. එනම්, ඒවා තම සම් පත්වලින් තම හිමිකරුවෙකුට ආගමින් උරුම වූ හිමිකම යාම වැළකීම හෝ කෙනෙකුට කෙතරම් ප්‍රමාණයක් ලබා දිය යුතු බවට ආගම නියමකර ඇත්තේද, එයට පටහැනිව මරණ ශාසනය කිරීම හෝ තම සම්පත්වලින් තුනෙන් එකට වැඩි ප්‍රමාණයක් මරණ ශාසනයෙහි ලිවීම යනාදීන්ය. මෙසේ ලිවීම තහනම්ය.

ඉස්ලාමීය ෂරීඅත් පද්ධතිය යටතේ උසාවි නොපවත්වන රටවල ජීවත්වන මුස්ලිම් වරුන්ට අල්ලාහ් නියමකර ඇති (සම්පත්) උරුමය එම උසාවි මගින් ලබා ගැනීම අපහසුවේ. මන්දයත්, එම උසාවිවල විනිශ්චය කරනු ලබන්නේ, ෂරීඅත් නීතිරීතිවලට පටහැනි මිනිසුන් විසින් සම්පාදනය කරනලද නීතිරීතීන් මගිනි. එසේම, ෂරීඅත් නීතිරීතිවලට පටහැනිව නීතිඥවරුන් මාර්ගයෙන් ලියාපදිංචි කරනු ලබන අන්තිම කැමැත්ත ප්‍රකාශය අනුව ක්‍රියා කරන ලෙසට එම උසාවිද නියෝග කරන්නේය. එහෙයින්, ඔවුන්ගේ අත් ලියූ දේද, ඔවුන් උපයාගත් දේද ඔවුන්ට පරිහානිය ගෙනදේ.

# දාදුකැට (BACKGAMMON) ක්‍රීඩා කිරීම

මිනිසුන් අතර ව්‍යාප්තව පවතින බොහෝ ක්‍රීඩාවල විවිධ තහනම් කරුණු කීපයක් අන්තර්ගතව පවතී. ඒවා අතරේ දාදුකැට **(Backgammon)** ක්‍රීඩා යන හූදු කෙලීමක්ද එකකි. එසේම, සමාජය තුල මෙවන් හූදු කෙලීම් වර්ග කීපයක්ම පවතී. විවිධ හූදුවන්හි දොරටු විවෘතකර දෙන මෙම බැක් ගැමන් ක්‍රීඩාව පිළිබඳව නබිනායක මුහම්මදු (සල්) තුමා ප්‍රකාශ කළ වදනක් සුලෛමාන් බින් බුරෛදා (රලි) මෙසේ වාර්තා කරන්නේය.

කවරෙකු දාදුකැට (බැග්ගැමන්) කෙලියෙහි යෙදෙන් නේද, ඔහු ඌරාගේ මත්සයෙහි සහ රුධිරයෙහි තම අත ස්පර්ශ කළ අයෙකු සේය. (ග්‍රන්ථය : මුස්ලිම්)

නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් අබූමූසා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙකු දාදුකැට කෙලිය (බැැක්ගැමන්) යන ක්‍රීඩාවෙහි යෙදෙන්නේද, ඔහු අල්ලාහ්ට හා ඔහුගේ දූතවරයාට වෙනස් කම් කළේය. (ග්‍රන්ථය : අහ්මද්)

# ශාප කිරීම

මිනිසුන්ගෙන් වැඩි පිරිස් කෝපයට ලක්වන අවස්ථාවල තම දිව පාලනය කරගැනීමට නොහැකිව එවිගසම ශාප කරති. එම අවස්ථාවේ ඔවුන් මිනිසුන්, සිව්පාවන්, අප්‍රාණික දේ, කාලය, දින, වේලාව යනාදීන්ට ශාප කරති. එපමණක් නොව, සමහරවිට තමන්ට හා තම දරුවන්ටද ශාප කරති. එසේම සැමියා බිරිඳටද බිරිඳ සැමියාටද ශාප කරති. මෙසේ ශාප කිරීම විපාකය ගෙනදෙන පිළිකුල් කළ යුතු තහනම් කරුණකි. නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ වදනක් සෛද් බින් තාබිත් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙකු හෝ විශ්වාස වන්තයෙකුට ශාප කරන්නේද, ඔහු ඔහුව ඝාතනය කළ සේය. (ග්‍රන්ථය : බුහාරි)

අධිකව ශාප කරන්නේ ස්ත්‍රීන්මය. එය ඔවුන් නරකාදි යෙහි පිවිසීමට හේතුවන බවට නබි මුහම්මදු (සල්) තුමා වටහා දෙන්නේය. එසේම, ශාප කරන්නන් පරලොව දින නිර්දේශ කරන්නන් ලෙසට ඉදිරිපත්ව නොසිටිති. මෙලෙස කෙනෙකු පුද්ගලයෙකුට අසාධාරණයක් ලෙස ශාප කිරීමේ බරපතලකමනම්, එකී ශාපය ඔහුටම හානි කිරීමකි. එනම් එය තමා විසින්ම තමාට එරෙහිව අල්ලාහ්ගේ භාග්‍යයෙන් ඈත්වීම සඳහා ප්‍රාර්ථනා කළ සේ පවතී.

# අදෝනා බස් කීම

සමහර ස්ත්‍රීන් මළඅය වෙනුවෙන් ශෝකය පෙන්වමින් අදෝන බස් කියති. තම මුහුණෙ හා කම්මුලෙහි ගසාගෙන අඬා වැලපී සිටිති. මේවා සියල්ල ඉස්ලාම් ධර්මයෙන් තහ නම්කර ඇති ඉතා පිළිකුල් කළයුතු කාර්යයන්ය. එසේම, සමහරුන් ඇඳුම් ඉරා ගනිති. හිස බූගසා හෝ හිස කෙස් දිගහැර ඒවා කඩා ගනිති. මේවා සියල්ල අල්ලාහ්ගේ නිය මය සහ දෛවය පිළිනොගැනීම හා පීඩාවන් නොඉවසීම වටහා දෙයි. මේ පිළිබඳ නබි වදනක් අබූ උමාමා (රළි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

නිශ්චයෙන්ම, නබිනායක මුහම්මදු (සල්) තුමා (පීඩන යට ලක්වූ කළ) සිය මුහුණ තුවාල කරගන්නා ස්ත්‍රීන්ටද, සිය ඇඳුම් ඉරා ගන්නා ස්ත්‍රීන්ටද, මාහට සිදුවූ විනාශයනේ, යනාදී වචන වලින් පසුතැවිලි අඬා වැළපන ස්ත්‍රීන්ටද ශාප කළේය. (ග්‍රන්ථය : ඉබ්නු මාජා)

නබිනායක මුහමම්දු (සල්) තුමා පැවැසූ බව අබ්දුල්ලාහ් බින් මස්ඌද් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කම්මුලට ගසා ගන්නා, තමාගේ ඇඳුම් ඉරා ගන්නා හා අනුවණ වචන වලින් අඬා වැලපන්නා අප සමාජයට අයත් අය නොවන්නාය. (ග්‍රන්ථය : බුහාරි)

නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූ මාලික් අල්අෂ්අරී (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

අඳෝන බස් කියන ස්ත්‍රිය, ඇය මරණයට පත්වීමට පෙර පාපොච්චාරණය නොකළේනම්, ඇය පරලොව දිනයේ තාර වලින් යුත් ඇඳුම් හා කැසෙන කමීස අන්දවමින් නැගිට්ට වනු ලැබේ. (ග්‍රන්ථය : මුස්ලිම්)

# මුහුණට පහරදීම හා හංවඩු ගැසීම

මිනිසුන්ගේ මුහුණට පහර දීම හා සිව්පාවන්ගේ මුහුණට හංවඩු ගැසීම පිළිබඳ නබි වදනක් ජාබිර් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

නබිනායක (සල්) තුමා මුහුණට පහර දීම හා මුහුණට හංවඩු ගැසීම තහනම් කළේය. (ග්‍රන්ථය : මුස්ලිම්)

# මුහුණට පහර දීම

සමහර පියවරුන් හා ගුරුවරුන් ළමයින්ට දඬුවම් කරන කළ සිය අතින් හෝ වෙනත් දේ මගින් ඔවුන්ගේ මුහුණට පහර දෙති. එසේම සමහරු තම මෙහෙකරුවන්ටද මෙසේ පහර දෙති. මෙය අල්ලාහ් කුමන මුහුණ මගින් මිනිසාව ශ්‍රේෂ්ඨමත් කළේද, එවන් මුහුණ නින්දිත කිරීමකි. මෙසේ මුහුණට පහර දීමෙන් සමහරවිට මුහුණෙහි වටිනා අවයන් විනාශ වීමටද හේතුවේ. පසුව ඒ වෙනුවෙන් කණගාටුවට පත්වේ. (එපමණක් නොව,) එය වෙනුවෙන් ඔහු පලිගැනී මටද ලක්වනු ඇත.

# සිව්පාවන්ගේ මුහුණට හංවඩු ගැසීම

සමහරුන් සළකුණක් වශයෙන් සිව්පාවන්ගේ මුහුණෙහි හංවඩු ගසති. මෙමගින් එම සිව්පාවන්ගේ අයිති කරුවන් තම සිව්පාවන් හඳුනා ගැනීමට හෝ ඒවා අතුරුදන්වූ කල නැවත අයිතිකරුවන්හට භාර දීමට හෝ හැකිවේ. මෙසේ කිරීම තහනම්ය. මෙයින් එම ප්‍රාණීන්ගේ මුහුණ අවලක්ෂණ යටද ඒවා වදහිංසාවටද ලක් වේ. සමහරුන් මෙසේ හංවඩු ගැසීම අප ගෝත්‍රයෙහි සිරිතක් හා විශේෂ කරුණක් ලෙස තර්ක කළත්, මෙය තහනම්ය. නමුදු, මුහුණ හැර

වෙනත් තැන්වල සළකුණක් වශයෙන් හංවඩු ගැසීමෙන් ප්‍රශ්නයක් නොවන්නේය.

# දින තුනකට වඩා මුස්ලිමෙකුව අප්‍රිය කිරීම

මුස්ලිම්වරුන් අතරෙහි අසමගිය හා බෙදීම ඇති කිරීම සාතාන්ගේ ක්‍රියාවකි. සාතාන්ගේ මාර්ග අනුගමනය කරන අධික පිරිස් ඉස්ලාමය අනුමත නොකරන හේතූන් මත තම සහෝදර මුස්ලිම්වරු සමග අමනාප ඇතිකර ගනිති. ඔවුන් අතර පවතින ඥාතිකම පවාද විසන්ධිකර ගනිති. මෙලෙස අමනාප වීමට ගනුදෙනුවල ඇතිවූ සාමාන්‍ය මත මතාන්තර හෝ නොයෙකුත් සුළු ක්‍රියා කලාප හෝ හේතුවිය හැක. සමහර විට මෙම අමනාපය දීර්ඝ කාලයකට පවා පවතී.

පුද්ගලයෙක් සමහරවිට කෙනෙකු සමග කතා බහක නොයෙදෙන බව දිවුරයි. ඔහුගේ ගේ දොරට පා නොතබන බවට භාර වේ. ඔහුව මගෙහි දුටු කළ නොසළකා මුහුණ හරවා ගනී. යම් සභාවක හෝ මිනිසුන් රැස්වන තැනක ඔහුව දුටුවද, ඔහුව නොසළකා ඔහුට ඉදිරියෙහි හා පසුව සිටින්නන් සමග අතට අතදී ආචාරකර ඔහුව අභිබවා යයි. මෙය මුස්ලිම් සමාජය අසරණවීමට හේතුවකි. එනිසා මේ පිළිබඳ ඉස්ලාම්හි නීතිරීති හා අවවාද තදබල ලෙස පවතී.

නබිනායක මුහමම්දු (සල්) තුමා පැවැසූ බව අබූහුරෙරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

තම සහෝදරයා සමග දින තුනකට වඩා අමනාපයෙන් සිටීම කිසිදු මුස්ලිම් වරයෙකුට හෝ අනුමත නොවන්නේය. කවරෙකු එලෙස දින තුනකට වඩා අමනාපයෙන් සිට මිය ගියේද, ඔහු නරකාදියෙහි පිවිසේ. (ග්‍රන්ථය : අබූදාවූද්)

නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූ කර්රාස් (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

කවරෙකු හෝ තම සහෝදරයා සමග වසරක කාලයක් අමනාපයෙන් සිටියේනම්, ඔහු ඔහුව ඝාතනය කළ අයෙකු සේය. (ග්‍රන්ථය : අල්අදබුල් මුෆ්රද්)

මුස්ලිම් වරුන් අතර පවතින භ්‍රාතිත්වය විසන්ධි කිරීම, අල්ලාහ්ගෙන් පව් සමාව ලැබීමට බාධකයක් ලෙසට පවතී. නබිනායක මුහම්මදු (සල්) තුමා පැවැසූ බව අබූ හුරෙරා (රලි) තුමා මෙසේ වාර්තා කරන්නේය.

සෑම සතියකම සඳුදා හා බ්‍රහස්පතින්දා යන දෙදිනවල මිනිසුන්ගේ ක්‍රියාවන් (අල්ලාහ් ඉදිරියේ) පෙන්වනු ලැබේ. එවිට අමනාපවූ දෙදෙනෙකු හැර අන් සියළුම විශ්වාසනීය දාසයන්ටම පව් සමාව ලබා දෙනු ලැබේ. ඔවුන් දෙදෙනා සමගිවන තෙක් ඔවුන්ව අත් හරින්න හෝ කල් තබන්න යැයි (මලක්වරුන්ට) පවසනු ලැබේ. (ග්‍රන්ථය : මුස්ලිම්)

අමනාපවූ දෙන්නෙකුගෙන් කෙනෙකු වරද වටහා ගෙන අල්ලාහ්ගෙන් පාපොච්චාරණය කළේනම්, ඔහු (තමා සමග අමනාපයෙන් සිටින) තම මිත්‍රයා හමුවී ඔහුට සලාම් කිව යුතුයි. එය ඔහුගේ මිත්‍රයා ප්‍රතික්ෂේප කළේනම්, ඔහු සිය වගකීමෙන් නිදහස් වේ. ඔහු මත කිසියම් වරදක් නොවන අතර, මිත්‍රයාගේ වරද එසේම ඔහු මත පවතී.

නබිනායක මුහම්මදු (සල්) තුමාණන් ප්‍රකාශ කළ වද නක් අබූ අයියූබ් අල් අන්සාරී (රලි) තුමා මෙලෙස වාර්තා කරන්නේය.

තම සහෝදරයා සමඟ රාත්‍රී තුනකට වඩා අමනාපයෙන් සිටීම කිසියම් මුස්ලිම් වරයෙකුටද අනුමත නොවන්නේය. ඔවුන් දෙදෙනා හමුවන මොහොතක කෙනෙකු අනෙකාව නොසළකා ප්‍රතික්ෂේප කළ නොයුතුයි. ඔවුනතර කවරෙකු ප්‍රථමයෙන් සලාමය පැවැසීට ආරම්භ කරන්නේද, ශ්‍රේෂ්ඨ වන්තයා ඔහුමවේ. (ග්‍රන්ථය : බුහාරි)

නමුත්, මෙසේ අමනාපවීමට සලාතය ඉටු නොකිරීම හා පාප ක්‍රියාවන්හි හිතුවත්කාරකමින් සිටීම යනාදි ආගමානු කූල හේතූන් මත අනුමත වේ. අමනාපවී සිටීම ඔහු තම පාපයෙන් මිදීමට පලක් වන්නේනම් හෝ ඔහු තම පාපයන් ගැන හැගී නිවැරදි මගට ඒවී යනුවෙන් අපේක්ෂා කරන් නේනම්, ඔහු හා සමග අමනාපවීම අනිවාර්ය වේ.

නමුදු, අමනාපවීමෙන් ඔහු පාප ක්‍රියාවල තවතවත් යෙදී ඉක්මවා යන්නේ නම්, හෝ පාපයෙහි හිතුවත්කාර කමින් සිටින්නේ නම්, ඔහු සමග අමනාප නොවිය යුතුයි. මන්ද යත්, එමගින් ඉස්ලාමය අපේක්ෂා කරන පලක් නොලබන අතර, පාප ක්‍රියාවන් තවතවත් අධිකවීමට හේතුවේ. එනිසා, මෙවැනි අවස්ථාවන්හි ඔහු හා සමග කිසියම් අමනාපයක් හෝ ඇති නොකොට ඔහුට අඛණ්ඩව උපදෙස්, දේශනා හා උපකාර කිරීම යෝග්‍යවේ.

# සමාප්තිය

මෙතෙක් මානව සමාජයෙහි ව්‍යාප්තව පවතින වැළකී සිටිය යුතු තහනම් කරුණු කීපයක් හැකිතාක් අන්දමට මෙහි සාකච්ඡා කොට ඇත.

සර්ව බලධාරි අල්ලාහ්ගෙන් ඔහුගේ අලංකාරමත් නාම යෙන් ප්‍රාර්ථනා කරමු. අප හා අපි ඔහුට එරෙහිවීමට බාධා වක් ලෙස පවතින බියබැතිකමද, ඔහුගේ ස්වර්ගය කරා පිවිසීමට යොමු කරන වන්දනාමානයන්ද ඔහු අපහට ලබා දෙනු මැනවි. ඔහු අපගේ පාපයන්ද, අපගේ කාර්යයන්හි අපි සීමා ඉක්මවා යාමද කමා කරනු මැනවි. ඔහු වැළක්වූ දෙයින් වැළකී සිට ඔහු අනුමත කළ දෙයින් පමණක්ද, ඔහු හැර අන් කිසියම් කෙනෙකුගේ හෝ දායාදයෙන් තොරව ඔහුගේ දායාදයෙන් පමණක්ද සෑහීමට පත්කරනු මැනවි. අප පාපයන් සෝදා පිරිසිදුකර අපගේ පාපොච්චාරණය පිළි ගනු මැනවි. සැබැවින්ම,

ඔහු (අල්ලාහ්) සෑම දේ ශ්‍රවණය කරන්නා හා ඒවා කෙරෙහි පිළිතුරු දෙන්නාය.

නබිනායයක මුහම්මදු (සල්) තුමාටද, එතුමාගේ පවුල් ඥාතීන්ටද, එතුමාගේ ශ්‍රාවකරුවන්ටද හා සෑම දෙනාටද අල්ලාහ් ඔහුගේ කරුණාව හා සාමය පහළ කරනු මැනවි. ප්‍රශංසා සියල්ල විශ්වයාධිපතියාවූ අල්ලාහ්ටම හිමිවේ.

والله أعلم ، وصلى الله على نبينا محمد وآله وصحبه وسلم ، والحمد لله رب العالمين.